
# 2013 වාර්ෂික වාර්තාව
# ஆண்டறிக்கை
# ANNUAL REPORT







**National Film Corporation of Sri Lanka**
Ministry of Parliamentary Reforms & Mass Media

**ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව**
පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

**இலங்கைத் தேசியத் திரைப்படக் கூட்டுத்தாபனம்**
பாராளுமன்ற மறுசீரமைப்பு மற்றும் வெகுசன ஊடக அமைச்சு

# ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

# වාර්ෂික වාර්තාව

# 2013

# පටුන


| | පිටුව |
|---|---|
| පිළිගැන්වීම | 01 |
| පාලන වාර්තාව | 02 - 26 |
| ශේෂ පත්‍රවල ලාභාලාභ ගිණුම් ආශ්‍රිත සටහන් | 27 - 71 |
| විගණකාධිපති වාර්තාව | 72 - 87 |

# - පිළිගැන්වීම -

දිනය :- . 2014.11.03 දින. මගේ අංකය : එන්එෆ්සී/103/05/02/95

ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති ගරු අමාත්‍ය,
ආචාර්ය කෙහෙළිය රඹුක්වැල්ල මැතිතුමා,
ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය,
අංක 163,
කිරුළපන මාවත,
පොල්හේන්ගොඩ,
කොළඹ 05.

ගරු ඇමතිතුමනි,

**<u>ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව - වාර්ෂික වාර්තාව 2013</u>**

1980 අංක 45 දරන පනතින් සංශෝධිත 1971 අංක 47 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනතේ 32(1) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(1) වගන්තිය ප්‍රකාර 2013 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා පහත සඳහන් ලේඛනයන් ද සමඟ සංස්ථාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

1. 2013 වසරේ සංස්ථාව විසින් කරන ලද කාර්යයන් හා අදාල ප්‍රකාශ
2. 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා සංස්ථාවේ ලාභාලාභ ගිණුම, ආශ්‍රිත සටහන් හා එදිනට ශේෂ පත්‍රය
3. 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා විගණකාධිපති වාර්තාව
4. විගණකාධිපති විසින් ගිණුම් පිළිබඳ දක්වන අදහස්වලට සංස්ථා සභාපති විසින් සැපයූ පිළිතුරු

මෙයට,
විශ්වාසී වූ,

නීතීඥ අශෝක සේරසිංහ,
සභාපති,
ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව.

## පාලන වාර්තාව

01. හැඳින්වීම

02. අධ්‍යක්ෂ මණ්ඩලය

03. දේශීය චිත්‍රපට නිෂ්පාදනය

04. චිත්‍රපට ආනයනය

05. පිරිස් හා ආයතන පාලනය

06. චිත්‍රපට ප්‍රචාරණය / සිනෙ ඇඩ්ස්

07. චිත්‍රපට ප්‍රදර්ශනය

08. අභ්‍යන්තර විගණන කටයුතු

09. සිනමා සංස්කෘතික හා අධ්‍යාපන කටයුතු

10. දේශීය සැපයුම්, ආනයන හා අපනයන

11. චිත්‍රපට ගබඩාව

12. නෛතික කටයුතු

13. මූල්‍ය කටයුතු

14. චිත්‍රාගාරය

15. පරීක්ෂණ කටයුතු

16. සුභසාධනය

17. ක්‍රීඩා සංගමය

18. ආගමික කටයුතු

19. වෛද්‍ය සහනාධාර ක්‍රමය

20. වෘත්තීය සමිති

21. ස්තුතිය

## 01. <u>හැඳින්වීම</u>

1980 අංක 45 දරන පනතින් සංශෝධිත 1971 අංක 47 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනතේ 32(1) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(1) වගන්තිය යටතේ ගරු ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍ය ආචාර්ය කෙහෙළිය රඹුක්වැල්ල මැතිතුමා හා විගණකාධිපති වෙත ඉදිරිපත් කරනු ලබන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ 2013 වර්ෂය පිළිබඳ වාර්තාව.

2013 වර්ෂය පිළිබඳ ඉදිරිපත් කරන මෙම වාර්තාව ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ 42 වන ක්‍රියාත්මක වර්ෂයට අදාළ වේ.

## 02. <u>අධ්‍යක්ෂ මණ්ඩලය</u>

**2.1 2013 වර්ෂයේ ජාතික චිත්‍රපට සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩලය පහත නම් සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත විය.**

1. නීතිඥ අශෝක සේරසිංහ මහතා - සභාපති
2. නීතිඥ ඩී. කරුණාරත්න මහතා - ක්‍රියාකාරී අධ්‍යක්ෂ
3. මහාචාර්ය ආරියරත්න ඇතුගල - අ.ම. සාමාජික (නිල බලයෙන්) - රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ
4. නීතිඥ සමන්ත වැලිවේරිය මහතා - අ.ම. සාමාජික (නිල බලයෙන්) - අධ්‍යක්ෂ ජනරාල් ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව
5. විජිත කණුගල මහතා - අ.ම. සාමාජික (නිල බලයෙන්) - අධ්‍යක්ෂ - සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
6. මහාචාර්ය රෝලන්ඩ් අබේපාල - අ.ම. සාමාජික
7. ආචාර්ය ප්‍රණීත් අබේසුන්දර - අ.ම. සාමාජික
8. ආචාර්ය ඩී. වෙන්කටේෂ්වරන් - අ.ම. සාමාජික
9. රේණුකා බාලසූරිය මහත්මිය - අ.ම. සාමාජිකා
10. මාලනී ගමගේ මහත්මිය - භාණ්ඩාගාර නියෝජිත
11. වත්සලා වික්‍රමආරච්චි මහත්මිය - අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්/සහකාර සාමාන්‍යාධිකාරී (නීති)

භාණ්ඩාගාර නියෝජිත වශයෙන් කටයුතු කල මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් මාලනී ගමගේ මහත්මිය විශ්‍රාම යාම හේතුවෙන් 2013.11.25 වන දින සිට භාණ්ඩාගාර නියෝජිත වශයෙන් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ජේ.සී.වැලිගමගේ මහත්මිය පත් කර ඇත.

## 03. දේශීය චිත්‍රපට නිෂ්පාදනය

### 3.1 දේශීය චිත්‍රපට නිෂ්පාදනය සඳහා ලියාපදිංචි කිරීම

2013 වර්ෂය සඳහා ලියාපදිංචි කරන ලද චිත්‍රපට සංඛ්‍යාව 51 කි.

(චිත්‍රපටයක් ලියාපදිංචි කිරීම සඳහා ලියාපදිංචි කිරීමේ ගාස්තුව වශයෙන් රු. 2000/- ක මුදලක් සංස්ථාව නිෂ්පාදකගෙන් අයකර ගනු ලැබේ.)

### 3.2 දේශීය චිත්‍රපට නිෂ්පාදනය සඳහා ලබා දෙනු ලබන ණය පහසුකම්

#### 3.2.1 චිත්‍රාගාර සේවා ණය පහසුකම්

අනුමත චිත්‍රාගාර සේවා ණය පහසුකමේ වටිනාකම රු. 400,000/- කි. වසර තුල චිත්‍රාගාර සේවා ණය පහසුකම් කිසිදු චිත්‍රපට නිෂ්පාදකවරයෙකු ඉල්ලුම් කර නොමැත.

එහෙත් මීට පෙර වර්ෂයන්හිදී මෙම ණය සේවා ලබාගත් චිත්‍රපට නිෂ්පාදකවරුන් කිහිපදෙනෙකු අනුමත ණය පහසුකම් වටිනාකම ඉක්මවා කටයුතු කර තිබූ අවස්ථාවන්හිදී අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් යටතේ අමතර රු. 100,000/- ණය පහසුකම් ලබාදී ඇත.

- ඩබල් ට්‍රබල්
- ඔළුව ජපන් කඳ ජර්මන්
- ආදර පූජාසනය
- ඇද්ද ලණුව දැම්ම කොඩිය

#### 3.2.2 චිත්‍රපට නිෂ්පාදනය සඳහා ණය පහසුකම් ලබාදීම

මෙම වර්ෂය තුල චිත්‍රපට නිෂ්පාදනය සඳහා කිසිදු නිෂ්පාදන ණය පහසුකමක් ලබාදී නොමැත.

* සැ.යුතුයි

පහත සඳහන් ණය පහසුකම් ලබාදෙනු ලබන්නේ ණය ඉල්ලුම් කරනු ලබන චිත්‍රපටය දේශීය චිත්‍රපට වර්ගීකරණ කමිටුව වෙත ඉදිරිපත් කිරීමෙන් පසු ලබාදෙනු ලබන කමිටු නිර්දේශය අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරීමෙන් ලැබෙන තීරණය මතය. මෙම වසර තුල මෙම කමිටුව සඳහා කිසිදු චිත්‍රපටයක් යොමු කර නැත.

### 3.2.3 විශේෂ ණය පහසුකම් ලබාදීම

වර්ෂය තුල විශේෂ ණය පහසුකම් ලබාදී නොමැත.

### 3.2.4 පිටපත් මුද්‍රණය සඳහා ණය පහසුකම් ලබාදීම

මෙම වර්ෂය තුල චිත්‍රපට සඳහා කිසිදු පිටපත් මුද්‍රණ ණය පහසුකමක් ලබාදී නොමැත.

### 3.2.5 ප්‍රචාරක ණය පහසුකම් ලබාදීම

මෙම වර්ෂය තුල චිත්‍රපට සඳහා ප්‍රචාරක ණය පහසුකම් ලබාදී නොමැත.

### 3.2.6 උප ශීර්ෂ පාඨ යෙදීම සඳහා ණය පහසුකම් ලබාදීම

මෙම වර්ෂය තුල කිසිදු චිත්‍රපටක් සඳහා උප ශීර්ෂ පාඨ යෙදීමට ණය පහසුකම් ලබා දී නොමැත.

## 3.3 කාර්මික ශිල්පීන් ලියාපදිංචි කිරීම සහ නව හැඳුනුම්පත් නිකුත් කිරීම

මෙම වර්ෂය තුල කිසිදු කාර්මික ශිල්පියකු ලියාපදිංචි කර නොමැති අතර, නව හැඳුනුම්පත් නිකුත් කිරීමක් හෝ නිකුත් කරන ලද හැඳුනුම්පත් වෙනුවෙන් නැවත නිකුත් කිරීම් හෝ සිදුකර නොමැත.

## 3.4 දේශීය චිත්‍රපට නිෂ්පාදනය සඳහා විදේශීය නළු-නිළි කාර්මික ශිල්පීන් යොදවා ගැනීම වෙනුවෙන් අනුමත ගාස්තු අය කිරීම

මෙම වසර තුල දේශීය චිත්‍රපට වෙනුවෙන් යොදා ගන්නා ලද විදේශීය නළු-නිළි, කාර්මික ශිල්පීන් වෙනුවෙන් අය කිරීමක් සිදු කර නොමැත.

## 3.5 දේශීය වෘතාන්ත/වෙළඳ/වාර්තා වැඩ සටහන් රූගත කිරීම සඳහා කැමරා උපකරණ ලබාගැනීම අනුමත කිරීම වෙනුවෙන් කරනු ලබන අය කිරීම්

වෘතාන්ත චිත්‍රපට 02 ක් සහ විදේශීය වෙළඳ වැඩ සටහන් 01 ක් වෙනුවෙන් අදාල කටයුතු කර ඇත.

### 3.6 දේශීය / විදේශීය සිනමා උළෙල පැවැත්වීම

- සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානය විසින් සාර්ක් චිත්‍රපට උළෙල 2013.05.25 සිට 2013.05.31 දක්වා පවත්වන ලදි.

- වියට්නාම් තානාපති කාර්යාලය විසින් 2013.10.19 සිට 2013.10.21 දක්වා ශ්‍රී ලංකා වියට්නාම් චිත්‍රපට උළෙල පවත්වන ලදි.

- යුරෝපීය සංගමය විසින් පවත්වනු ලබන යුරෝපා රටවල සිනමා උළෙල සංස්ථා සිනමාශාලාවේදී 2013.11.28 සිට 2013.12.06 දක්වා පවත්වන ලදි.

- විදේශ කටයුතු අමාත්‍යාංශය සංවිධානය කළ පොදු රාජ්‍ය මණ්ඩලීය චිත්‍රපට උළෙල 2013.11.05 සිට 2013.11.12 දක්වා පවත්වන ලදි.

- පෝලන්ත චිත්‍රපට උළෙල 2014.10.25 සිට 2014.10.27 දක්වා පවත්වන ලදි.

### 3.7 ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදල

ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදලේ පාලක මණ්ඩල සාමාජිකයන් පහත සඳහන් වේ.

| | | |
|---|---|---|
| නීතිඥ අශෝක සේරසිංහ මහතා | - | සභාපති |
| නීතිඥ ඩී. කරුණාරත්න මහතා | - | ක්‍රියාකාර අධ්‍යක්ෂ |
| මහාචාර්ය ආරියරත්න ඇතුගල | - | පාලක මණ්ඩල සාමාජික |
| මහාචාර්ය රෝලන්ඩ් අබේපාල | - | එම |
| ආචාර්ය ප්‍රණීත් අබේසුන්දර | - | එම |
| නීතිඥ සමන්ත වැලිවේරිය මහතා | - | එම |
| විජිත කණුගල මහතා | - | එම |
| රේණුකා බාලසූරිය මහත්මිය | - | එම |
| ආචාර්ය ඩී. වෙන්කටේෂ්වරන් | - | එම |
| කේ.එම්.රිස්වි මහතා | - | භාණ්ඩාගාර නියෝජිත/<br>පාලක මණ්ඩල සාමාජික |
| පී.ජී.පී.රසාංජලී මෙනවිය | - | පාලක මණ්ඩල සාමාජික |

## 3.8 විදේශ වෘතාන්ත / වාර්තා / වෙළඳ වැඩ සටහන් රූගත කිරීම සඳහා අවසර ලබාදීම

- වෘතාන්ත චිත්‍රපට 03 ක් වාර්තා චිත්‍රපට 42 ක් සහ වෙළඳ වැඩ සටහන් 05 ක් වෙනුවෙන් අනුමත ගාස්තුව අයකර ගෙන ඇත.

## 3.9 චිත්‍රපට කලාකරුවන් සහ කාර්මිකයන් සඳහා වූ සංස්ථා භාරය

සංස්ථා භාරයේ නව භාරකාර මණ්ඩලය පහත සඳහන් වේ.

| | | |
|---|---|---|
| නීතිඥ අශෝක සේරසිංහ මහතා | - | සභාපති |
| නීතිඥ ඩී. කරුණාරත්න මහතා | - | ක්‍රියාකාර අධ්‍යක්ෂ |
| වී. වාමදේවන් මහතා | - | භාරකාර මණ්ඩල සාමාජික |
| රේණුකා බාලසූරිය මහත්මිය | - | එම |
| සුදන්ත තිලකසිරි මහතා | - | එම |
| අර්ජුන කමලනාත් මහතා | - | එම |
| රොජර් සෙනෙවිරත්න මහතා | - | එම |
| සනත් ගුණතිලක මහතා | - | එම |
| ලාල් වීරසිංහ මහතා | - | එම |
| ආචාර්ය ප්‍රණීත් අබේසුන්දර | - | විකල්ප සාමාජික |

### 3.9.1 විශ්‍රාම වැටුප් ගෙවීම

විශ්‍රාම වැටුප් ගෙවීම: එක් අයෙකුට රු:2,000/- බැගින්

- ජනවාරි - ජුලි (විශ්‍රාමිකයන් 52 ක් වෙනුවෙන්) රු: 728,000.00
- අගෝස්තු - නොවැම්බර් (විශ්‍රාමිකයන් 51 වෙනුවෙන්) රු: 408,000.00
- දෙසැම්බර් (විශ්‍රාමිකයන් 48 වෙනුවෙන්) රු. 96,000.00

### 3.9.2 2013 වසර තුල මිය ගිය විශ්‍රාමලාභීන්

- ඩී. සයිමන් ප්‍රනාන්දු මහතා
- ලැටීෂියා පීරිස් මහත්මිය
- තිලක් කරුණාතිලක මහතා

3.9.3 මෙම වර්ෂය තුල නව විශ්‍රාමලාභීන් දහදෙනෙකු සඳහා චිත්‍රපට කලාකරුවන් සහ කාර්මිකයින් සඳහා වූ සංස්ථා භාරයේ විශ්‍රාම වැටුප් ලබාදී ඇත.

3.9.4 **<u>මරණාධාර මුදල් ලබාදීම</u>**

පහත නම් සඳහන් විශ්‍රාමලාභීන් මිය ගිය පසු, ඔවුන්ගේ නීත්‍යානුකුල භාරකරුවන් වෙත "මරණාධාර දීමනා" ගෙවා ඇත.

- කේ.ජයසෝම ඩයස් අබේසිංහ මහතා
- ඩී. සයිමන් ප්‍රනාන්දු මහතා

## 04. විත්‍රපට ආනයනය

2013 වර්ෂය සඳහා විත්‍රපට ආනයනය වෙනුවෙන් සැපයුම්කරුවන් ලෙස ලියාපදිංචිවූ ආනයනකරුවන්ගේ සංඛ්‍යාව 32 කි.

ඒ අනුව 2013 වර්ෂය තුල විත්‍රපට ආනයනය කිරිම වෙනුවෙන් ප්‍රදර්ශණ මණ්ඩල 05 හරහා අනුමැතිය ලබාදුන් විත්‍රපට සංඛ්‍යාව පහතින් දැක්වේ.

- දෙමළ විත්‍රපට - 53
- හින්දි විත්‍රපට - 21
- ඉංග්‍රීසි විත්‍රපට - 41

## 05. පිරිස් හා ආයතන පාලනය

### 5.1 කාර්ය මණ්ඩලය

| | | |
|---|---|---|
| 2013.01.01 දිනට සේවක සංඛ්‍යාව | | - 148 |
| 2013 වර්ෂය තුළ බඳවාගත් සංඛ්‍යාව | | - 03 |
| | | 151 |
| **2013 වර්ෂය තුළ ඉවත් වූ සංඛ්‍යාව** | | |
| විශ්‍රාම ලැබූ සංඛ්‍යාව | - 07 | |
| සේවයෙන් ඉල්ලා අස්වූ සංඛ්‍යාව | - 01 | |
| තනතුරින් නිදහස් කිරීම් | - 02 | |
| සේවයෙන් පහකිරීම් | - 02 | |
| මියයාම් | - 01 | |
| ඉවත් වූ මුළු සේවක සංඛ්‍යාව | | - 13 |
| ස්ථිර කාර්ය මණ්ඩලය | | 138 |
| වෙනත් - | | |
| කොන්ත්‍රාත් | | - 04 |
| දෛනික දීමනා | | - 01 |
| වැඩ බැලීම් | | - 02 |
| 2013.12.31 දිනට මුළු සේවක සංඛ්‍යාව | | - 145 |
| | | === |

## 5.2 ආයතන පාලනය හා සේවක අවශ්‍යතා ඉටු කිරීම

ආයතනයේ සේවක පාලනයට අදාලව අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ග ඉදිරියට ගෙන යමින් සේවා කටයුතු ඉටු කර ඇත.

# 06. චිත්‍රපට ප්‍රචාරණය / සිනෙ ඇඩ්ස්

## 6.1 වසර තුල ඉටුකල කාර්යභාරය

### චිත්‍රපට ප්‍රචාරක කටයුතු

- වස්සානයේ සිහිනය චිත්‍රපටය
- අභිනික්මන චිත්‍රපටය
- ඉගිලෙන්න ඇයි දඟලන්නේ චිත්‍රපටය
- රජ හොරු චිත්‍රපටය

මාධ්‍යවේදීන් සහ රැගුම් පාලක මණ්ඩල සාමාජිකයන් සඳහා 2013 වසරට චිත්‍රපට නැරඹීමේ අවසරපත් ලබාදීම.

### මාධ්‍ය සාකච්ඡා සහ මාධ්‍ය හමු සංවිධානය කිරීම.

- දේශීය සිනමාවේ 66 වන සැමරුම හා චිත්‍රපට සංස්ථාවට 41 සපිරීම වෙනුවෙන් පවත්වන ලද උත්සවයේ මාධ්‍ය හමුව හා උත්සවයේ ප්‍රචාරක කටයුතු සිදු කිරීම.

- ''දැයට කිරුළ'' අධ්‍යාපනික සංවර්ධන ප්‍රදර්ශනයේ සංස්ථා ප්‍රදර්ශන කුටියේ ප්‍රචාරක කටයුතු ඉටු කිරීම.

- ප්‍රංශයේ **''වෙසුල් ''** ජාත්‍යන්තර චිත්‍රපට උළෙලේදී සම්මානයට පාත්‍රවූ '' **ඔබ නැතිව ඔබත් එක්ක''** චිත්‍රපටයේ අධ්‍යක්ෂ - ප්‍රසන්න විතානගේ මහතා වෙනුවෙන් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ සංවිධානය කර තිබූ පිළිගැනීමේ උත්සවයේ මාධ්‍ය කටයුතු ඉටු කිරීම.

- නිව්යෝක් සිටි ජාත්‍යන්තර චිත්‍රපට උළලේ හොඳම නළුවාට හිමි සම්මානය හිමි කරගත් ජගත් චමිල රංගන ශිල්පියා ඇතුළු කණ්ඩායම දිවයිනට පැමිණීම වෙනුවෙන් බණ්ඩාරනායක ගුවන් තොටුපලේ සංවිධානය කර තිබූ පිළිගැනීමේ උත්සවයේ මාධ්‍ය කටයුතු ඉටු කිරීම.

- '' ඉගිලෙන්න ඇයි දඟලන්නේ '' චිත්‍රපටයේ මාධ්‍ය හමුවේ කටයුතු සංවිධානය කිරීම.

- සිනමා සංස්කෘතික අංශය මගින් පවත්වන සිනමාකරණ ඩිප්ලෝමා පාඨමාලාව පිළිබඳ ප්‍රචාරක කටයුතු ඉටු කිරීම.

- සංස්ථා සිනමා ශාලාවේ පවත්වන ලද වියට්නාම් චිත්‍රපට උළලේ ප්‍රචාරක කටයුතු සිදු කිරීම.

- දිල්ලි චිත්‍රපට උළලේ සමාරම්භක ප්‍රදර්ශනයට නිර්දේශිත **''ශ්‍රී සිද්ධාර්ථ ගෞතම''** චිත්‍රපටය පිළිබඳ මාධ්‍ය හමුව සංවිධානය කිරීම.

- ප්‍රවීන චිත්‍රපට අධ්‍යක්ෂක වසන්ත ඔබේසේකර මහතා වෙනුවෙන් පැවති **''වසත් සිරිත වසන්ත ඔබේසේකර''** අභිනන්දන උත්සවයේ මාධ්‍ය හමුව සහ උත්සවයේ ප්‍රචාරක කටයුතු කිරීම.

## 07. චිත්‍රපට ප්‍රදර්ශණය

### 7.1 චිත්‍රපට ප්‍රදර්ශණය

- 2013 වර්ෂය තුලදී රත්මා මණ්ඩලය යටතේ සිනමාශාලා 60 ක් ක්‍රියාත්මක විය.

- අළුතින් ඉදි කරන ලද වැලිමඩ නිව් ඉන්ද්‍රා සිනමා ශාලාව රත්මා මණ්ඩලය යටතේ 2013 වසරේදී චිත්‍රපට ප්‍රදර්ශණ කටයුතු ආරම්භ කරන ලදි.

### 7.2 චිත්‍රපට මුදාහැරීම

- සිනමාශාලා 60 ක් සඳහා රත්මා මණ්ඩලය විසින් චිත්‍රපට මුදාහැර ඇත.

- 2013 වර්ෂය තුල රත්මා මණ්ඩලය හා අනෙකුත් මණ්ඩල සමඟ ඒකාබද්ධව චිත්‍රපට මුදාහැරීමට කටයුතු කර ඇත.

- රත්මා මණ්ඩලය මගින් සිංහල චිත්‍රපට 03 ක් මුදාහැරීමට කටයුතු කර ඇත.

- 2013 වර්ෂයේ ජනවාරි සිට සැපයුම්කරුවන් විසින් ආනයනය කරන ලද දෙමළ චිත්‍රපට 11 ක් රත්මා මණ්ඩලයේ හා අනෙකුත් මණ්ඩල සිනමා ශාලාවන් සමඟ ඒකාබද්ධව මුදාහැරීමට කටයුතු කර ඇත.

  (සංස්ථා මණ්ඩලය වෙත ලබාදී ඇති කොටසින් (Quota) හා අනෙකුත් මණ්ඩල කොටස්වලින් (Quota) චිත්‍රපට ලබාගෙන රත්මා මණ්ඩලය විසින් මුදාහැරීමට කටයුතු කර ඇත.)

## 7.3 චිත්‍රපට කුලිය

- රත්මා මණ්ඩලය විසින් අනෙකුත් මණ්ඩලවලට සපයන ලද චිත්‍රපට සඳහා පහත සඳහන් පරිදි චිත්‍රපට කුලී මුදල් ලැබී ඇත. (2013 සැප්තැම්බර් මස දක්වා)

| | | |
|---|---|---|
| LFD | රු. | 4,440,326.73 |
| MPI | රු. | 1,097,541.82 |
| CEL | රු. | 7,820,682.06 |
| EAP | රු. | 373,859.31 |

- රත්මා මණ්ඩලය අනෙකුත් මණ්ඩලවලින් ලබාගත් චිත්‍රපට සඳහා පහත සඳහන් පරිදි මුදල් ගෙවා ඇත. (2013 සැප්තැම්බර් මස දක්වා)

| | | |
|---|---|---|
| LFD | රු. | 2,593,695.79 |
| MPI | රු. | 8,349,229.01 |
| CEL | රු. | 17,734,549.35 |
| EAP | රු. | 31,999,838.51 |

2013 වර්ෂයේ ජනවාරි සිට සැප්තැම්බර් මස දක්වා ලද කොමිස් මුදල රු. 17,345,268.84 කි.

- 2013 වර්ෂය තුල විවිධ සමිති සමාගම් හා විශ්ව විද්‍යාල හා පාසැල් සිසුන් සඳහා සහන මිලක් යටතේ ආධාර ලබා ගැනීම සඳහා චිත්‍රපට ලබාදීම.

- පොලිස් අභ්‍යාස විද්‍යාල සඳහා හා හමුදා කඳවුරු සඳහා සහන මිලකට චිත්‍රපට ලබාදීම.

## 08. අභ්‍යන්තර විගණන කටයුතු

අභ්‍යන්තර විගණන කටයුතු 1971 අංක 38 දරන මුදල් පනතේ විධි විධාන වලට අනුකූලව හා විගණකාධිපතිගේ අවධානයට යටත්ව සිදු කර ඇත.

## 09. සිනමා සංස්කෘතික හා අධ්‍යාපන කටයුතු

### 9.1 සිනමාකරණ ඩිප්ලෝමා පාඨමාලාව

- සිනමාකරණ ඩිප්ලෝමා පාඨමාලාව - 2012 අවසන් අදියර පරීක්ෂණ කටයුතු සහ ඇගයීම් කටයුතු සිදුකර අවසන් කර ප්‍රතිඵල නිකුත් කිරීම.

- සිනමාකරණ ඩිප්ලෝමා පාඨමාලාව 2014 ආරම්භ කිරීම සඳහා අවශ්‍ය මූලික කටයුතු සිදු කිරීම.

9.2 සිනමා රසවින්දන වැඩ සටහන් ( '' ජීවිතයට සිනමාව'' යන්න තේමා කර ගනිමින් සිනමා රස වින්දන වැඩ සටහන් 05 ක් 2013 වසර සඳහා පවත්වා ඇත.)

- වරකපොළ කාර්මික විද්‍යාලය
- මීරිගම බණ්ඩාරනායක විද්‍යාලය
- වයඹ විශ්වවිද්‍යාලය
- ඩඩ්ලි සේනානායක මධ්‍ය මහා විද්‍යාලය
- අපරාධ වාර්තා කොට්ඨාශය - ටොරින්ටන්

### 9.3 චිත්‍රපට ප්‍රදර්ශණය

| | ප්‍රදර්ශණ ප්‍රමාණය |
|---|---|
| • බන්ධනාගාර රැඳවියන් පුනරුත්ථාපනය කිරීමේ වැඩ සටහන් යටතේ චිත්‍රපට ප්‍රදර්ශණය කිරීම. | 01 |
| • එරබදු වසන්ත උද්‍යානය 2013 | 01 |
| • ලුම්බිණි විද්‍යාලය - කොළඹ | 01 |
| • ජයන්ති ළදරු නිවාසය - කොළඹ 07 | 01 |
| • ලුණුගම සිරිපැරකුම්බා රජ මහා විහාරය | 02 |
| • අපරාධ වාර්තා කොට්ඨාශය - කොළඹ 07 | 01 |
| • සිරිධම්ම විද්‍යාලය ලබුදූව - ගාල්ල | 02 |
| • ශ්‍රී ධර්මාලෝක විද්‍යාලය - කැළණිය | 02 |
| • සෝමවීර චන්ද්‍රසිරි විද්‍යාලය - පිළියන්දල | 01 |
| මුළු චිත්‍රපට ප්‍රදර්ශණ ගණන | 12 |

## 9.4 චිත්‍රපට සහරාව

- සැප්තැම්බර් - දෙසැම්බර් චතුර් මාසික කලාපය ලිපි 10 කින් යුතු ශාස්ත්‍රීය කලාපයක් වශයෙන් එළි දක්වන ලදි. පිටපත් 1000 ක් මුද්‍රණය කර ඇත.

## 9.5 කෙටි චිත්‍රපට උළෙල

- වැඩමුළු 02 ක් පවත්වා තරඟ වට 02 කින් පසු කෙටි චිත්‍රපට තරඟ අංශයෙන් ජයග්‍රාහකයින් තිදෙනෙක් සහ කුසලතා සම්මාන 01 ක් ද , වාර්තා චිත්‍රපට අංශයෙන් ජයග්‍රාහකයින් එක් අයෙක් වශයෙන් ද තෝරා ගන්නා ලදි. ජයග්‍රාහකයින් සඳහා ත්‍යාග සහ සහතිකපත් ප්‍රදානය ඉදිරියේදී සිදු කිරීමට නියමිතය.

## 9.6 ප්‍රකාශණ

- සිංහල සිනමාවේ 66 වන හා ජාතික චිත්‍රපට සංස්ථාවේ 41 වන සංවත්සරය නිමිත්තෙන් ආචාර්ය උදිත ගයාෂාන් ගුණසේකර විසින් සංස්කරණය කරන ලද '' **අසිරිමත් සිනමාවේදියා ලෙස්ටර්** '' ග්‍රන්ථය සංස්ථා ප්‍රකාශනයක් ලෙස එළි දක්වන ලදි.

## 9.7 වෙනත්

- අම්පාර හාඩි තාක්ෂණ විද්‍යාලයේ පැවති දැයට කිරුළ සංවර්ධන ප්‍රදර්ශණය 2013 විවිධ අංග රැසකින් යුක්තව සාර්ථකව පවත්වන ලදි.

# 10. දේශීය සැපයුම්, ආනයන හා අපනයන

1. සිනමාශාලා හා සංස්ථා කාර්ය මණ්ඩලයේ අවශ්‍යතාවයන්ට සරිලන පරිදි කාර්මික උපකරණ, ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීය උපකරණ සැපයීම.

2. සංස්ථාවට අවශ්‍ය වත්කම් භාණ්ඩ මිලට ගැනීම, සේවා සැපයීමට හා නඩත්තු කටයුතු කිරීමට අදාලව අවශ්‍ය කටයුතු සිදු කිරීම.

3. රු. 368,900/- ක මුදලකට සැපයුම්, ප්‍රවේශපත් , ප්‍රචාරක හා සිනමා සංස්කෘතික අංශ සඳහා පරිගණක 05 ක් මිලට ගැනීම.

4. 2013/2014 වර්ෂ සඳහා සනීපාරක්ෂක හා ආරක්ෂක සේවා සැපයුම්කරුවන් නියමිත පරිපාටියට යටත්ව තෝරා ගැනීම.

# 11. චිත්‍රපට ගබඩාව

## 11.1 කාර්යභාරය

- චිත්‍රපට සංස්ථාවේ අවසරය මත ආනයනය කරනු ලබන විදේශීය චිත්‍රපට හා දේශීයව නිෂ්පාදනය කරනු ලබන චිත්‍රපට භාරගෙන ලියාපදිංචි කිරීමට කටයුතු කිරීම.

- එම චිත්‍රපටවල තත්ත්වය පරීක්ෂා කර, රැඟුම් පාලක මණ්ඩලයට ඉදිරිපත් කිරීම , තත්ත්ව වාර්තා ලබා ගැනීම තුලින් සංස්ථාවට ආදායමක් ලැබීමට සැලැස්වීම, රැඟුම් පාලක මණ්ඩලයේ අනුමැතිය පරිදි නැවත තත්ත්ව වාර්තා ලබාගෙන ආනයනකරු/නිෂ්පාදක/බෙදාහැරීමේ මණ්ඩලය වෙත භාරදීම හෝ සිනමාශාලා වෙත බෙදාහැරීම.

  තත්ත්ව පරීක්ෂා කිරීමෙන් උපයා ඇති මුදල රු.ලක්ෂ 21 ක් පමණවේ.

- සංස්ථා මණ්ඩලය මගින් අනුපෙළ ගන්වනු ලබන චිත්‍රපට හා පූර්ව ප්‍රචාරකපට නියමිත සිනමාශාලා වෙත යැවීම හා නැවත නිසි පරිදි ගෙන්වා ගැනීමට කටයුතු කිරීම.

- චිත්‍රපට ගබඩාව වෙත ලැබෙන සියළුම චිත්‍රපට නැවත පරීක්ෂා කොට ආරක්ෂිතව රාක්ක ගත කිරීම.

- රාක්ක ගතකර ඇති චිත්‍රපට විටින් විට පරීක්ෂාවට ලක් කිරීම.

- චිත්‍රපට ගබඩාවේ ඇති පැරණි චිත්‍රපට ප්‍රතිසංස්කරණ කර නැවත ප්‍රදර්ශණයට සුදුසු ආකාරයෙන් සකස් කිරීම හා සංස්ථාව වෙත ආදායමක් උපයාදීම.

- පැරණි චිත්‍රපටවලින් ධාවනයට සුදුසු චිත්‍රපට පිටපත් 03ක් පමණක් ගබඩාවේ රඳවා ඉතිරි වන සියළු චිත්‍රපට අයිතිකරුවන් වෙත භාරදීම මගින් චිත්‍රපට ගබඩාවේ නඩත්තු කටයුතු ක්‍රමවත්ව සිදු කිරීම.

- චිත්‍රපට ගබඩාවේ ගොඩගසා ඇති ගිවිසුම් කාලය අවසන් වූ චිත්‍රපට හා අබලන් චිත්‍රපට අයිතිකරුවන් වෙත දන්වා යැවීමෙන් පසු පිළිස්සීමට කටයුතුකොට එහිදී ඉතිරි වන රිදී කොටස් අලෙවි කර සංස්ථාව වෙත ආදායමක් ලබා ගැනීම.

- වර්ෂය තුල සිංහල, දෙමළ, ඉංග්‍රීසි සහ හින්දි චිත්‍රපට 132 ක් ලියාපදිංචි කර ඇත.

# 12. නෛතික කටයුතු

## 12.1 කාර්යභාරය

- සංස්ථාව පාර්ශවයන් වන නඩු සම්බන්ධයෙන් සංස්ථාව වෙනුවෙන් පෙරකලාසි ගොනුකිරීම හා අධිකරණයේ පෙනී සිටීම.

- කම්කරු දෙපාර්තමේන්තුව ඉදිරියේ කම්කරු ආරවුල් සඳහා සංස්ථාව වෙනුවෙන් පෙනී සිටීම.

- සංස්ථාව වෙනුවෙන් මානව හිමිකම් කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටීම.

- ජාතික චිත්‍රපට සංස්ථාව විසින් නිෂ්පාදනය කරනු ලබන චිත්‍රපට, ආනයනය කරනු ලබන චිත්‍රපට , චිත්‍රපට බෙදාහැරීම සම්බන්ධයෙන් සහ චිත්‍රපට නිෂ්පාදනය,චිත්‍රාගාර සේවා, පිටපත් මුද්‍රණය, උප ශීර්ෂ පාඨ යෙදීම, ප්‍රචාරක කටයුතු සඳහා ණය මුදල් ලබාදීම සහ සේවා සැපයීමේ සියළුම නීත්‍යානුකූල ගිවිසුම් සකස් කිරීම සහ අත්සන් තැබීම.

- ජාතික චිත්‍රපට සංස්ථාවට උපකාරක සේවා ලබා ගැනීම, භාණ්ඩ මිලදී ගැනීම, ගොඩනැගිලි ඉදිකිරීම් සහ වෙනත් කටයුතු සම්බන්ධයෙන් සියළුම නීත්‍යානුකූල ගිවිසුම් සකස් කිරීම සහ අත්සන් තැබීම.

- ජාතික චිත්‍රපට සංස්ථා පනත සංශෝධනය කිරීමේ කටයුතු සම්බන්ධයෙන් පියවර ගැනීම.

- සංස්ථාවේ අභ්‍යන්තර විනය පරීක්ෂණ කටයුතු සිදු කිරීම.

- එදිනෙදා අවශ්‍යතාවය පරිදි සංස්ථාවේ ඕනෑම අංශයකින් යොමු කරන නීතිමය ගැටළු සඳහා උපදෙස් ලබාදීම.

## 12.2 වර්ෂය තුල ක්‍රියාත්මක වෙමින් පැවති නඩු පිළිබඳ විස්තර

- අභියාචනාධිකරණ නඩු අංක : 590/2007
- කොළඹ දිසා අධිකරණ නඩු අංක : DMR 1897/11
- අභියාචනාධිකරණ නඩු අංක 870/99
- කොළඹ දිසා අධිකරණ නඩු අංක : DSP 18/2012
- කොළඹ මහේස්ත්‍රාත් අධිකරණ නඩු අංක : 97659/5/11
- ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක : SC(FR) 475/2012
- දිසා අධිකරණ නඩු අංක : DMR 1126/2012 - සිනෙසිටි සිනමාහල් 04න් සංස්ථාවට ගෙවිය යුතු සංස්ථා භාරය නොගෙවීම සම්බන්ධයෙන් සංස්ථාව විසින් මෙම නඩුව පවරා ඇත.

- දිසා අධිකරණ නඩු අංක : DMR 2576/2012 – ''උඩුගංයාමය'' චිත්‍රපටය නිෂ්පාදනය සඳහා සංස්ථාවෙන් ලබාගත් ණය මුදල නොගෙවීම සම්බන්ධයෙන් චිත්‍රපට නිෂ්පාදකට එරෙහිව සංස්ථාව විසින් මෙම නඩුව පවරා ඇත.

- කොළඹ වාණිජ මහාධිකරණ නඩු අංක : එච්සී සිවිල් 42/2012/අයිපී - ''මවුස් '' නැමැති සිංහල චිත්‍රපටය වෙනුවෙන් ආයෝජනය කරන ලද එ.ජ.ඩොලර් 135,000/- ක මුදලක් අයකර ගැනීම සම්බන්ධයෙන් ඊශ්‍රායෙල් ජාතිකයින් තිදෙනෙකු විසින් සංස්ථාව පාර්ශවයක් කර පවරා ඇති නඩුව.

- කොළඹ දිසා අධිකරණ නඩු අංක : DSP/00026/2013, DSP/00027/2013, DSP/00028 /2013, DSP/00029/2013, DSP/00030/2013 - බෙදාහැරමේ ක්‍රියා පිලිවෙත සම්බන්ධයෙන් සංස්ථා සභාපති විසින් නිකුත් කරන ලද 2012.12.31 දින හා අංක : NFC/100/01/04 දරන ලිපිය මගින් කර ඇති නියෝගයේ (චිත්‍රපට පිටපත් සංඛ්‍යාව 35 කට සීමා කිරීම.) සඳහන් කරුණු ක්‍රියාත්මක කිරීම වළක්වමින් ආචාර්ය සෝමරත්න දිසානායක ඇතුළු පැමිණිලිකරුවන් පස් දෙනෙකු විසින් වාරණ නියෝගයක් ලබා ගැනීම.

- අභියාචනාධිකරණ පෙත්සම් අංක : CA(Writ) Application No-144/2013 - මුදාහැරීමට අනුමත චිත්‍රපට පිටපත් සංඛ්‍යාව 35 ක් වූ සීමාව ඉක්මවා චිත්‍රපට පිටපත් මුදාහැරීම සඳහා අනුමැතිය ලබා දීමට විරුද්ධව සී/ස ලාංකීය සිනමා ශිල්පීන්ගේ සංධානය සහ චිත්‍රපට අධ්‍යක්ෂවරුන්ගේ සංසදය විසින් මෙම පෙත්සම ගොනු කර ඇත.

- කම්කරු විනිශ්චය සභා නඩු අංක : 13-14-2013

  තම සේවය අසාධාරණ හා අයුක්ති සහගත ලෙස අවසන් කරන ලද බැවින් නැවත සේවයේ පිහිටුවන ලෙස ඉල්ලා ප්‍රදීප් ලංකා ධර්මවික්‍රම මහතා විසින් මෙම නඩුව පවරා ඇත.

- දිසා අධිකරණ නඩු අංක : 2146/13 DMR

  අරුමෝසම් වැහි චිත්‍රපටය සඳහා සංස්ථාවෙන් ලබාදී ඇති ණය මුදල් සහ එයට අදාල නෛතික පොලිය අයකර ගැනීම සඳහා සංස්ථාව විසින් චිත්‍රපටයේ නිෂ්පාදකට විරුද්ධව පවරන ලද නඩුව.

**කම්කරු දෙපාර්තමේන්තුවේ පැවති පරීක්ෂණ :**

- සංස්ථා සේවක - ඩබ්.එස්. ෆොන්සේකා මහතා
- කම්කරු කාර්යාල පැමිණිලි අංකය - IR/15/19/2012 - චිත්‍රපට සංස්ථා සේවක සංගමය - සමිත දිසානායක මහතා
- කම්කරු කාර්යාල පැමිණිලි අංකය - IR/15/20/2012 - කේ.ජී.ඩී. බන්දුසේන මහතා
- කම්කරු කාර්යාල පැමිණිලි අංකය - CCC/කා.ආ/719/2012 - ටී.එස්. ප්‍රසන්ත පීරිස් මහතා

- කම්කරු කාර්යාල පැමිණිලි අංක - 490/2013 එච්.පී.සුනේත්‍රා මෙනවිය(කොන්ත්‍රාත් පදනම යටතේ සංස්ථාවේ හිටපු සේවිකාවක්) කැඳවූ පළමු දිනයේදීම මෙම පැමිණිල්ල නිශ්ප්‍රභා කරන ලදි.

## 13. <u>මූල්‍ය කටයුතු</u>

**13.1** 2012 වසර සමඟ සංසන්දනය කරන විට සංස්ථාවේ මූල්‍ය තත්ත්වය පහත සඳහන් වේ.

| | **2013** | **2012** |
|---|---|---|
| | රු. | රු. |
| ප්‍රදර්ශණයෙන් ලත් ආදායම | 35,278,807.00 | 37,648,738.00 |
| සිනමා කාබන් විකිණීම | 1,764,268.00 | 2,434,082.00 |
| ලිපි ද්‍රව්‍ය | 1 ,606,207.00 | 1,555,394.00 |
| අමතර කොටස් විකිණීම | 356,118.00 | 132,717.00 |
| සිනේ ඇඩ්ස් | 300 ,308.00 | 809,832.00 |
| චිත්‍රාගාරය | 2,269,993.00 | 3,851,249.00 |
| ශුද්ධ ලාභය | 11,622,173.00 | 17,820,214.00 |

**13.2** 2013 වර්ෂයේ විකුණුම් ආදායම රුපියල් මිලියන 41.5 කි. එය 2012 වර්ෂයේ රුපියල් මිලියන 46.4 ක් වූ අතර, 2013 වර්ෂයේ ලබා ඇති ආදායම 2012 වර්ෂයට වඩා රුපියල් මිලියන 4.9 කින් අඩුවී ඇත. එයට ප්‍රධානතම හේතුව වී ඇත්තේ චිත්‍රපට ප්‍රදර්ශනයෙන් ලත් ආදායම සහ චිත්‍රාගාරයේ ආදායම අඩුවීමයි.

එමෙන්ම මෙම වර්ෂයේ සමස්ථ වියදම පසුගිය වර්ෂයට වඩා රුපියල් මිලියන 5.1 කින් වැඩිවී ඇත. එයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ සැපයුම් හා උපකරණ, අළුත්වැඩියා කිරීම් හා නඩත්තු, ක්ෂයවීම්, ප්‍රවාහන සම්බන්ධතා හා අවශ්‍යතා වියදම් වැඩිවීම වේ.

වර්ෂය තුල භාණ්ඩාගාරයෙන් පුනරාවර්තන වියදම සඳහා ලැබුණු මුදල රුපියල් මිලියන 69.9 ක්වේ. වර්ෂයේ ශුද්ධ ලාභය රුපියල් මිලියන 11.6 ක් වූ අතර, පසුගිය වර්ෂයේ ශුද්ධ ලාභය රුපියල් මිලියන 17.8 කි.

13.2.2 භාණ්ඩාගාරයෙන් අනුමත ප්‍රාග්ධන මුදල්වලින් වර්ෂයේ වියදම් වශයෙන් ලැබී ඇත්තේ රුපියල් මිලියන 07 ක් පමණි.

13.3 <u>නිෂ්පාදන ණය සහ සිනමාහල් ණය</u>

විත්‍රපට ප්‍රදර්ශනයේදී පිටපත් මුද්‍රණය හා ප්‍රචාරක කටයුතු සඳහා ණය පහසුකම් ලබාදීම සහ සිනමාශාලා නවීකරණය සඳහා ණය පහසුකම් ලබාදීම මෙම වර්ෂයේදී ද සිදු කර ඇත. එය 2012 වර්ෂයේදී විත්‍රපට නිෂ්පාදනය සඳහා රු.මිලි.94.4 ක් සහ සිනමාශාලා ණය සඳහා රු.මිලි. 13.1 ක් වූ ශේෂය 2013 වර්ෂයේදී විත්‍රපට නිෂ්පාදනය සඳහා රු.මිලි. 91.1 දක්වා අඩුවී සිනමාශාලා ණය රු.මිලි. 15.5 කින් වැඩිවී ඇත. නිෂ්පාදනය කරනු ලබන විත්‍රපට ප්‍රදර්ශනයේදී පිටපත් හා ප්‍රචාරක කටයුතු සඳහා ණය පහසුකම් මෙම වර්ෂයේදී ද ලබාදී ඇත. 2012 වර්ෂයේ රු.මිලි. 107.4 ක් වූ ණය ශේෂය මෙම වර්ෂයේදී රු.මිලි.106.6 කින් අඩුවී ඇත. ණය ලබාදී ඇති සිනමාශාලාවලින් ණය වාරික වශයෙන් ගෙවීම් කරගෙන යාම නිසා ණය ශේෂය අඩු වී ඇත.

13.3.1 විත්‍රපට කුලී ණයගැති ශේෂය රු.මිලි 07 කින් අඩුවී ඇත. සිනමාහල්වලින් ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙයට ප්‍රධාන හේතුව වී ඇත.

13.4 **<u>ආයෝජන</u>**

වර්ෂය අවසානයේ ස්ථාවර තැන්පතුවල රු.මිලි.14.6ක් ද, භාණ්ඩාගාර බිල්පත්වල රු.මිලි.76.4ක් ද, රිපෝ තැන්පතුවල රු.මිලි.33.7ක් ද ආයෝජනය කර තිබේ. මෙම මුදල්වලින් රු.මිලි.32.2 ක් සංස්ථාවේ සේවක මහත්ම/මහත්මින්ගේ පාරිතෝෂික මුදල් සඳහා වන අතර, සිනමාශාලාවලින් ලබා ගන්නා ඇප මුදල් රු.මිලි. 2.4 ක් ඉහත සඳහන් මුදල්වල ඇතුලත් වේ.

13.5 **<u>සේවක පාරිතෝෂික මුදල් වෙන් කිරීම.</u>**

මෙම වර්ෂයේ සේවක පාරිතෝෂික මුදල් වෙන් කිරීමේ මුළු ප්‍රමාණය රු.මිලි.32.2 කි.

13.6 සේවක පාරිශ්‍රමිකය ගෙවනු ලබන්නේ භාණ්ඩාගාරයෙන් ලැබෙන මුදල්වලිනි. ඒ හේතුව මත වර්ෂයේ ආදායම බදු වෙන් කිරීමක් කර නොමැත.

## 14. <u>විත්‍රාගාරය</u>

පශ්චාත් නිෂ්පාදන අදියරේ පවතින විත්‍රපට සඳහා කාර්මික සේවාවන් සහ පහසුකම් සැපයීම දළුගම සරසවි විත්‍රාගාරයේ ප්‍රධාන කාර්යය භාරය වේ.

මෙම වසරේදීත් විත්‍රාගාරයේ පහත සඳහන් අංශවලින් දේශීය විත්‍රපට නිෂ්පාදකවරුන්ට අවශ්‍ය කාර්මික සේවාවන් සහ පහසුකම් සපයා ඇත.

1. ශබ්ද අංශය - (Digital)
2. අරේබීය සංස්කරණ අංශය - (Digital)
3. කළු/සුදු රසායනාගාරය
4. චිත්‍රපට සංරක්ෂණාගාරය
5. චිත්‍රපට හා රූපවාහිනී රූගත කිරීමේ මැදිරිය

## 14.1 ඉටු වී ඇති කාර්යභාරය

1. සරසවි චිත්‍රාගාරය විසින් චිත්‍රපට කර්මාන්තයට ලබාදෙන කාර්මික පහසුකම් අනුව දේශීය චිත්‍රපට 23 ක් පමණ සහ ප්‍රචාරක කෙටි චිත්‍රපට 03 ට ද කාර්මික සේවාවන් මෙම වසර තුලදී ලබා දී ඇත.

2. චිත්‍රපට සහ රූපවාහිනී වැඩසටහන් රූගත කිරීම සඳහා වන පහසුකම චිත්‍රාගාරයේ අභ්‍යන්තර මැදිරිය සහ චිත්‍රාගාර ආලින්දයේ මෙන්ම උද්‍යානය තුලදී ලබාදී ඇති අතර, අදාල කාලය තුල චිත්‍රපට ද ඇතුළුව රූපවාහිනී වැඩසටහන්, වෙළඳ දැන්වීම් 17 ක් සඳහා ද එම පහසුකම ලබාදී ඇත.

3. චිත්‍රාගාරයේ ශබ්ද අංශයේ එක් මැදිරියක් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව චිත්‍රපට සඳහා Surround Sound මිශ්‍රණය කිරීම සඳහා නවීකරණය කර උපකරණ සවි කිරීම.

   මෙම ව්‍යාපෘතිය සඳහා මූලික සැලසුම් අවසන් කර ඇත. ව්‍යාපෘතියේ කාර්මික උපදේශක ලෙස ඉන්දියානු ජාතික Dolby ශබ්ද උපදේශක වී. කිෂෝර් මහතා කටයුතු කරයි. මේ සඳහා වත්මන් සභාපතිතුමා විසින් තාක්ෂණ කමිටුවක් පත්කර ඇති අතර, එම කමිටුව කිෂෝර් මහතා සමඟ සාකච්ඡා කර අවසන් සැලසුම් (Drawings) සකස් කර ඇත. මෙම නවීකරණය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ ශබ්දාගාරයේ කුඩා මැදිරිය (විජය කුමාරතුංග මැදිරිය) තෝරාගෙන ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය ඉදිකිරීම් (Refurbishing) කිරීමටත්, උපකරණ මිලදී ගැනීම සඳහාත් BOQ සහ ටෙන්ඩර් පත්‍රිකා සකස් කර ටෙන්ඩර් කැඳවීමත් කළයුතුව ඇත.

4. චිත්‍රාගාරයේ ඩිජිටල් සංස්කරණ අංශය සඳහා උපකරණ කට්ටලයක් මිලදී ගෙන තාක්ෂණිකව යාවත්කාලීන කිරීම.

   චිත්‍රපටයක් මුද්‍රණය කිරීමට පෙර වර්ණ නිවැරදි (Color Correction) කිරීම සහ පරිගණක ආශ්‍රිත රූප නිර්මාණය කිරීම (Computer Generated Images) මූලික කර ගනිමින් දේශීය සිනමා කර්මාන්තයට අවශ්‍ය ලෙස සංස්කරණ (NLE) අංශය යාවත්කාලීන කිරීම සඳහා මිලදී ගතයුතු උපකරණ හඳුනාගෙන ඇති අතර , වෘත්තීය තාක්ෂණ කමිටුවක් මඟින් තවදුරටත් සාකච්ඡා කර උපකරණ මිලදී ගැනීම සඳහා ටෙන්ඩර් කැඳවීමට අවශ්‍ය කාර්මික පරිවිතරයන් සකස් කර මෙම වසර තුලදී ටෙන්ඩර් කැඳවීමට බලාපොරොත්තු වේ.

5. චිත්‍රපට සංස්ථාව සහ ශ්‍රී ලංකා පදනම් ආයතනය විසින් පවත්වනු ලබන සිනමා පාඨමාලාවන් සඳහා ශබ්ද සැළසුම (Sound Designing) ප්‍රායෝගික කාර්මික පහසුකම් චිත්‍රාගාරය විසින් සපයා ඇත.

6. පැරණි සංරක්ෂණාගාරයේ තැන්පත් කර තිබූ චිත්‍රපට නෙගටිව් සහ පොසිටිව් පිටපත් ප්‍රමිතියකට අදාලව නිසි පරිදි ගබඩා කිරීම සඳහා කළු/සුදු රසායනාගාරයේ සුදුසු කාමර දෙකක් පිළිසකර කිරීම.

මෙම ව්‍යාපෘතිය අවසන් වී ඇති අතර, චිත්‍රාගාර සංරක්ෂණාගාරය සතුව තිබූ සියළුම චිත්‍රපට එම කාමරවල නිසි පරිදි ගබඩා කර ඇත. අවශ්‍ය වායුසමීකරණ යන්ත්‍ර සහ De-Humidifiers යන්ත්‍ර සවිකර ඇති අතර, දවසේ පැය 24 තුලම ඒවා ක්‍රියාත්මක කරනු ලැබේ. ඒ අනුව ගබඩා කාමරවල උෂ්ණත්වය සහ සාපේක්ෂ ආර්ද්‍රතාවය (Relative Humidity) පාලනය කරනු ලැබේ.

7. චිත්‍රාගාරයේ පිවිසුම් දොරටුව (Entrance Gate) නැවත සැලසුම් කර ඉදිකිරීම, එයට යාබදව අලෙවිසැලක් ඉදිකිරීම සහ චිත්‍රාගාර පිවිසුම් මාර්ගය සකස් කිරීම.

මෙම ව්‍යාපෘතිය ද සම්පූර්ණයෙන් අවසන්වී නොමැත.

8. චිත්‍රාගාරය සඳහා ආපන ශාලාවක් ඉදිකිරීම ආරම්භ කර ඇති අතර, එම ව්‍යාපෘතිය ද සම්පූර්ණයෙන් අවසන් වී නොමැත.

9. ගොඩනැගිලිවල ඇතුලත හා පිටත තීන්ත ආලේප කිරීම සහ ප්‍රධාන ආලින්දය ටෙරාසෝ පොළොව කපා ඔප දමා පිරිසිදු කිරීම.

## 14.2 <u>චිත්‍රාගාර කාර්මික සේවාවාවන් ලබාගත් චිත්‍රපට - 2013</u>

01. වාර්තා වැඩ සටහන (ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව)
02. රංජා
03. වස්දඬු රාවය
04. පරාවර්තන
05. වෙස්වලාගත් තරුණිය
06. පිළිකඩතුරාව
07. හෝ ගාන පොකුණ
08. පරපුර
09. වාර්තා වැඩ සටහන (කැළණිය විශ්වවිද්‍යාලය)
10. සතියකට මට රට බාරදෙන්න
11. කඳුලක අපේක්ෂා
12. ප්‍රීති ඇන්ඩ් ජෝයි
13. ඇද්ද ලණුව දැම්ම කොඩිය
14. ආදර පූජාසනේ
15. වෙළද දැන්වීම-පසුබිම් කථනය පටිගත කිරීම.
16. කුමරි කන්‍යාවි

17. කේ සරා සරා
18. පටිභාන
19. ඔළුව ජපන් කද ජර්මන්
20. සුපිරි අන්දරේ
21. ස්පන්දන
22. ඩොක්ටර් නවරියන්
23. ඩබල් ට්‍රිබල්

## 14.3 දාෂ්ටි පට ආරෝපණ සේවාවාවන් ලබාගත් චිත්‍රපට/ප්‍රචාරක කෙටි චිත්‍රපට - 2013

කෙටි චිත්‍රපට - 1.වෙළඳ දැන්වීම
2. ඉමේජ් 48

## 14.4 චිත්‍රාගාරයේ රූගත කළ චිත්‍රපට/රූපවාහිනී වැඩසටහන් 2013

රූපවාහිනී වැඩ සටහන් -

01. ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව - සුව ණැන ප්‍රශ්ණ විචාරාත්මක වැඩ සටහන
02. ඉන්ෆ්ලේම් (පෞද්.) සමාගම - ඩැන්ඩෙක්ස් රූපවාහිනී වෙළඳ දැන්වීම
03. සඳරූ චිත්‍රපට - ආශා මායා චිත්‍රපට
04. සුදම්සා චිත්‍රපට - පටිභාන චිත්‍රපටය
05. දෙරණ - ශූර ගොවියා වැඩ සටහන
06. දෙරණ - ලිටිල් ස්ටාර්
07. ඉන්ෆ්ලේම් (පෞද්.) සමාගම - විම් රූපවාහිනී වෙළඳ දැන්වීම
08. Universal Lanka Creation - සූරයෝ චිත්‍රපටය
09. ත්‍රී ඉන් වන් - සීඩී පටය දොරට වැඩුම
10. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය - රට විරුවෝ ටැලන්ට් ස්ටාර්
11. ද වීඩියෝ ටීම් - දම්රෝ රූපවාහිනී වෙළඳ දැන්වීම
12. E.A.P Network (Pvt) Ltd - Swarnavahini Tokyo Cement All Island School Quiz-2013
13. බයිස්කෝප් ටීම් - සුපිරි අන්දරය චිත්‍රපටය
14. දෙරණ - Dell Studio
15. ජාතික තරුණ සේවා සභාව - සිහිනය වැඩ සටහන
16. උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව - ප්‍රායෝගික දේශන
17. Grass Root World Wide Company –– IFAD- Documentary

## 14.5 වර්ෂය තුල චිත්‍රාගාර ලැබීම්

| | රු. |
|---|---|
| ශබ්ද අංශය | 1,585,052.94 |
| අරේබිය සංස්කරණ අංශය | 471,149.09 |
| කළු-සුදු රසායනාගාරය | 4,582.40 |
| රූගත කිරීම් | 2,504,728.21 |
| සමස්ථ ලැබීම් | 4,565,512.64 |

# 15. පරීක්ෂණ කටයුතු

## 15.1 වර්ෂය තුල ඉටුකල සේවාවන්

| | |
|---|---|
| සිනමාශාලා පරීක්ෂා කල දර්ශන වාර ගණන | - 1153 |
| එකතු කරන ලද හිඟ මුදල් ප්‍රමාණය | - රු. 2,896,078.48 |
| නිකුත් කල හරපත්‍ර වටිනාකම | - රු. 1,535,050.00 |

* සිනමා වසන්තය නමින් නව ව්‍යාපෘතියක් වත්මන් සභාපති නීතිඥ අශෝක සේරසිංහ මහතාගේ සංකල්පයක් අනුව පරීක්ෂණ අංශය විසින් ක්‍රියාත්මක කිරීම.

ඒ යටතේ ,

- නව සිනමාශාලා ඉදිකිරීම
- වසා දමා තිබූ සිනමාශාලා නැවත විවෘත කිරීම
- සිනමාශාලා ඉදිකිරීම සඳහා ඉඩම් ගොඩනැගිලි පිළිබඳ තොරතුරු රැස් කිරීම

සිදු කරන ලදි.

## 15.2 නව සිනමාශාලා ඉදිකිරීම

2013 වර්ෂය තුල නව සිනමාශාලා 04 ක් ඉදිකරන ලදි.

- සිනෙල්මා සිනමා - අලව්ව
- ඇම්ටි ලයිට් සිනමා - මහරගම

- EXCEL සිනමා - කොළඹ 02
- සෙල්වම් ප්‍රීමියර් සිනමා - වෙන්කලඩි

15.3 **<u>වසා දමා තිබූ සිනමාශාලා නැවත විවෘත කිරීම.</u>**

වර්ෂය තුල වසාදමා තිබු පැරණි සිනමාශාලා 14 ක් නැවත විවෘත කිරීමට කටයුතු කරන ලදි.

| | | |
|---|---|---|
| කල්‍යාණි සිනමා | - | හෙට්ටිපොල |
| සමාරා සිනමා | - | නාත්තන්ඩිය |
| ප්‍රගාස් සිනමා | - | පුංඩළුඔය |
| ලක්මාලි සිනමා | - | රාගල |
| රීජන්ට් සිනමා | - | රඹුක්කන |
| සමනල සිනමා | - | මැල්සිරිපුර |
| විජය සිනමා | - | බඩල්කුඹුර |
| ෂැම්රොක් සිනමා | - | වෙන්නප්පුව |
| මයික් සිනමා | - | මාදම්පේ |
| තරංගනී සිනමා | - | දැරණියගල |
| වෙස්ලි සිනමා | - | මනිපායි |
| සූර්ය සිනමා | - | සූර්යවැව |
| රෝයල් සිනමා | - | කහවත්ත |
| ඉන්ද්‍රානි සිනමා | - | වැලිමඩ |

15.4 **<u>සිනමාශාලා ඉදිකිරීම සඳහා ඉඩම් සහ ගොඩනැගිලි පිළිබඳ තොරතුරු රැස්කිරීම.</u>**

2013 වසර තුල සිනමාශාලා සඳහා ගොඩනැගිලි, ඉඩම් පිළිබඳව තොරතුරු රැස් කරන ලදි. එම තොරතුරුවලට අනුව ස්ථාන 24 ක් හඳුනාගෙන ඇත.

15.5 **<u>ප්‍රේක්ෂක රසාස්වාදය සඳහා උසස් තාක්ෂනයෙන් යුතු උපකරණ සිනමාශාලා තුල ස්ථාපිත කිරීම.</u>**

නෙදර්ලන්ත රජය යටතේ ආධාර ලෙස ලබාදුන් ප්‍රක්ෂේපණ යන්ත්‍ර, සිනමාශාලා 11 ක් සඳහා බෙදා දෙන ලදි. නැවත නොගෙවීම පදනම මත අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට යටත්ව එක් යන්ත්‍රයක් සඳහා රු. 200,000/- ක තැන්පතුවක් ලබා ගෙන ප්‍රක්ෂේපණ යන්ත්‍ර 11 ක් පහත පරිදි සිනමාශාලා වෙත ලබාදී ඇත. ඒ අනුව රු. 2,200,000/- ක් සංස්ථා ගිණුමක තැන්පත් කර තිබේ.

| | | |
|---|---|---|
| සිනේමාල් සිනමා | - | අලව්ව |
| නිව් නන්දා සිනමා | - | නිකවැරටිය |
| සිනෙල්මා සිනමා | - | බදුල්ල |
| ඉන්ද්‍රානි සිනමා | - | වැලිමඩ |
| විජය සිනමා | - | කිලිනොච්චිය |
| සෙල්වම් ප්‍රිමියර් සිනමා | - | වෙන්කලඩි |
| ලක්මාලි සිනමා | - | ආරච්චිකට්ටුව |
| දිනුෂා සිනමා | - | නාවලපිටිය |
| ස්කයි ලයිට් සිනමා | - | මාතර |
| සුදර්ශි සිනමා | - | ආනමඩුව |
| නිව් ලයින් සිනමා | - | දඹුල්ල |

15.6 **ත්‍රිමාන සහ ඩිජිටල් ප්‍රක්ෂේපණ අත්දැකීම ශ්‍රී ලාංකේය ප්‍රේක්ෂකයින්ට ලබාදීම.**

මෙම තාක්ෂණය සම්බන්ධයෙන් සිනමාශාලා අයිතිකරුවන්, බදුකරුවන් හා බෙදාහැරීමේ මණ්ඩල දැනුවත් කිරීමට කටයුතු කරන ලදි. එහි ප්‍රතිඵලය ලෙස සිනමාශාලා කිහිපයක් ත්‍රිමාන සහ ඩිජිටල් ප්‍රක්ෂේපණයට පරිවර්තනය කර ඇත.

වර්ෂය තුල පහත සිනමාශාලා ප්‍රක්ෂේණය ඩිජිටල්කරණය සහ ත්‍රිමානකරණය සිදු කර ඇත.

| සිනමාශාලාව | නගරය | ඩිජිටල් (2 K ) සිනමා | ත්‍රිමාන (3D) සිනමා |
|---|---|---|---|
| MC - ප්ලැටිනම් | බම්බලපිටිය | ✓ | ✓ |
| MC - ගෝල්ඩ් | බම්බලපිටිය | ✓ | - |
| MC - අල්ට්‍රා | බම්බලපිටිය | ✓ | - |
| MC - සුපීරියර් | බම්බලපිටිය | ✓ | ✓ |
| EXCEL | කොළඹ -02 | ✓ | ✓ |
| සෙල්ලම් ප්‍රිමියර් | වෙන්කලඩි | ✓ | - |
| සැවෝයි 1 | වැල්ලවත්ත | ✓ | ✓ |
| සැවෝයි 2 | වැල්ලවත්ත | ✓ | - |

### 15.7 සිනමාශාලා ආසන ගාස්තු සංශෝධනය කිරීම.

වර්ෂය තුල සිනමාශාලා 68 ක ආසන ගාස්තු සංශෝධනය කිරීම සඳහා නිර්දේශ ලබා දී ඇත.

### 15.8 විදේශ රූගත කිරීම් අධීක්ෂණය

මෙම වර්ෂයේ දී ද විදේශ රට වලින් ශ්‍රී ලංකාවට පැමිණෙන වෙළඳ දැන්වීම්, චිත්‍රපට හා වාර්තාමය වැඩ සටහන් රූගත කිරීම් අධීක්ෂණ කටයුතු සිදු කරන ලදි. ඒ අනුව 2013 වසර තුල රූගත කිරීම් 50 ක් අධීක්ෂණය කර ඇත.

## 16. සුභසාධනය

සංස්ථා සුභසාධක සකසුරුවම් හා ණයදීම් සමිතියේ කටයුතු සමිතියේ සාමාජික සුභ සාධනය වෙනුවෙන් මෙම වර්ෂය තුලද ක්‍රියාත්මකය.

## 17. ක්‍රීඩා සංගමය

පහත ජයග්‍රහණ වර්ෂය තුලදී ලබාගෙන ඇත.

- 2013.07.31 දින පැවති ජනසතු සේවා කැරම් ශූරතා - කණිෂ්ඨ තරඟාවලියේ පිරිමි යුගල හා කාන්තා කේවල තරඟයේ අනුශූරතාවය

- 2013.08.23 සිට 2013.08.25 දක්වා දෙහිඅත්තකණ්ඩිය මහවැලි ක්‍රීඩාංගනයේ පැවති එල්ලේ ලීග් තරඟාවලියේ B අංශයේ අනුශූරතාවය

මීට අමතරව වාර්ෂික තිළිණ ලෙස සාමාජිකයින් සඳහා ටී ෂර්ට් සහ යතුරු රඳවනයක් ලබාදීමට කටයුතු කිරීම.

## 18. ආගමික කටයුතු

### 18.1 බෞද්ධ සංගමය

- සංස්ථා සේවකයින්ගේ අධ්‍යාපනය ලබන දූදරුවන් සඳහා අභ්‍යාස පොත් ලබාදීම.
- වෙසක් සහ පොසොන් පොහොය උදෙසා සංස්ථා පරිශ්‍රයේ ධර්ම දේශනා පැවැත්වීම.
- වෙසක් පොහොය නිමිති කොටගෙන සංස්ථා භූමියේ කෝපි සහ බිස්කට් දන්සලක් පැවැත්වීම.

## 18.2 ක්‍රිස්තියානි සංගමය

- සංස්ථා කාර්ය මණ්ඩලයේ දූ දරුවන්ගේ සහභාගීත්වයෙන් නත්තල් උත්සවය පැවැත්වීමට කටයුතු කිරීම.

## 19. වෛද්‍ය සහනාධාර ක්‍රමය

- සාමාජික මුදල් හා සංස්ථාවෙන් ප්‍රතිපූර්ණය කරනු ලබන මුදල් මත පවත්වාගෙන යනු ලබන වෛද්‍ය සහනාධාර ක්‍රමය මෙම වර්ෂය තුල ද ක්‍රියාත්මක වූ අතර එහි පාලක කමිටුව පහත පරිදි වේ.

1. ඒ.එල්.ඩී.ටී. පෙරේරා මහතා - කමිටු සභාපති (සහ/ සාමාන්‍යාධිකාරි - මුදල්)
2. රංජනී පෙරේරා මහත්මිය - කමිටු සාමාජික (වැ.බ. කළමනාකරු - පිරිස්)
3. ආර්.පී.තිස්ස මහතා - කමිටු සාමාජික (ලේකම්-ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය)
4. සුබිත ඉලංගකෝන් මහතා - කමිටු සාමාජික (සභාපති - චිත්‍රපට සංස්ථා සේවක සංගමය)
5. කේ.ආර්. වින්සන් මහතා - කමිටු සාමාජික (ජාතික සේවක සංගමයේ නියෝජිත )
6. එච්.ඩී. අසංක ගුණතිලක මහතා - කාර්යභාර නිළධාරි

## 20. වෘත්තීය සමිති

ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය , ජාතික සේවක සංගමය, විධායක නිලධාරින්ගේ සංගමය හා චිත්‍රපට සංස්ථා සේවක සංගමය මෙම වසර තුලදී ද පාලනාධිකාරිය සමඟ සහයෝගයෙන් කටයුතු කර ඇත.

## 21. ස්තුතිය

2013 වසරේ සාර්ථක ප්‍රතිඵල ලබා ගැනීම සඳහා සංස්ථා කාර්ය මණ්ඩලය ඉතා වගකීමෙන් හා අප්‍රතිහත ධෛර්යයෙන් යුතුව සිය සේවාවන් ඉටු කර ඇත. එම සේවාවන් අධ්‍යක්ෂ මණ්ඩලය ඉමහත් සේ අගය කරන අතර ඔවුන් වෙත සිය ස්තුතිය කෘතවේදීව පලකර සිටියි.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්
අත්/කළේ

නීතීඥ අශෝක සේරසිංහ
සභාපති
ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව.

### ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
### 2013.12.31 දිනට අවසන් වර්ෂය සඳහා
### විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

| විස්තරය | සටහන | 2013 | 2012 | 2013 ප්‍රදර්ශණ | 2013 චිත්‍රාගාරය | 2013 නිෂ්පාදන | 2013 පොදු පරිපාලන වියදම් |
|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| විකුණුම් | **03** | 41,575,700 | 46,432,012 | 35,579,114 | 2,269,993 | - | 3,726,593 |
| අඩු කළා : විකුණුම් පිරිවැය | **04** | 5,572,100 | 3,261,147 | - | 895,012 | - | 4,677,088 |
| දළ ලාභය | | 36,003,600 | 43,170,865 | 35,579,114 | 1,374,981 | - | (950,495) |
| අඩු කළා : වියදම් | | | | | | | |
| සේවක පාරිශ්‍රමික | **05** | 59,714,904 | 64,031,817 | 12,102,386 | 9,111,517 | 2,963,881 | 35,537,120 |
| ගමන් හා යැපීම් දීමනා | **06** | 563,652 | 710,466 | 3,384 | 18,241 | - | 542,027 |
| සැපයුම් හා උපකරණ | **07** | 7,800,622 | 6,991,428 | 2,005 | 1,841,037 | 13,600 | 5,943,980 |
| අළුත්වැඩියා කිරීම් නඩත්තු හා ක්ෂයවීම් | **08** | 26,935,121 | 25,040,572 | 112,503 | 6,029,143 | 33,000 | 20,760,475 |
| ප්‍රවාහන , සම්බන්ධතා , අවශ්‍යතා හා වෙනත් සේවා | **09** | 17,283,927 | 15,226,827 | 934,881 | 1,714,972 | 1,668,009 | 12,966,065 |
| බොල් ණය සඳහා හානිකරන ගැලපීම් | | 24,779,026 | 20,310,000 | 22,782,150 | - | 1,879,187 | 117,689 |
| පාරිතෝෂික වෙන් කිරීම් | | 2,725,863 | 2,326,443 | 576,075 | 460,823 | 158,383 | 1,530,582 |
| චිත්‍රපට කලාකරුවන් හා කාර්මික ශිල්පීන්ගේ අරමුදල් සඳහා වෙන් කිරීම් | | 200,000 | 200,000 | - | - | 200,000 | - |
| තොග හානි | | 862 | 85,120 | - | 862 | - | - |
| | | 140,003,977 | 134,922,673 | 36,513,384 | 19,176,595 | 6,916,060 | 77,397,938 |
| පොදු පරිපාලන වියදම් අන්තර්ග්‍රහණය කිරීම් | | - | - | 26,315,297 | 20,123,463 | 6,191,834 | (52,630,594) |
| | | 140,003,977 | 134,922,673 | 62,828,681 | 39,300,058 | 13,107,894 | 24,767,344 |
| මෙහෙයුම් ලාභය / අලාභය | | (104,000,378) | (91,751,808) | (27,249,567) | (37,925,077) | (13,107,894) | (25,717,839) |
| එකතු කළා : වෙනත් ආදායම් | **10** | 45,662,551 | 41,264,022 | | | | |
| වසරේ අලාභය / ලාභය | | (58,337,827) | (50,487,786) | | | | |
| එකතු කළා : භාණ්ඩාගාර ලැබීම් | | 69,960,000 | 68,308,000 | | | | |
| බදු පෙර ලාභය | | 11,622,173 | 17,820,214 | | | | |
| අඩු කළා : බදු සඳහා වෙන් කිරීම් | | - | - | | | | |
| බදු පසු ලාභය | | 11,622,173 | 17,820,214 | | | | |

## ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
## 2013 දෙසැම්බර් 31 දිනට
## මූල්‍ය තත්ත්ව ප්‍රකාශණය

| | සටහන | 2013 | 2012 |
|---|---|---|---|
| | | රු. | රු. |
| නියෝජනය වන්නේ | | | |
| ස්ථාවර වත්කම් | | | |
| දේපල , යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | **11** | 376,958,916 | 340,619,051 |
| දිගු කාලීන ආයෝජන | **12** | 127,000 | 127,000 |
| | | 377,085,916 | 340,746,051 |
| ජංගම වත්කම් | | | |
| කෙටි කාලීන ආයෝජන | **13** | 124,798,484 | 105,506,897 |
| තොග | **14** | 13,180,122 | 16,980,509 |
| ණයගැතියෝ | **15** | 140,639,948 | 172,539,656 |
| විවිධ ණයගැතියෝ | **16** | 26,958,338 | 24,621,778 |
| තැන්පතු හා ඉදිරි ගෙවීම් | **17** | 10,668,621 | 10,524,054 |
| මුදල් හා බැංකු ශේෂය | **18** | 30,075,160 | 25,587,063 |
| | | 346,320,674 | 355,759,958 |
| මුළු වත්කම් | | 723,406,590 | 696,506,008 |
| යෙදවූ ප්‍රාග්ධනය | | | |
| අනුදත් ප්‍රාග්ධනය | | 10,000,000 | 10,000,000 |
| සමුච්චිත ලාභය | | 273,324,184 | 249,577,323 |
| වෙනත් සංචිත | | 123,482,759 | 123,482,759 |
| ප්‍රදානයන් | **19** | 138,062,990 | 144,961,548 |
| | | 544,869,933 | 528,021,630 |
| ජංගම නොවන වගකීම් | | | |
| පාරිතෝෂික වෙන් කිරීම් | **20** | 32,225,489 | 33,885,923 |
| | | 32,225,489 | 33,885,923 |
| අඩු කළා : ජංගම වගකීම් | | | |
| තැන්පතු | **21** | 2,446,727 | 2,386,727 |
| චිත්‍රපට කුලී ණයහිමියෝ | **22** | 105,930,840 | 85,139,962 |
| වෙනත් ණයහිමියෝ | **23** | 37,933,601 | 47,071,767 |
| | | 146,311,168 | 134,598,456 |
| මුළු වගකීම් | | 723,406,590 | 696,506,009 |

........................ .................. ..................

වැ. බ. නි. සාමාන්‍යාධිකාරී - මුදල් සභාපති අධ්‍යක්ෂ

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව ,
303 , බෞද්ධාලෝක මාවත ,
කොළඹ 07.

2014.07.18

## ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
## 2013.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

| | | හිමිකම් ප්‍රාග්ධනය රු. | සමුච්චිත ලාභය රු. | ප්‍රාග්ධන සංචිත රු. | ප්‍රත්‍යාගණන සංචිත රු. | වෙනත් සංචිත රු. | එකතුව රු. |
|---|---|---|---|---|---|---|---|
| **01.01.2012 දිනට ශේෂය** | | 10,000,000 | 226,348,818 | 499,898 | 115,153,399 | 7,829,462 | 359,831,577 |
| පෙර වසර සඳහා කල ගැලපීම් | | - | 5,408,290 | - | - | - | 5,408,290 |
| වසරේ ලාභය | | - | 17,820,214 | - | - | - | 17,820,214 |
| **31.12.2012 දිනට ශේෂය** | | 10,000,000 | 249,577,323 | 499,898 | 115,153,399 | 7,829,462 | 383,060,082 |
| වසරේ ලාභය | | - | 11,622,173 | - | - | - | 11,622,173 |
| පෙර වසර සඳහා කල ගැලපීම් | **සටහන ඒ** | - | 12,124,686 | - | - | - | 12,124,686 |
| **31.12.2013 දිනට ශේෂය** | | 10,000,000 | 273,324,182 | 499,898 | 115,153,399 | 7,829,462 | 406,806,941 |

**සටහන ඒ**

පෙර වසර සඳහා කල ගැලපුම්හි අන්තර්ගත වනුයේ :

- ගෙවීමට අවශ්‍ය නොවන සැපයුම්කරුවන් සඳහා කල චෙක්පත් නිකුත් කිරීම ආදායමට හඳුනා ගැනීම. රු. 238,357.01
- සේවක අර්ථසාධක අරමුදල් සහ උපචිත වියදම් සඳහා කල අධි වෙන් කිරීම් පෙර වසරේ ලාභයට ගැලපීම රු. 10,931,855.34
- ආරම්භක තොගය සඳහා කල ගැලපීම රු. 954,473.75

**ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව**

**2013.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | 2013 | 2012 |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල්** | රු. | රු. |
| බද්ද අඩු කිරීමට පෙර ශුද්ධ ලාභය | (58,337,827) | (50,487,786) |
| (අඩු කළා ) | | |
| නිෂ්පාදන ණය මත පොළිය | (4,007,480) | (1,653,326) |
| ස්ථාවර හා භාණ්ඩාගාර බිල්පත් පොළිය | (11,787,366) | (9,923,925) |
| | (74,132,673) | (62,065,037) |
| **මුදල් චලනය කෙරෙහි බල නොපාන විෂයයන් සඳහා ගැලපීම** | | |
| ක්ෂයවීම් | 17,780,018 | 17,648,516 |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | 2,725,863 | 2,326,443 |
| අඩමාණ ණය සඳහා ප්‍රතිපාදන | 24,779,026 | 20,310,000 |
| ඩී.ටී.එස්. ශබ්ද උපකරණ | - | (16,099,088) |
| නඩත්තු වියදම් ප්‍රතිපාදන | - | 616,923 |
| වර්ෂය මුල තොගය ගැලපීම | - | (4,567,555) |
| හිමිකම් නොපැවේතන සඳහා වෙන් කිරීම් | - | (387,231) |
| නොගෙවිය යුතු විකුණුම් බද්ද/හිමිකම් නොපැවේතන ආදායමට හඳුනා ගැනීම් | (306,426) | (178,119) |
| භාවිතයේ නොමැති වත්කම් පොත් වලින් ඉවත් කිරීම | 202,448 | 178,500 |
| රාජ්‍ය ප්‍රදානයන් ආදායමට හඳුනා ගැනීම | (13,898,558) | (13,805,436) |
| ණයහිමි හානිකරණ ගැලපීම් | (4,193) | (60,764) |
| එකඟතාවයකට පැමිණ නොමැති කරුණු සඳහා ගැලපීම | - | (54,974) |
| | (42,854,494) | (56,137,822) |
| **ඉකුත් කාල පරිච්ඡේද වල විෂයයන්** | | |
| ඉකුත් කාල පරිච්ඡේද වල විෂයයන් සඳහා ගැලපීම | 12,124,686 | 5,408,290 |
| ස්ථාවර වත්කම් වලට ගැලපීම | 830,021 | 885,872 |
| වර්ෂය මුල තොගය ගැලපීම | - | (4,567,555) |
| කාරක ප්‍රාග්ධන විෂයන්ගේ වෙනස්කම් වලට පෙර මෙහෙයුම් ලාභය | (29,899,787) | (54,411,215) |
| **කාරක ප්‍රාග්ධන විෂයන්ගේ වෙනස්වීම්** | | |
| තොගය ( අඩුවීම) | 3,800,387 | (10,735,600) |
| ණයගැතියෝ ( අඩුවීම) | 4,784,122 | (19,137,630) |
| තැන්පතු හා ඉදිරි ගෙවීම් ( වැඩිවීම ) | (347,016) | 18,995,027 |
| තැන්පතු ( වැඩිවීම ) | 60,000 | - |
| ණයහිමියෝ (වැඩිවිම) | 20,795,071 | 27,805,648 |
| වෙනත් ණයහිමියෝ ( අඩුවීම ) | (8,831,739) | (7,991,689) |
| | (9,638,962) | (45,475,459) |
| **අඩු කළා :** | | |
| පාරිතෝෂික ගෙවීම් | (4,386,297) | (6,457,715) |
| එකඟතාවයකට නොපැමිණි ගෙවීම් | - | (845,416) |
| | (14,025,259) | (52,778,590) |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය** | | |
| නිෂ්පාදන ණය පොලී | | |
| ස්ථාවර හා භාණ්ඩාගාර බිල්පත් පොළිය | 15,794,846 | 11,577,251 |
| ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම | (19,291,587) | (16,385,814) |
| භාණ්ඩාගාර බිල්පත් හා ස්ථාවර තැන්පතු ආයෝජනය | (54,949,905) | (7,769,115) |
| ස්ථාවර වත්ක විකිණීමෙන් ලැබු මුදල් | - | 80,000 |
| භාණ්ඩාගාර ලැබීම් | 76,960,000 | 75,308,000 |
| මුදල් හා මුදල් හා සමාන විෂයන්ගේ ශුද්ධ වැඩිවීම් | 4,488,095 | 10,031,732 |
| වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් හා සමාන විෂයන්ගේ ශේෂය | 25,587,063 | 15,555,331 |
| වර්ෂය අවසානයේ මුදල් හා මුදල් හා සමාන විෂයන්ගේ ශේෂය | 30,075,158 | 25,587,063 |

**ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

**2013 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය**

---

**මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම පිළිබඳ ප්‍රකාශය**

සංස්ථාවේ කළමනාකරණය ,

1. සංස්ථාවේ ආදායම සහ වියදම වත්කම් සහ වගකීම් සහ අනෙකුත් සියළු මූල්‍ය ගණුදෙනු පිළිබඳව නිසි ගිණුම් පොත් තබා ගැනීම පිළිබඳව ,

2. සංස්ථාවේ මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මූල්‍ය තත්ත්වය පිළිබද සත්‍ය හා සාධාරණ ඉදිරිපත් කිරීමක් සදහා , 1995 අංක. 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිත පනත යටතේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් පනවන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව ගිණුම් සකස් කිරීම පිළිබදව හා

3. සංස්ථාවේ වත්කම් ආරක්ෂා කිරීමට හා වංචා සහ විෂමතා වැලැක්වීම සඳහා උචිත පියවර ගැනීම පිළිබඳව වගකිව යුතු වන්නේය.

**ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

**2013 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය**

1. **පොදු තොරතුරු**

**1.1.1 පිහිටීම හා නීතිමය තත්ත්වය**

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව 1971 අංක. 47 දරන පනත යටතේ ශ්‍රී ලංකාවෙහි සංස්ථාගත කොට පිහිටුවන ලදී. එහි ලියාපදිංචි කාර්යාලය , කොළඹ 07 , බෞද්ධාලෝක මාවතේ අංක.303 දරන ස්ථානයෙහි පිහිටියේය.

**1.1.2 මූලික ක්‍රියාකාරකම් හා මෙහෙයුම් ස්වරූපය**

ශ්‍රී ලංකා චිත්‍රපට සංස්ථාව මූලිකවම ශ්‍රී ලංකාවේ චිත්‍රපට කර්මාන්තය ජගත් ප්‍රමිතීන්ට සමපාත වන සේ වර්ධනය කිරීමෙහිලා නිරතව සිටී.

**1.1.3 නිකුත් කිරීම සඳහා අනුමත කළ දිනය**

මෙම මූල්‍ය ප්‍රකාශනයන් බෙදා හැරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2014.08.04 දින අනුමැතිය දෙන ලදී.

**1.2 ගිණුම් පිළියෙල කිරීමේ පදනම**

**1.2.1 අනුකූලතාව පිළබද ප්‍රකාශය**

සංස්ථාවේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය , විස්තීර්ණ ආදායම , හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය , වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය සහිත සටහන් ( මූල්‍ය ප්‍රකාශන ) සකස් කරන ලද්දේ , ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිති මණ්ඩලය මඟින් නිකුත් කරන ලද ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (IFRS) නියෝජනය වන පරිදි ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFRS) වලට අනුකූල වන පරිද්දෙනි.

**1.2.2. මූල්‍ය ප්‍රකාශන පිළිබද වගකීම**

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීමේ වගකීම ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ කළමනාකරීත්වය විසින් දරනු ලැබේ.

### 1.2.3. ගිණුම්කරණ පදනම

අදාළ සටහන් යටතේ සාධාරණ වටිනාකම සම්බන්ධයෙන් උචිත හෙළිදරව් කිරීමක් කර ඇත්නම් මිස මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම් කොට සකස් කර ඇත.

### 1.2.4 අඛණ්ඩතාව

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී කළමනාකරණය විසින් සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තක්සේරු කර ඇත. සංස්ථාව , එහි මෙහෙයුම් පෙනෙන අනාගත කාලය තුළදී පවත්වාගෙන යාමට අවශ්‍ය තරම් සම්පත් තිබෙන බව විශ්වාසනීයව අපේක්ෂා කරයි. තිබෙන්නා වූ සියලු තොරතුරු සැලකිල්ලට ගත් විට ඉදිරියේදී සංස්ථාව ඈවර කිරීමට හෝ එහි මෙහෙයුම් නතර කිරීමට හේතුවක් නොපෙනෙන අතර , අඛණ්ඩව පවත්නා ආයතනයක් සේ සලකා මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

### 1.2.5 SLFRS / LKAS මුල් වරට යොදා ගැනීම.

LKAS 1 පරිදි , ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (SLFRS) අනුව මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත. විකිණීමට ඇති මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් වල ලාභ හෝ අලාභ මඟින් සාධාරණ වටිනාකමට අගය කිරීමේ වෙනස් කිරීම සහිතව ඓතිහාසික පිරිවැය සංකල්පය මත මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් සියලු කාල පරිච්ඡේද සඳහා සංස්ථාව විසින් දේශීයව පොදුවේ පිළිගත් ගිණුම් පරිචයන් (Local GAAP) අනුව මූල්‍ය ප්‍රකාශන සකස් කරන ලදී. 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මෙම ගිණුම් ප්‍රකාශන SLFRS අනුව සංස්ථාව විසින් සකස් කළ පළමු වන මූල්‍ය ප්‍රකාශනයයි. සංස්ථාව SLFRS අදාළ කර ගත් ආකාරය 24 වන සටහනේ දැක් වේ. ඒ අනුව , සංස්ථාව විසින් අදාල SLFRS වලට අනුගත වෙමින් 2013 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනද 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සංසන්දනාත්මක තොරතුරුද ගිණුම් ප්‍රතිපත්ති වල දැක්වෙන ආකාරයට පිළියෙල කරන ලදී. මෙම ගිණුම් ප්‍රකාශන පිලියෙල කිරීමේදී නව ක්‍රමයට සංක්‍රමණය වූ දිනය වන 2012 ජනවාරි 01 වන දින සංස්ථාවේ මූල්‍ය තත්ත්ව ආරම්භක ප්‍රකාශනය සකස් කර ඇත.

සංස්ථාව විසින් දේශීය GAAP අනුව සැකසූ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට 2012 ජනවාරි 01 වන දින කරන ලද ගැලපුම් 24 වන සටහනේ දැක්වේ.

SLFRS 1 – ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත මුල් වරට යොදා ගැනීම - ප්‍රමිතියේ ප්‍රකාර කලින් කාල පරිච්ඡේද වලට අදාළ මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කිරීම හා වර්ගීකරණය සංශෝධනය කරන ලදී.

### 1.2.6 <u>කලින් පැවති පොදුවේ පිළි ගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති (GAAP) සමඟ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (SLFRS) සැසඳීම.</u>

SLFRS 1 අනුව සංස්ථාව විසින් පෙර පැවති GAAP අනුව ස්කන්ධ වාර්තා කිරීමත් SLFRS අනුව ස්කන්ධ වාර්තා කිරීමත් සංක්‍රමන දිනය , එනම් 2012 ජනවාරි 01 දින හා ඉතා මෑත වාර්ෂික මූල්‍ය ප්‍රකාශන දිනය එනම් , 2012 දෙසැම්බර් 31 දින ( විස්තීර්ණ ආදායමද ඇතුලුව ) අතර සැසඳීමක් කළ යුතු වේ. තව දුරටත් , මුදල් ප්‍රවාහ ප්‍රකාශයන්හි සැලකිය යුතු ගැලපුම් තිබේනම් අතිරේක සැසඳීමක්ද SLFRS 1 අනුව අවශ්‍ය වේ.

SLFRS 1 යොදා ගැනීම නිසා සංස්ථාවේ සත්‍ය මුදල් ප්‍රවාහයෙහි වෙනසක් සිදු නොවුවද , වාර්තා කරන ලද මූල්‍ය තත්ත්වයෙහි හා මෙහෙයුම් ප්‍රතිඵල වල යම් වෙනස්වීම් සිදු වී ඇත. එසේම , SLFRS හේතුවෙන් සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශයන්හි ඉදිරිපත් කිරීමේ වෙනස්කම් ගණනාවක් සිදු වී තිබේ. සංක්‍රමණ ගැලපුම් සහ ඉදිරිපත් කිරීමේ වෙනස්කම් ගණනාවක් සිදු වී තිබේ. සංක්‍රමණ ගැලපුම් සහ ඉදිරිපත් කිරීමේ ප්‍රති වර්ගීකරණය සඳහා පැහැදිලි කිරීම් මූල්‍ය ප්‍රකාශන වල 24 වන සටහන මඟින් දක්වා ඇත.

### 1.2.7 <u>ශේෂ පත්‍ර දිනය වන විට නිකුත් කර ඇති නමුත් මෙතෙක් බලාත්මක නොවන නව ගිණුම් ප්‍රමිත</u>

පහත දැක්වෙන නව ප්‍රමිතයන් , සංශෝධනයන් සහ පවත්නා ප්‍රමිත වල අර්ථ නිරූපනයන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කර ඇති නමුත් මෙම ගිණුම් අනුමත කරන දිනය දක්වා ඒවා බලාත්මක වී නොමැත. මෙම පහත දැක්වෙන ප්‍රමිත වලට අනුගත වීම මඟින් ඇතිවිය හැකි බලපෑම මෙතෙක් ඇස්තමේන්තු කර නැති අතර , එම නව ප්‍රමිතයන් , සංශෝධනයන් සහ පවත්නා ප්‍රමිත වල අර්ථ නිරූපනයන් සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන වලට

අදාල වේයැයි අපේක්ෂා කරන හෙයින් බලාත්මක වූ විට ඒවා භාවිතා කිරීමට කළමනාකාරීත්වය අපේක්ෂා කරයි.

SLFRS 9 මූල්‍ය සාධාන පත්‍ර ( Financial Instruments )

SLFRS 12 අනෙකුත් අස්තිත්වයන්හි හිමිකම් හෙළිදරව් කිරීම.
(Disclosure of interests in other entities)

SLFRS 13 සාධාරණ අගය මැනීම. (Fair value measurements)

**1.2.8 ක්‍රියාත්මක වීමේ හා ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල්**

සංස්ථාවේ ක්‍රියාකාරී ව්‍යවහාර මුදල වන ශ්‍රී ලංකා රුපියල් වලින් මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත.

**1.2.9 වැදගත් වන ගිණුම්කරණ විනිශ්චයන් , ඇස්තමේන්තු සහ උපලේඛන**

වාර්තා කරන දිනයේදී වාර්තා කරන ලද ආදායම් , වියදම් , වත්කම් සහ බැරකම් සහ අසම්භාව්‍ය වගකීම් හෙළිදරව් කිරීම පිළිබඳව වාර්තා කරන ලද සංඛ්‍යාවන්ට බලපාන විනිශ්චයන් , ඇස්තමේන්තු හා උපකල්පනයන් කිරීමට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණයට අවශ්‍ය වේ. කෙසේ වුවද , මෙම උපකල්පනයන්ගේ හා ඇස්තමේන්තු වල තිබෙන්නා වූ අවිනිශ්චිතභාවය හේතුවෙන් අනාගතයේදී වත්කම් හා බැරකම් වල පවත්නා වටිනාකම් වල සැලකිය යුතු ගැලපීම් කිරීමට අවශ්‍ය වන්නා වූ බලපෑම් ඇතිවිය හැකිය. මෙම කාරණයන්හි විනිශ්චයන් , ඇස්තමේන්තු හා උපකල්පනයන් ඇතුළත් විය හැකිය.

ඇස්තමේන්තු සහ උපකල්පන

ඉදිරි මූල්‍ය වර්ෂයේදී වත්කම් හා බැරකම් වල පවත්නා වටිනාකම්හි සැලකිය යුතු ගැලපීම් කිරීමට සිදූ වන්නා වූ , විශේෂිත අවදානම් ඇතිවිය හැකි , වාර්තා කරන දිනට පැවති අනාගතය පිළිබඳ ප්‍රධාන උපකල්පනයන් හා ඇස්තමේන්තු මූලාශ්‍රයන් පහත දක්වා ඇත.

(අ) <u>මූල්‍ය සාධන පත්‍රයන්හි සාධාරණ අගය</u>

ශේෂ පත්‍රයෙහි වාර්තා කරන ලද මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් වල සාධාරණ අගය ක්‍රියාකාරී වෙළෙඳ පොලේ ව්‍යුත්පන්න විය නොහැකි අතර , ඒවා වට්ටම් කළ මූල්‍ය ප්‍රවාහනයන් සහ / හෝ ගණිතමය ආකෘති ඇතුළු ශිල්ප ක්‍රම භාවිතා කරමින් නිශ්චය කර ඇත. මෙම ආකෘති වල යෙදවුම් , හැකි අවස්ථාවන්හිදී නිරීක්ෂණය කළ හැකි වෙළෙඳ පොල දත්තයන්ද එවැනි දෑ නොමැති විට විනිශ්චය කිරීමෙන්ම ලබා ගන්නා ලදී.

මෙම සාධකයන් පිළිබඳ උපකල්පනයන්හි වෙනස්වීම් වාර්තා කර ඇති මූල්‍ය සාධන පත්‍රයන්හි සාධාරණ අගය කෙරෙහි බලපෑ හැකිය.

(ආ) **<u>සාධාරණ අගය</u>**

සාධාරණ අගය යනු දැනුමක් හා කැමැත්තක් ඇති පාර්ශව අතර අතේ දුරින් සිදු වූ ගණුදෙනුවකදී වත්කමක් හුවමාරු කළ හැකි අගයයි. මූල්‍ය සාධන පත්‍රයක් මුලින්ම හඳුනා ගැනීමේදී එහි සාධාරණ අගය ලෙස සාමාන්‍යයෙන් ගැනෙන්නේ ලැබූ හෝ ගෙවූ වටිනාකමයි. පසුකාලීනව මූල්‍ය වත්කමක සාධාරණ අගය වන්නේ සක්‍රීය වෙළඳපොලක ඉල්ලුම් කෙරෙන ලංසු තබන මිළයි. මූල්‍ය වගකීම් සම්බන්ධයෙන් ඉල්ලුම් කරන මිළයි. මුදල් හා සමාන දෑ සහ කෙටි කාලීන ආයෝජන සඳහා පවත්නා අගය වන්නේ සාධාරණ මිළයි.

## 2. <u>විශේෂිත ගිණුම්කරණ ප්‍රතිපත්ති</u>

### 2.1 **<u>වත්කම් සහ ඒවා ඇගයීමේ පදනම</u>**

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කර ඇති මුදල් හා බැංකු ශේෂයන් සහ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රයේදී හෝ වර්ෂයක් තුළ හෝ යන දෙකින් අඩු කාල සීමාවේදී මුදල් බවට උපලබ්ධි වන ඒවාය.

## 2.2 <u>මූල්‍ය සාධන පත්‍ර</u>

### 2.2.1 <u>මූල්‍ය වත්කම් ( ව්‍යුත්පන්න නොවන )</u>

මූල්‍ය වත්කම් පහත සඳහන් කොටස් වලට වර්ගීකරණය කෙරේ. ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට අගය කළ දෑ , ණය සහ ලැබිය යුතු දෑ , කල් පිරෙන තුරු හෝ විකිණීමට තිබෙන දෑ , මෙම වර්ගීකරණය කළමනාකරණය විසින් නිර්ණය කරන ලද්දේ මූලික හඳුනා ගැනීම හා එම ආයෝජන අත්පත් කර ගැනීමේ අරමුණ පදනම් කොට ගෙනය.

### 2.2.2 <u>වර්ගීකරණය , හඳුනා ගැනීම සහ මැනීම.</u>

කළමනාකරණය විසින් එහි මූල්‍ය වත්කම් පහත සඳහන් ලෙස වර්ගීකරණය කරයි.

අ. ණය සහ ලැබිය යුතු දෑ

ආ. විකිණීම සඳහා ඇති දෑ

**අ. ණය සහ ලැබිය යුතු දෑ**

ස්ථාවර හෝ සක්‍රීය වෙළෙඳපොලේ මිළ ප්‍රකාශ නොවන , තීරණය වූ ගෙවීම් සහිත මූල්‍ය වත්කම්ය. මෙම වත්කම් මුලින්ම සාධාරණ වටිනාකමට එකතු වූ ඍජුවම අදාල වන ගණුදෙනු පිරිවැය හඳුනා ගනු ලැබේ. පසුකාලීනව ණය සහ ලැබිය යුතු දෑ සඵල පොලී ක්‍රමය මත ක්‍රමක්ෂය කිරීමත් , යම් හානිකරණ පාඩුවක් වේනම් එයත් සැලකිල්ලට ගෙන මනිනු ලැබේ.

**ආ. විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම්**

විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් යනු නිශ්චිත නොවූ කාල පරිච්ඡේදයක් තබා ගැනීමට අදහස් කරන , ද්‍රවශීලතා හේතු හෝ පොලී අනුපාත වෙනස්වීම මත , විනිමය අනුපාත වෙනස්වීම මත හෝ ස්කන්ධ මිළ මත විකිණීමට අවශ්‍ය විය හැකි හෝ ණය සහ ලැබිය යුතු දෑ ලෙස වර්ගීකරණය කර නොමැති කල් පිරෙන තුරු තබා ගන්නා හෝ ලාභ හෝ අලාභ මත සාධාරණ අගයට වූ මූල්‍ය වත්කම්ය.

### 2.2.3 සාධාරණ අගය නිශ්චය කිරීම.

ණය සහ අත්තිකාරම් මෙන්ම වගකීම් වල සාධාරණ අගය තීරණය කිරීමේදී වර්තමාන අගය ආකෘතිය එකඟ වූ මුදල් ප්‍රවාහයන් පදනම් කොට ගෙන ණයෙහි ගුණාත්මකභාවයද , ද්‍රවශීලතාව හා පිරිවැයද සැලකිල්ලට ගෙන නිර්ණය කෙරේ. වෙළෙඳ ලැබිය යුතු හා ගෙවිය යුතු අයිතම වල ආසන්න සාධාරණ අගය ලෙස සැලකෙන්නේ පවත්නා වටිනාකමින් හානිකරණය සඳහා අඩු කළ පසු ඉතිරියයි.

### 2.2.4 ප්‍රති වර්ගීකරණය

ණය හා ලැබිය යුතු දැහැර මූල්‍ය වත්කම් , වෙළඳාම සඳහා අයිතමයන්ගෙන් වෙන් කොට වර්ගීකරණය කිරීමට ඉතා කලාතුරකින් ඇතිවිය හැකි පරිසරයකදී හුදෙකලා සිදුවීමක් ලෙස අවසර දෙනු ලැබේ. ණය සහ ලැබිය යුතු දෑ අතරින් වෙළදාම සදහා වූ දේ ලෙස ප්‍රති වර්ගීකරණය කිරීම සංස්ථාව විසින් ණය සහ ලැබිය යුතු දෑ යන නිර්වචනයට අදාළ වන්නේනම් ප්‍රතිවර්ගීකරණය තොරා ගනු ඇත.

ප්‍රතිවර්ගීකරණය කරනු ලබන්නේ එසේ කරන දිනට ඇති සාධාරණ අගයටයි. සාධාරණ අගය වන්නේ නව පිරිවැය හෝ ක්‍රමක්ෂය පිරිවැය මතය.

### 2.2.5 හානිකරණය

#### (අ) ක්‍රමක්ෂය පිරිවැයට පවත්වාගෙන යන මූල්‍ය වත්කම්

එක් එක් වාර්තාකරණ දිනයේදී මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයක් අගය අඩු වී ඇති බවට වන සාක්ෂි සංස්ථාව විසින් අගය කෙරේ. වත්කමෙහි ආරම්භක හඳුනා ගැනීමෙන් පසු ඇති වූ අවස්ථා එකක හෝ කිහිපයක ප්‍රතිඵලයක් ලෙස ( දරන ලද අලාභ අවස්ථා ) අගය අඩුවීමක පරමාර්ථ සාක්ෂියක් තිබේනම් සහ එම අලාභ අවස්ථාවට මූල්‍ය වත්කම් වල ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ හෝ විශ්වාසවන්ත ලෙස ඇස්තමේන්තුගත කළ හැකි මූල්‍ය වත්කම් කාණ්ඩයක් මත බලපෑමක් ඇත්නම් පමණක් මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයක් අගය අඩු වූ බවට සලකනු ලැබේ. අගය අඩුවන බවට වන සාක්ෂි ලෙස , ණයකරුවෙකු හෝ ණයකරුවන් කාණ්ඩයක් සැලකිය යුතු මූල්‍ය දූෂ්කරතා වලට මුහුණ දෙමින් සිටින බව පෙන්වීම , පොළියෙහි හෝ මුලධන ගෙවීම් වල පැහැර හැරීම් , ඔවුන්

බංකොළොත්භාවයට හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධානයට පත්වීමට ඇති හැකියාව සහ පැහැර හැරීම් සමඟ සහසම්බන්ධිත ආර්ථික තත්ත්ව හෝ හිඟ මුදල් වල වෙනස්වීම් වැනි ඇස්තමේන්තුගත අනාගත මූල්‍ය ප්‍රවාහ වල ඇගයිය හැකි අඩුවීමක් නිරීක්ෂණය කළ හැකි දත්ත මින් පෙන්වීම , ඇතුළත් විය හැකි වේ.

ක්‍රමක්ෂිත පිරිවැයට ගෙන ආ මූල්‍ය වත්කම් සඳහා , තනි තනි වශයෙන් වැදගත් වන මූල්‍ය වත්කම් සඳහා තනි තනි වශයෙන් අගය අඩුවීම්හි පරමාර්ථ සාක්ෂි තිබේදැයි සංස්ථාව විසින් පළමුවෙන් තනි තනි වශයෙන් අගයන අතර , තනි තනි වශයෙන් වැදගත් නොවන මූල්‍ය වත්කම් සඳහා සාමූහිකව අගයයි. වැදගත් වුවත් , නොවුවත් තනි තනි වශයෙන් අගයනු ලැබූ මූල්‍ය වත්කමක අගය අඩුවීම පිළිබඳ පරමාර්ථ සාක්ෂියක් නොමැති බව සමූහය විසින් නිශ්චය කළහොත් එය , එම වත්කම සමාන බැර අවදානම් ලක්ෂණ සහිත වත්කම් කාණ්ඩයක ඇතුළත් කරන අතර ඒවා අගය අඩුවීම සඳහා සාමූහිකව අගයනු ලැබේ.

අගය අඩුවීම සඳහා තනි තනි වශයෙන් අගයනු ලැබූ සහ අගය අඩුවීමක් සහිත හෝ දිගින් දිගටම හඳුනා ගැනීමට නියමිත වත්කම් අගය අඩුවීමෙහි සාමූහික ඇගයීමට ඇතුළත් කරනු නොලැබේ.

ක්‍රමක්ෂිත පිරිවැයට ගෙන ආ වත්කම් මත අගය අඩුවීමේ අලාභ දරා ඇති බවට පරමාර්ථ සාක්ෂියක් ඇති විට , වත්කමෙහි පවතින වටිනාකම සහ මූල්‍ය වත්කමෙහි මුල් ඵලදායි පොළී අනුපාතිකයට වට්ටම්ගත අනාගත මූල්‍ය ප්‍රවාහ වල වර්තමාන වටිනාකම ( නොදරන ලද අනපේක්ෂිත අනාගත ණය අලාභ හැර ) අතර වෙනසින් අලාභයෙහි ප්‍රමාණය අගයනු ලැබේ. ණයක් සඳහා වෙනස් වන පොළී අනුපාතියක් පවතී නම් . යම් අගය අඩුවීමේ අලාභයක් ඇගයීම සඳහා වට්ටම්ගත අනුපාතය වන්නේ වර්තමාන ඵලදායි පොලී අනුපාතයයි. වත්කමෙහි පවතින වටිනාකම දීමනා ගිණුමක් භාවිතා කිරීම හරහා අඩු වන අතර , හානිවන ප්‍රමාණය ආදායම් ප්‍රකාශනයෙහි හඳුනා ගනු ලැබේ. පොලී ආදායම . අඩු වූ පවතින වටිනාකම මත එක්රැස් වීම පවත්වා ගෙන යනු ලබන අතර එය අගය අඩු වීමේ අලාභ ඇගයීමේ කාර්යය සඳහා අනාගත මුදල් ප්‍රවාහ වට්ටම්ගත කළ පොලී අනුපාතය භාවිතා කරමින් එක් රැස් කරනු ලැබේ. ආදායම් ප්‍රකාශනයෙහි ආයෝජන ආදායම් වල කොටසක් ලෙස පොලී ආදායම වාර්තා කරනු ලැබේ. අනාගත අය කර ගැනීමෙහි තාත්වික අපේක්ෂාවන්ක නොමැති විට ආශ්‍රිත දීමනා සමඟින් ණය කපා හරිනු ලබන අතර , සියලු සුරැකුම් සමූහයට උපලබ්ධි කර හෝ පවරාගෙන ඇත. ආසන්න වර්ෂයකදී අගය අඩුවීම හඳුනා ගැනීමෙන් පසු යම් හේතුවක් නිසා ඇස්තමේන්තුගත අගය අඩුවීමේ අලාභය වැඩි වේ නම් හෝ අඩු වෙනම් දීමනා ප්‍රමාණය

සීරුමාරු කර පෙර හඳුනා ගනු ලැබූ අගය අඩුවීමේ අලාභය වැඩි හෝ අඩු කරනු ලැබේ. අනාගත කපා හැරීමක් පසුව අය කර ගතහොත් එම අය කිරීම ආදායම් ප්‍රකාශනයෙහි දීමනා (Allowance) ගිණුමට ගලපනු ලැබේ.

**(ආ) අනෙකුත් මූල්‍යමය නොවන වත්කම් හානිකරණය**

**ව**ත්කමක පවත්නා අගය අය කර ගත නොහැකි බව පෙනෙන පරිසරයකදී හානිකරණය සඳහා විමසා බැලීමට යටත් වේ. පවතින වටිනාකම එහි ඇස්තමේන්තුගත අය කර ගත හැකි වටිනාකම ඉක්මවා යන්නේනම් අගය අඩුවීමක අලාභයක් හඳුනා ගනු ලැබේ. වත්කමක අය කර ගත හැකි වටිනාකම වන්නේ එහි භාවිතා කරනු ලබන වටිනාකම සහ එහි සාධාරණ වටිනාකමින් විකුණුම් පිරිවැය අඩු කළ විට ලැබෙන වටිනාකම යන ඒවායින් ඉහළ අගය වේ.

**2.2.6 හඳුනා ගැනීම අත් හැරීම.**

මූල්‍ය වත්කමක් ( හෝ කොටසක් හෝ සමූහයක කොටසක් ඇතුලුව ) හඳුනා ගැනීම අත් හරින අවස්ථා මෙසේය.

- මූල්‍ය ප්‍රවාහයන් ලැබීමේ අයිතිය ඉකුත් වීම.
- සංස්ථාව විසින් වත්කම මඟින් මුදල් ප්‍රවාහයන් ලැබීමේ අයිතිය පැවරීම හෝ ලැබුණු මුදල් ප්‍රවාහයන් තුන්වන පාර්ශවයකට පවරා දිය යුතු යැයි උපකල්පනය කිරීම.

(අ) සංස්ථාව විසින් සියලු ප්‍රතිලාභ හා අවදානම් පවරා දීම.
(ආ) සංස්ථාව විසින් සියලු ප්‍රතිලාභ හා අවදානම් පවරා දීමක් හෝ රඳවා ගැනීමක් නොකොට පාලන අයිතිය පැවරීම.

**2.2.7** නීතිමය අයිතියක් ඇති අවස්ථා වල මූල්‍ය වත්කම් හා වගකීම් සමාහරණය කොට ශුද්ධ අගය දක්වා ඇත.

## 2.3. දේපළ , යන්ත්‍ර හා උපකරණ

### 2.3.1 හඳුනා ගැනීම හා මැනීම.

දේපළ , යන්ත්‍ර හා උපකරණ අයිතමයන් ඒවායේ සමුච්චිත ක්ෂය සහ හානිකරණ අලාභ අඩු කිරීමෙන් පසු පිරිවැයට හෝ තක්සේරු අගයට පෙන්වා ඇත. පිරිවැය තුළ වත්කම අත් කර ගැනීමේදී දැරූ වියදම් වලින් සෘජුවම අදාල වන වියදම් ඇතුලත් වේ. ස්වයං නිර්මිත වත්කම් වල එම වත්කම් භාවිත තත්ත්වයට ගෙන ඒම සඳහා දැරූ ද්‍රව්‍යය පිරිවැය , සෘජු ශ්‍රමය , සෘජුවම බලපාන වෙනත් අදාල වියදම් ඇතුළත් වේ. අළුත්වැඩියා හා ඉදිරි අපේක්ෂිත ආර්ථික ප්‍රතිලාභ වෙනුවෙන් දරන ලද වියදම් ඒවා දරන අවස්ථාවේ වියදම් ලෙස හඳුනාගෙන ඇත.

### 2.3.2 පසුකාලීන පිරිවැය

උපාංග ප්‍රතිපූර්ණය සඳහා දරන ලද වියදම වෙන් වෙන්ව එනම් පුළුල් පරීක්ෂාවන් හා පූර්ණ අළුත්වැඩියා වියදම් ප්‍රාග්ධනගත කෙරෙන්නේ ඒවායේ ආර්ථික ප්‍රතිලාභ ලැබීමට හේතු වන්නේනම් හා එම ප්‍රතිලාභ විශ්වාසදායකව මැනිය හැකි නම්ය. දෛනික සේවා කිරීම් ඒවා දරන අවස්ථාවේදී ආදායම් ප්‍රකාශයෙහි හඳුනා ගනු ලැබේ.

### 2.3.3 ක්ෂය වීම්

ක්ෂය සඳහා වෙන් කිරීම හීනවන ශේෂ ක්‍රමය අනුව පිරිවැය / තක්සේරු අගය මත ගණනය කෙරේ. ඉඩම් හැර දේපළ , යන්ත්‍ර හා උපකරණ පහත දැක්වෙන ප්‍රතිශත නඅවු ප්‍රයෝජනවත් ආයු කාලය තුළදී ශේෂය ගණනය කෙරේ.

| | | | |
|---|---|---|---|
| ගොඩනැගිලි | - | ප්‍රධාන කාර්යාලය | 2.5% |
| | - | ශ්‍රවණාගාරය | 5% |
| චිත්‍රපට සංකීර්ණය | - | ගොඩනැගිලි | 5% |
| | - | අනෙකුත් යන්ත්‍ර සූත්‍ර | 10% |
| ලී බඩු සවි කිරීම් | | | 25% |
| මෝටර් රථ | | | 25% |
| චිත්‍රපට සංරක්ෂණාගාරය | | | 10% |
| සංස්කෘතික / අධ්‍යාපනික / චිත්‍රපට උපකරණ | | | 10% |
| චිත්‍රපට උපකරණ | | | 10% |
| සුභසාධන උපකරණ | | | 10% |

දේපළ පිරියත හා උපකරණ මිළදී ගත් දිනෙන් ආරම්භව ක්ෂය කරනු ලැබේ.

**නොනිමි ප්‍රාග්ධන කාර්යයන්** - ඉදි කරමින් පවතින චිත්‍රාගාර ගොඩනැගිල්ල සහ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල නොනිමි ප්‍රාග්ධන ගොඩනැගිලි වශයෙන් පෙන්නුම් කර ඇත.

### 2.3.4 හඳුනා ගැනීම ඉවත් කිරීම.

දේපළ , පිරියත සහ උපකරණ අයිතමයක පවතින වටිනාකම අපහරණයකදී හෝ ඒවායින් අනාගත ප්‍රතිලාභ අපේක්ෂා නොකරන විට හඳුනා ගැනීම නතර වේ. දේපළ , පිරියත හා උපකරණ අයිතමයක් හඳුනා නොගැනීමෙන් ඇතිවන ලාභය හෝ අලාභය අයිතමය හඳුනා නොගන්නා විට අදායම් ප්‍රකාශනයෙහි ඇතුලත් කරනු ලැබේ.

### 2.3.5 ස්පෘශ්‍ය වත්කම් හානිකරණය

මූල්‍ය නොවන වත්කම් වල අගය අඩුවීමක කිසියම් ඇඟවීමක් තිබේදැයි නිශ්චය කිරීම සඳහා විලම්භිත බඳු වත්කම් හාර සමූහයෙහි මූල්‍යමය නොවන වත්කම් වල පවතින වටිනාකම් ඒ ඒ වාර්තාකරණ දිනට සමාලෝචනය කරනු ලැබේ. එවැනි තත්ත්වයක් ඇත්නම් , එවිට වත්කමෙහි අය කර ගත හැකි වටිනාකම ඇස්තමේන්තු කරනු ලැබේ. අවිනිශ්චිත ඵලදායි ආයු කාලයක් සහිත හෝ මේ වන තෙක් භාවිතය සඳහා නොපවතින අස්පෘශ්‍ය වත්කම් සඳහා අය කර ගත හැකි වටිනාකම එක් එක් වර්ෂයේදී එම අවස්ථාවේදීම ඇස්තමේන්තු කරනු ලැබේ. වත්කමක හෝ මූල්‍ය උත්පාදක ඒකකයක පවතින වටිනාකම එහි ඇස්තමේන්තුගත අය කර ගත හැකි වටිනාකම ඉක්මවා යන්නේනම් අගය අඩුවීමක අලාභයක් හඳුනා ගනු ලැබේ. වත්කමක හෝ මූල්‍ය උත්පාදක ඒකකයක අය කර ගත හැකි වටිනාකම වන්නේ එහි භාවිතා කරනු ලබන වටිනාකම සහ එහි සාධාරණ වටිනාකමින් විකුණුම් පිරිවැය අඩු කළ විට ලැබෙන වටිනාකම යන ඒවායින් ඉහළ අගය වේ. භාවිතයේ ඇති වටිනාකම (Value in use ) ඇගයීමේදී , මුදලෙහි කාලීන අගයෙහි වර්තමාන වෙළෙඳපොල ඇගයීම පිළිබිඹු කරනු ලබන බදු පෙර වට්ටම් අනුපාතයක් සහ වත්කමට හෝ මූල්‍ය උත්පාදක ඒකකයට විශේෂිත අවදානම් භාවිතා කරමින් ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ ඒවායේ වර්තමාන වටිනාකමට වට්ටම් කරනු ලැබේ.

අගය අඩුවීම පරීක්ෂා කිරීමේ අරමුණ සඳහා තනි තනිව පරීක්ෂා කළ නොහැකි වත්කම් වෙනත් වත්කම් වලින් මුදල් ගැලීමෙන් විශාල වශයෙන් නිදහස් වන නොකඩවා පාවිච්චියෙන්

මුදල් ගැලීම උත්පාදනය කරනු ලබන කුඩාම වත්කම් කාණ්ඩයකට කාණ්ඩගත කරනු ලැබේ. අගය අඩුවීමේ අලාභ ආදායම් ප්‍රකාශනයෙහි හඳුනා ගනු ලැබේ.

### 2.4 <u>තොග</u>

සියළු තොග පිරිවැය හෝ ශුද්ධ ප්‍රත්‍යාගණන අගය යන දෙකින් අවමයට අගය කෙරේ. පිරිවැය පළමු ඇතුළු - පළමු පිට (FIFO) ක්‍රමය පදනම් කොටගෙන තීරණය කෙරේ.

### 2.5 <u>ආදායම් බදු</u>

සංස්ථා සේවකයන්ගේ පඩි හා අනෙකුත් දීමනාද , වියදම් වලින් කොටසක් පියවීම සඳහාද , භාණ්ඩාගාරයෙන් මුදල් ලබා දෙනු ලැබේ. භාණ්ඩාගාරයෙන් ලැබෙන මුදල් සඳහා බදු නොගෙවිය යුතුය යන පදනම මත බදු ගෙවීම සඳහා වෙන් කිරීමක් කර නොමැත.

සංස්ථාව විසින් වාර්ෂිකව ලැබූ ලාභය ආදායම් බදු ගෙවීමෙන් පසු ඇති වූ අතිරික්තයෙන් 25% ක ප්‍රමාණයක් ලාභය වෙනුවෙන් බදු ගෙවිය යුතුය යන්න අපගේ මතය වන අතර , එම ප්‍රමාණය විය යුත්තේ ආදායම් බදු සඳහා සිදු කළ ගැලපුම් කටයුතු වලින් පසු ඉතිරි ශුද්ධ ලාභය යන්න අපගේ විශ්වාසයයි.

### 2.6 <u>අනෙකුත් වත්කම්</u>

අනෙකුත් වත්කම් වල අනෙකුත් ණයගැතියන් සහ ලැබිය යුතු දෑ , අත්තිකාරම් , තැන්පතු , කලින් ගෙවීම් , ලැබිය යුතු බදු ඇතුළත් වේ.

### (අ) <u>අත්තිකාරම් , තැන්පතු , කලින් ගෙවූ වියදම්</u>

එක් මුදල් වර්ෂයකට වඩා වැඩි කාලයක් සඳහා ප්‍රතිලාභ ලැබෙතැයි පෙනෙන යම් සබඳතාවයක් ඇති වියදම් අත්තිකාරම් , තැන්පතු හා කලින් ගෙවූ වියදම් ලෙස වර්ගීකරණය කරන ලදී. එවැනි වියදම් කාල පදනම මත අදාළ කාල පරිච්ඡේදය තුළ කපා හරිනු ලැබේ.

### (ආ) <u>අනෙකුත් ණයගැතියෝ</u>

අනෙකුත් ණයගැතියන් පිරිවැයෙන් හානිකරණය අඩු කළ වටිනාකමට හඳුනාගෙන ඇත.

## 2.7 මුදල් සහ මුදල් හා සමාන දෑ

ඒවායේ සාධාරණ අගයෙහි වෙනස්වීමට නොසැලකිය යුතු තරමේ අවදානමකට භාජනය වන අත්පත් කර ගත් දින සිට මාස 03 ක් කල් පිරුණු හෝ ඊට අඩු කල් පිරීමක් සහිත සහ සමූහය විසින් එහි කෙටිකාලීන වගකීම් කළමනාකරණය සඳහා යොදා ගන්නා මුදල් ශේෂ සහ ඉල්ලුම් තැන්පතු වලින් මුදල් සහ මුදල් හා සමාන දෑ සමන්විත වේ.

## 2.8 මූල්‍ය වගකීම්

### 2.8.1 ආරම්භක හඳුනා ගැනීම හා මැනීම.

LKAS 39 අනුව මූල්‍ය වගකීම් වර්ග කොට ඇත්තේ , උචිත පරිදි ලාභය හෝ අලාභය මගින් සාධාරණ අගයට මනින ලද මූල්‍ය වගකීම් හෝ ණය හෝ ණයට ගැනීම්ය. සංස්ථාව එහි මූල්‍ය වගකීම් ආරම්භක හඳුනා ගැනීම අනුව වර්ගීකරණය නිශ්චය කර ඇත. සියළු මූල්‍ය වගකීම් මුලින්ම සාධාරණ අගයට හඳුනා ගන්නා අතර , ණය හා ණය ගැනුම් සම්බන්ධයෙන් ක්‍රමක්ෂය ක්‍රමය භාවිතා කරයි. මෙහි සෘජුවම අදාළ වන ගනුදෙනු පිරිවැය ඇතුළත්ය.

සංස්ථාවේ මූල්‍ය වගකීම් වල වෙළෙඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ ඇතුලත්ය.

### 2.8.2 පසුකාලීන මිනුම්

මූල්‍ය වගකීම් මිනුම පහත දැක්වෙන පරිදි ඒවායේ වර්ගීකරණය මත පදනම් වේ.

### 2.8.3 ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගය මත මූල්‍ය වගකීම්

ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගය මත මූල්‍ය වගකීම් වල වෙළදාම සඳහා වූ මූල්‍ය වගකීම් සහ ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගය මත මූල්‍ය වගකීම් මත නම් කරන ලද ඒවා ඇතුළත් වේ. මූල්‍ය වගකීම් , වෙළදාම සඳහා පවත්නා දේ ලෙස වර්ගීකරණය කරනු ලබන්නේ ඒවා නුදුරේදී විකිණීමේ අරමුණ ඇත්නම්ය. වෙළදාම සඳහා වගකීම් මත ලැබීම් හෝ පාඩු ආදායම් ප්‍රකාශනයෙහි හඳුනා ගනු ලැබේ. සංස්ථාව කිසිදු මූල්‍ය වගකීමක් ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට මුලික හඳුනා ගැනීම නම් කර නැත.

## 2.9 අනෙකුත් මූල්‍ය වගකීම්

ණය සහ ණය ගැනුම් ආරම්භක හඳුනා ගැනීමෙන් පසු අනෙකුත් මූල්‍ය වගකීම් සම්බන්ධයෙන් ක්‍රමාක්ෂය ක්‍රමය භාවිතා කරයි.

## 2.10 අනෙකුත් වගකීම්

අනෙකුත් වගකීම් වල උපචිත වියදම් ද ඇතුලත්ය. මේවා ඒවායේ සාධාරණ අගය ලෙස සැලකෙන ඓතිහාසික වටිනාකමට දක්වා ඇත.

## 2.11 රජයේ ප්‍රදාන

වත්කම් වලට අදාළ රජයේ ප්‍රදාන මේවා ශේෂ පත්‍රයේ විලම්භනය කර අදාළ වත්කමේ ආයු කාලය පුරා ආදායම් ප්‍රකාශනයට හඳුනා ගනු ලබන අතර , වියදම් පියවීම සඳහා ලැබෙන්නා වූ ලැබීම් , ලැබීම් පදනම මත ගිණුම්ගත කෙරේ.

## 2.12 සේවක ප්‍රතිලාභ

### නිර්ණය කළ දායක සැලැස්ම

අදාළ ව්‍යවස්ථා හා රෙගුලාසි ප්‍රකාර , සේවක අර්ථසාධක අරමුදල් හා සේවා භාර අරමුදල් දායකත්වය සඳහා සේවකයෝ හිමිකම් ලබති. සංස්ථාව විසින් සේවකයන්ගේ දළ පාරිශ්‍රමිකය මත ස්ථාවර දායකයක් මෙකී අරමුදල් වලට ගෙවන අතර , ඉන් අමතරව නීතිමය හෝ හෝ අර්ථකාරී බැඳීමක් සංස්ථාව කෙරෙහි නොමැත.

### නිර්ණය කළ ප්‍රතිලාභ සැලසුම්

නිශ්චිත ප්‍රතිලාභ සැලසුමක් යනු නිශ්චිත දායකත්ව සැලසුමකට වෙනස් වූ පශ්චාත් සේවා නියුක්ත ප්‍රතිලාභ සැලසුමක් වේ. මේ සම්බන්ධව 1983 අංක. 12 දරන පාරිතෝෂික පනත යටතේ සංස්ථාව බැදී සිටී.

## 2.13 <u>ආදායම</u>

### 2.13.1 <u>නිෂ්පාදක ණය පොලිය හා අධි භාරය</u>

නිෂ්පාදකයින් වෙත ලබා දී ඇති ණය මුදල් සඳහා පොළිය ගිණුම්ගත කර ඇත්තේ අදාළ චිත්‍රපට ප්‍රදර්ශනය වී අවුරුද්දක් ගත වන තෙක් පමණි. යම් අවස්ථාවක ණය මුදල් සම්පූර්ණ අය වන්නේනම් අදාල පොලියද ගණනය කර අය කිරීමට කටයුතු කරනු ලැබේ.

සිනමාශාලා වලින් අය වීමට ඇති මුදල් සඳහා ගැසට් නිවේදනයේ පරිදි අධිභාරය ගණනය කර ගිණුම්ගත කර තිබේ.

### 2.13.2 <u>ප්‍රදර්ශනය සඳහා මුදා හැර ඇති චිත්‍රපට</u>

චිත්‍රපට ප්‍රදර්ශනය කිරීමේදී ආදායම නොලැබීම මත ණය මුදල් අය නොවීමේ තත්ත්වයක් තුළ චිත්‍රපට මුදා හැර මාස 06 කට පසු පොළිය ගිණුම්ගත කරනු නොලැබේ.

### 2.13.3 <u>ප්‍රදර්ශනය නොවූ චිත්‍රපට</u>

**(අ)** චිත්‍රපට නිෂ්පාදනය සඳහා ණය ලබා දී ඇති එහෙත් පසුගිය වර්ෂ දෙකක සේවාවන් ලබාගෙන නොමැති චිත්‍රපට වලට පොළිය ගිණුම්ගත කර නොමැත.

**(ආ)** චිත්‍රාගාර සේවා ලබා දීමේදී දීර්ඝ කාලයක් තුළ සේවාවන් ලබා නොගෙන නිෂ්පාදන කටයුතු නවතා ඇති චිත්‍රපට සඳහා පොළිය ගිණුම්ගත කොට නොමැත.

ඉහත සඳහන් කරුණු 02 යටතේ වර්ෂයේ පොළිය ගණනය නොකලද , යම් අවස්ථාවක මෙම ණය මුදල් අය කර ගැනීමේදී පොළිය අය කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

### 2.13.4 <u>සිනමාහල් අධිභාර</u>

සිනමාශාලා වලින් ලැබිය යුතු චිත්‍රපට කුළිය සඳහා අයවිය යුතු අධිභාර මුදලින් 100% ක් නොලැබේය යන පදනම මත 25% ක් පමණක් ආදායමට ගෙන තිබේ.

## ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
## 2013.12.31 දිනට අවසන් වර්ෂයේ
## ආදායම් ප්‍රකාශණ සඳහා සටහන්

| | | 2013 | 2012 |
|---|---|---|---|
| **(03) විකුණුම්** | | රු. | රු. |
| එළිය කැවූ චිත්‍රපට | **3.1** | 35,278,807 | 37,648,738 |
| ප්‍රදර්ශණ | **3.2** | 300,308 | 809,832 |
| චිත්‍රාගාරය | **3.3** | 2,269,993 | 3,851,249 |
| වෙළඳ කටයුතු | **3.4** | 3,726,593 | 4,122,193 |
| | | 41,575,701 | 46,432,012 |

| | 2013 | 2012 |
|---|---|---|
| **3.1 එළිය කැවූ චිත්‍රපට** | | |
| දේශීය චිත්‍රපට කුළිය | 10,309 | - |
| පෙරදිග චිත්‍රපට කුළිය | 19,766 | - |
| *බෙදා හැරීමේ කොමිස්* | | |
| දේශීය | 13,496,493 | 16,766,466 |
| විදේශීය | 9,643,952 | 9,496,127 |
| වැඩිවීම | 6,620,181 | 7,267,076 |
| සේවාවන් සඳහා කොමිස් | 105,178 | 223,755 |
| අධිභාරය | 3,625,698 | 3,412,270 |
| පරීක්ෂණ දඩ මුදල් | 1,757,230 | 483,044 |
| | 35,278,807 | 37,648,738 |
| **3.2 ප්‍රදර්ශණ** | | |
| සිනේ ඇඩ්ස් | 300,308 | 809,832 |
| | 300,308 | 809,832 |

| **3.3 චිත්‍රාගාරය** | චිත්‍රපට ප්‍රමාණය | | චිත්‍රපට ප්‍රමාණය | |
|---|---|---|---|---|
| ශබ්ද | 26 | 1,703,062 | 45 | 2,214,093 |
| සංස්කරණය | 12 | 562,349 | 36 | 1,593,454 |
| රසායනාගාරය ( කළු - සුදු ) | 2 | 4,582 | 14 | 43,702 |
| | | 2,269,993 | | 3,851,249 |

| **3.4 වෙළඳ කටයුතු** | ප්‍රමාණය | | ප්‍රමාණය | |
|---|---|---|---|---|
| සිනමා කාබන් | 39,250 | 1,764,268 | 82,600 | 2,434,082 |
| අමතර කොටස් | - | 40,073 | | 127,973 |
| ලිපි ද්‍රව්‍යය | - | 1,592,257 | | 1,497,874 |
| අභ්‍යන්තර භාවිතය සඳහා විකුණුම් | | | | |
| අමතර කොටස් - | | 316,045 | | 4,744 |
| ලිපි ද්‍රව්‍යය පිරිවැය | | 13,950 | | 57,520 |
| | | 3,726,593 | | 4,122,193 |

## ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
## 2013.12.31 දිනට අවසන් වර්ෂයේ
## ආදායම් ප්‍රකාශණ සඳහා සටහන්

**(04) විකුණුම් පිරිවැය**

| | ප්‍රදර්ශණ | චිත්‍රාගාරය | පොදු පරිපාලන වියදම් | 2013 එකතුව | 2012 එකතුව |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| තොගය 2013.01.01 | 5,253,887 | 2,719,393 | 20,315,073 | 28,288,353 | 12,127,844 |
| එකතු කළා : | | | | | |
| මිලදී ගැනීම් හා මාරු කිරීම් | - | 11,700 | 1,131,857 | 1,143,557 | 7,960,043 |
| | 5,253,887 | 2,731,093 | 21,446,930 | 29,431,910 | 20,087,887 |
| අඩු කළා : | | | | | |
| තොග පාඩුවීම් | - | 863 | - | 863 | 85,120 |
| මාරු කිරීම් | - | - | - | - | - |
| 2013.12.31 අවසන් තොගය | - | 1,835,218 | 16,769,842 | 23,858,947 | 16,741,621 |
| | - | 895,012 | 4,677,088 | **5,572,100** | **3,261,145** |

දීර්ඝ සටහන් සඳහා ( 4- ඒ ) , ( 4-බී) සහ ( 4- සී ) සටහන් බලන්න.

## ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
## 2013.12.31 දිනට අවසන් වර්ෂයේ
## ආදායම් ප්‍රකාශණ සඳහා සටහන්

**(04 - A)** විකුණුම් පිරිවැය

| | තොගය 2013.01.01 | මිලදී ගැනීම් | එකතුව | තොගය 2013.12.31 | ක්ෂයවීම් | ප්‍රචාරණය | මුළු පිරිවැය | වැඩිවීම | බෙදාහැරීමේ ලැබීම් | මුළු ලැබීම් | ලාභය / අලාභය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **එළිය කැවූ චිත්‍රපට** | | | | | | | | | | | |
| දේශීය | 3 | - | 3 | 3 | - | - | - | 1,085 | 9,224 | 10,309 | 10,309 |
| බටහිර | 244 | - | 244 | 244 | - | - | - | - | - | - | - |
| පෙරදිග | 471 | - | 471 | 471 | - | - | - | 1,587 | 18,179 | 19,766 | 19,766 |
| | 718 | - | 718 | 718 | - | - | - | 2,672 | 27,403 | 30,075 | 30,075 |
| **මුදා නොහල චිත්‍රපට** | | | | | | | | | | | |
| දේශීය | 3,043,931 | - | 3,043,931 | 3,043,931 | - | - | - | - | - | - | - |
| බටහිර | 982,492 | - | 982,492 | 982,492 | - | - | - | - | - | - | - |
| පෙරදිග | 8 | - | 8 | 8 | - | - | - | - | - | - | - |
| එකතුව | 4,026,431 | - | 4,026,431 | 4,026,431 | - | - | - | - | - | - | - |
| | 4,027,149 | - | 4,027,149 | 4,027,149 | - | - | - | 2,672 | 27,403 | 30,075 | 30,075 |

| | | | 2013 | | 2012 |
|---|---|---|---|---|---|
| | | | රු. | | රු. |
| **තොගය 2013.01.01** | | | 4,027,149 | | 4,027,149 |
| එකතු කළා : | මිලදී ගැනීම් | | - | - | - |
| | ප්‍රචාරණය | | - | - | - |
| | | | 4,027,149 | | 4,027,149 |
| අඩු කළා : | තොගය | | | | |
| | 2013.12.31 | | 4,027,149 | | 4,027,149 |
| | පිරිවැය | | - | | - |
| එකතු කළා: | අනෙකුත් චිත්‍රපට | | | | |
| **තොගය 2013.01.01** | | | | | |
| I. ප්‍රතිශත පදනම මත | | 259,890 | | 259,890 | |
| II. සිනේ සිත්තම් | | 966,848 | 1,226,738 | 966,848 | 1,226,738 |
| එකතු කළා : | වියදම් | | - | | - |
| | | | 1,226,738 | | 1,226,738 |
| අඩු කළා : | | | | | |
| | මාරු කිරීම් | | | | |
| **තොගය 2013.12.31** | | | | | |
| I. ප්‍රතිශත පදනම මත | | 259,890 | - | 259,890 | - |
| II. සිනේ සිත්තම් | | 966,848 | 1,226,738 | 966,848 | 1,226,738 |
| **මුළු පිරිවැය** | | | - | | - |

## ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
## 2013.12.31 දිනට අවසන් වර්ෂයේ
## ආදායම් ප්‍රකාශණ සඳහා සටහන්

**(04 - B)** විකුණුම් පිරිවැය

| | දළ සේයාපට | සිනමා කාබන් | අමතර කොටස් | රසායන ද්‍රව්‍යය | ලිපි ද්‍රව්‍යය | එකතුව 2013 | එකතුව 2012 |
|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| ආරම්භක තොගය 2013.01.01 | 287,951 | 5,790,357 | 11,518,686 | - | 2,718,080 | 20,315,073 | 5,092,660 |
| එකතු කළා : | | | | | | | |
| මිලදී ගැනීම් | - | - | - | - | 1,131,857 | 1,131,857 | 7,916,119 |
| | 287,951 | 5,790,357 | 11,518,686 | - | 3,849,937 | 21,446,930 | 13,008,779 |
| අඩු කළා : | | | | | | | |
| තොග හානිවීම | - | - | - | - | - | - | 79,556 |
| 2013.12.31 අවසන් තොගය | 287,951 | 2,811,898 | 11,460,514 | - | 2,209,479 | 16,769,842 | 9,708,416 |
| | - | 2,978,458 | 58,172 | - | 1,640,458 | 4,677,088 | 3,220,807 |

## ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
## 2013.12.31 දිනට අවසන් වර්ෂයේ
## ආදායම් ප්‍රකාශණ සඳහා සටහන්

**(04 - C)** විකුණුම් පිරිවැය

| | දළ සේයාපට | සිනමා කාබන් | අමතර කොටස් | රසායන ද්‍රව්‍යය | එකතුව 2013 | එකතුව 2012 |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| ආරම්භක තොගය 2013.01.01 | 816,569 | - | 1,849,014 | 53,810 | 2,719,393 | 1,781,297 |
| මිලදී ගැනීම් | - | - | - | 11,700 | 11,700 | 43,925 |
| | 816,569 | - | 1,849,014 | 65,510 | 2,731,093 | 1,825,222 |
| අඩු කළා : | | | | | | |
| තොග හානිවීම | - | - | - | 863 | 863 | 5,564 |
| මාරු කිරීම් | - | - | - | - | - | - |
| 2013.12.31 අවසන් තොගය | 816,569 | - | 964,559 | 54,090 | 1,835,218 | 1,779,319 |
| වර්ෂය තුළ අභ්‍යන්තර පාවිච්චිය | - | - | 884,455 | 10,557 | 895,012 | 40,339 |

## ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
## 2013.12.31 දිනට අවසන් වර්ෂයේ
## ආදායම් ප්‍රකාශණ සඳහා සටහන්

සටහන : 05

| | ප්‍රදර්ශණ | චිත්‍රාගාරය | නිෂ්පාදන | පොදු පරිපාලන වියදම් | එකතුව 2013 | එකතුව 2012 |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **සේවක පාරිශ්‍රමිකය** | | | | | | |
| වැටුප් හා වේතන | 6,158,030 | 4,277,410 | 1,681,897 | 19,573,249 | 31,690,586 | 35,607,634 |
| අතිකාල , නිවාඩු පඩි හා වන්දි | 996,734 | 1,237,891 | 58,789 | 1,807,586 | 4,101,000 | 4,486,100 |
| සේවක අර්ථසාධක හා භාරකාර අරමුදලට දායක මුදල් | 921,644 | 644,026 | 252,478 | 2,731,166 | 4,549,314 | 5,098,062 |
| වෙනත් දීමනා | 4,025,978 | 2,952,190 | 970,717 | 11,425,119 | 19,374,004 | 18,840,021 |
| | **12,102,386** | **9,111,517** | **2,963,881** | **35,537,120** | **59,714,904** | **64,031,817** |

සටහන : 06

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **ගමන් හා යැපීම් දීමනා** | | | | | | |
| ගමන් වියදම් ( දේශීය ) | 759 | 2,466 | - | 79,002 | 82,227 | 80,527 |
| ( විදේශීය ) | - | - | - | 161,001 | 161,001 | 224,726 |
| යැපීම් දීමනා | 2,625 | 15,775 | - | 302,024 | 320,424 | 405,213 |
| | **3,384** | **18,241** | **-** | **542,027** | **563,652** | **710,466** |

## ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
## 2013.12.31 දිනට අවසන් වර්ෂයේ
## ආදායම් ප්‍රකාශණ සඳහා සටහන්

සටහන : 07

| | ප්‍රදර්ශණ | චිත්‍රාගාරය | නිෂ්පාදන | පොදු පරිපාලන වියදම් | එකතුව 2013 | එකතුව 2012 |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **සැපයුම් හා උපකරණ** | | | | | | |
| ලිපි ද්‍රව්‍යය හා කාර්යාලීය උපකරණ | 2,005 | 22,490 | 10,115 | 1,692,597 | 1,727,207 | 649,240 |
| විදුලිය | - | 1,815,297 | - | 3,642,760 | 5,458,057 | 5,967,025 |
| සංග්‍රහ වියදම් | - | 3,250 | 3,485 | 197,811 | 204,546 | 298,521 |
| යාන්ත්‍රික හා විදුලි උපකරණ | - | - | - | 410,812 | 410,812 | 76,642 |
| | 2,005 | 1,841,037 | 13,600 | 5,943,980 | 7,800,622 | 6,991,428 |

සටහන : 08

**අළුත්වැඩියා කිරීම් , නඩත්තු හා ක්ෂයවීම්**

| | ප්‍රදර්ශණ | චිත්‍රාගාරය | නිෂ්පාදන | පොදු පරිපාලන වියදම් | එකතුව 2013 | එකතුව 2012 |
|---|---|---|---|---|---|---|
| ඉන්ධන හා ලිහිසි තෙල් | - | 237,694 | - | 4,425,816 | 4,663,510 | 4,000,808 |
| නඩත්තු | 112,502 | 129,209 | 33,000 | 4,216,882 | 4,491,593 | 3,391,248 |
| ක්ෂයවීම් | - | 5,662,240 | - | 12,117,778 | 17,780,018 | 17,648,516 |
| | 112,502 | 6,029,143 | 33,000 | 20,760,476 | 26,935,121 | 25,040,572 |

## ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
## 2013.12.31 දිනට අවසන් වර්ෂයේ
## ආදායම් ප්‍රකාශණ සඳහා සටහන්

**සටහන : 09**

| | ප්‍රදර්ශණ | චිත්‍රාගාරය | නිෂ්පාදන | පොදු පරිපාලන වියදම් | එකතුව 2013 | එකතුව 2012 |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| ප්‍රවාහන , සම්බන්ධතා , අවශ්‍යතා හා වෙනත් සේවාවන් | | | | | | |
| ප්‍රවාහනය | 110,404 | - | - | 160,150 | 270,554 | 143,721 |
| සම්බන්ධතා | 221,899 | 171,648 | 115,288 | 1,087,213 | 1,596,048 | 1,741,610 |
| අවශ්‍යතා | 36,969 | 529,881 | 35,108 | 3,710,117 | 4,312,076 | 4,410,658 |
| බදු කුලී | - | - | - | - | - | - |
| වරිපනම් බදු | - | 162,469 | - | 641,770 | 804,239 | 731,678 |
| වෙනත් සේවා | 565,609 | 850,974 | 1,517,613 | 7,164,366 | 10,098,562 | 8,020,660 |
| ස්ථාවර වත්කම් ඉවත් කිරීම | - | - | - | - | - | 178,500 |
| කපා හැරීම් -තැන්පතු සහ අනෙකුත් ලැබීම් | - | - | - | 133,840 | 133,840 | - |
| සේවක ණය පොලී පිරිවැය | - | - | - | 1,294,968 | 1,294,968 | 1,548,664 |
| (-) සේවක ණය පොලී ආදායම | - | - | - | (1,294,968) | (1,294,968) | (1,548,664) |
| නිෂ්පාදන ණය පොලී කපා හැරීම් | - | - | - | 68,608 | 68,608 | - |
| | 934,881 | 1,714,972 | 1,668,009 | 12,966,065 | 17,283,927 | 15,226,827 |

**ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව**

**2013.12.31 දිනට අවසන් වර්ෂයේ**

**ආදායම් ප්‍රකාශණ සඳහා සටහන්**

**සටහන : 10**

**වෙනත් ආදායම්**

| | 2013 | 2012 |
|---|---|---|
| | රු. | රු. |
| නිෂ්පාදන ණය පොලී | 4,007,480 | 1,653,327 |
| සේවක ණය පොලී | 466,189 | 516,221 |
| විවිධ ආදායම් | 1,934,157 | 3,288,601 |
| පිටස්තර රූගත කිරීම් | 2,504,728 | 2,249,075 |
| සංස්ථාවට අයත් නොවන චිත්‍රපට අළුත්වැඩියා කිරීම් සඳහා | 2,428,726 | 2,031,199 |
| ස්ථාවර හා භාණ්ඩාගාර බිල්පත් පොලී | 11,787,366 | 9,923,925 |
| අයදුම්පත් ගාස්තු | 263,328 | 436,000 |
| එන්. එෆ්. සී. සිනමාහලේ ආදායම | 2,178,450 | 2,333,050 |
| රක්ෂණ සංස්ථාවෙන් වන්දි ලැබීම් | 34,050 | 15,100 |
| චිත්‍රපට නැරඹීම සඳහා ලැබීම් | 7,000 | 32,000 |
| තිරනාටක සඳහා අනුමැතිය | 5,000 | 28,000 |
| 224 ගොඩනැගිලි කුලී ආදායම | 3,120,000 | 3,120,000 |
| පාඨමාලාවන් සඳහා ලැබීම් | 716,900 | 1,151,000 |
| ප්‍රක්ෂේපණ යන්ත්‍ර ලබා දීම | 2,000,000 | - |
| භාණ්ඩාගාර ලැබීම් ආදායමට හඳුනා ගැනීම් | 13,898,558 | 13,805,436 |
| නොගෙවිය යුතු විකුණුම් බදු ආදායමට හඳුනා ගැනීම් | - | 178,119 |
| නොගෙවිය යුතු වැටුප් අත්තිකාරම් ආදායමට හඳුනා ගැනීම | 33,747 | - |
| ණය හිමියන් සඳහා වෙන් කිරීම් | 4,193 | 60,764 |
| හිමිකම් නොපෑවේතන ආදායමට හඳුනා ගැනීම් | 272,679 | 387,231 |
| එකඟතාවයකට පැමිණ නොමැති කරුණු සඳහා ගැලපීම | - | 54,974 |
| | 45,662,551 | 41,264,022 |

**ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව**
**2013 දෙසැම්බර් 31 දිනට**
**මූල්‍ය තත්ත්වය සඳහා සටහන්**

**සටහන : 11 - ස්ථාවර වත්කම්**

| දේපල , යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | පිරිවැය | වර්ෂය තුල එකතු කිරීම් | වර්ෂය තුල ඉවත් කිරීම් | පිරිවැය | සමුච්චිත ක්ෂයවීම් | වර්ෂය සඳහා ක්ෂයවීම් | සමුච්චිත ක්ෂයවීම් | ශුද්ධ අගය |
|---|---|---|---|---|---|---|---|---|
| | 2013.01.01 | | | 2013.12.31 | 2013.01.01 | | | 2013.12.31 |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **ඒ. 01.** සින්නක්කර ඉඩම් | 174,343,458 | - | - | 174,343,458 | - | - | - | 174,343,458 |
| **02.** සින්නක්කර ගොඩනැගිලි | 46,888,914 | - | - | 46,888,914 | 31,632,571 | 2,061,471 | 33,694,042 | 13,194,872 |
| **03.** තාවකාලික ගොඩනැගිලි | 6,080,387 | - | - | 6,080,387 | 6,080,386 | - | 6,080,386 | 1 |
| **04.** සිනමා සංකීර්ණය | 104,927,936 | 572 | - | 104,928,508 | 27,976,932 | 7,124,427 | 35,101,359 | 69,827,149 |
| **05.** මිනි සිනමා උපකරණ | 331,451 | - | - | 331,451 | 331,449 | - | 331,449 | 2 |
| **06.** ලී බඩු , සවි කිරීම් හා වැද්දුම් | 16,153,838 | 38,509 | - | 16,192,347 | 14,599,358 | 239,572 | 14,838,930 | 1,353,417 |
| **07.** කාර්යාලීය උපකරණ | 15,886,541 | 533,108 | 14,900 | 16,404,749 | 12,135,830 | 647,894 | 12,783,724 | 3,621,025 |
| **08.** මෝටර් රථ | 15,612,932 | - | - | 15,612,932 | 11,764,653 | 1,924,135 | 13,688,788 | 1,924,144 |
| **09.** චිත්‍රපට සංරක්ෂණය | 1,610,655 | - | - | 1,610,655 | 673,250 | 97,279 | 770,529 | 840,126 |
| **10.** පාපැදි | 18,281 | - | - | 18,281 | 18,277 | - | 18,277 | 4 |
| **11.** චිත්‍රපට උපකරණ | 910,689 | - | - | 910,689 | 467,150 | 49,280 | 516,430 | 394,259 |
| **12.** ප්‍රක්ෂේපණ උපකරණ | 480,202 | - | - | 480,202 | 377,985 | 34,809 | 412,794 | 67,408 |
| **13.** චිත්‍රාගාර යන්ත්‍ර සූත්‍ර | 88,510,056 | 84,763 | - | 88,594,819 | 51,005,035 | 5,480,872 | 56,485,907 | 32,108,912 |
| **14.** සිනමා අධ්‍යාපන උපකරණ | 1,241,350 | - | - | 1,241,350 | 420,370 | 120,279 | 540,649 | 700,701 |
| **15.** සුහසාධන උපකරන | 194,961 | - | - | 194,961 | 194,960 | - | 194,960 | 1 |
| **16.** ගොඩනැගිලි අළුත්වැඩියාව | 1,233,846 | - | - | 1,233,846 | - | - | 616,923 | 616,923 |
| | 474,425,497 | 656,952 | 14,900 | 475,067,549 | 157,678,206 | 17,780,018 | 176,075,147 | 298,992,402 |
| **බී.** එකතු කළා :- | | | | | | | | |
| නොනිමි ප්‍රාග්ධන කාර්යයන් | | | | | | | | |
| **01.** ප්‍රධාන කාර්යාලය ගොඩනැගිල්ල | 13,398,066 | 54,286,256 | 25,500 | 67,658,822 | - | - | - | 67,658,822 |
| **02.** චිත්‍රාගාරය - ගොඩනැගිල්ල | 10,568,338 | 6,697 | 267,343 | 10,307,692 | - | - | - | 10,307,692 |
| | 23,966,404 | 54,292,953 | 292,843 | 77,966,514 | - | - | - | 77,966,514 |
| එකතුව | 498,391,901 | 54,949,905 | 307,743 | 553,034,063 | 157,678,206 | 17,780,018 | 176,075,147 | 376,958,916 |

**ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව**
**2013 දෙසැම්බර් 31 දිනට**
**මූල්‍ය තත්ත්වය සඳහා සටහන්**

| | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|
| සටහන : 12 | | |
| දිගු කාලීන ආයෝජන | | |
| සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම | 127,000 | 127,000 |
| | 127,000 | 127,000 |
| සටහන : 13 | | |
| කෙටි කාලීන ආයෝජන | | |
| ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ තැන්පතු සේවක | 5,000 | 5,000 |
| ස්ථාවර තැන්පතු | 14,616,424 | 18,538,591 |
| රිපෝ තැන්පතු | 33,700,000 | 16,857,184 |
| භාණ්ඩාගාර බිල්පත් | 76,477,060 | 70,106,122 |
| | 124,798,484 | 105,506,897 |
| සටහන : 14 | | |
| තොග | | |
| චිත්‍රපට | 5,253,886 | 5,253,886 |
| වෙළඳ කටයුතු | 17,596,852 | 10,463,631 |
| චිත්‍රාගාරය | 1,008,209 | 1,024,104 |
| චිත්‍රාගාරය නඩත්තු අමතර කොටස් | 1,472,576 | 1,472,576 |
| ලිපි ද්‍රව්‍යය හා වෙනත් | 1,041,843 | 11,959,556 |
| | 26,373,366 | 30,173,753 |
| සෙමින් අලෙවි වන සහ අලෙවි නොවන තොග සඳහා වෙන් කිරීම් | (13,193,244) | (13,193,244) |
| | 13,180,122 | 16,980,509 |
| සටහන : 15 | | |
| ණයගැතියෝ | | |
| සිනමාහල් | 156,164,056 | 163,211,564 |
| නිෂ්පාදකයෝ | 113,311,542 | 113,502,404 |
| | 269,475,598 | 276,713,968 |
| අඩු කළා :- | | |
| ණයගැතියන් සඳහා හානිකරන ගැලපීම( සටහන 15 ඒ ) | (128,835,649) | (104,174,312) |
| | 140,639,948 | 172,539,656 |
| සටහන : 16 | | |
| විවිධ ණයගැතියෝ | | |
| වෙනත් | 6,849,777 | 4,339,196 |
| විවිධ ණයගැතියෝ සඳහා හානිකරන ගැලපීම( සටහන 15 ඒ ) | (342,489) | (224,800) |
| සේවක අත්තිකාරම් | 20,451,050 | 20,507,382 |
| සේවක ණය පොලී පිරිවැය | 5,429,648 | 6,127,364 |
| (-) සේවක ණය පොලී ආදායම | (5,429,648) | (6,127,364) |
| | 26,958,338 | 24,621,778 |

**ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව**
**2013 දෙසැම්බර් 31 දිනට**
**මූල්‍ය තත්ත්වය සඳහා සටහන්**

**බොල් ණය සඳහා වෙන් කිරීම් උපලේඛනය**

සටහන : 15 ඒ

| ණයගැතියෝ | එකතුව 2013 | එකඟ නොවූ හා අය කර ගත නොහැකි | අය කර ගත හැකි | 5% වෙන් කිරීම් | මුළු වෙන් කිරීම් |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| සිනමාහල් | 156,164,056 | 65,751,734 | 90,412,322 | 4,520,616 | 70,272,350 |
| නිෂ්පාදකයන් | 113,311,542 | 55,681,812 | 57,629,730 | 2,881,487 | 58,563,299 |
| වෙනත් | 6,849,777 | - | 6,849,777 | 342,489 | 342,489 |
| සේවක අත්තිකාරම් | 20,451,050 | - | 20,451,050 | - | - |
| | 296,776,425 | 121,433,546 | 175,342,879 | 7,744,592 | 129,178,138 |

| | එකතුව | සිනමාහල් | නිෂ්පාදන | වෙනත් | සේවක අත්තිකාරම් |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| ශේෂය ඉ / ගෙ | 104,399,112 | 47,490,200 | 56,684,112 | 224,800 | - |
| බොල් ණය කපා හැරීම් | - | - | - | - | - |
| ලාභාලාභ ගිණුමට මාරු කළා | 24,779,026 | 22,782,151 | 1,879,186 | 117,689 | - |
| | 129,178,138 | 70,272,351 | 58,563,298 | 342,489 | - |

ණයගැතියන් සඳහා හානිකරන ගැලපීම්

| | |
|---|---|
| 2013.01.01 දිනට | 104,399,112 |
| ලාභාලාභ ගිණුමට මාරු කළා | 24,779,026 |
| ශේෂය ප / ගෙ 2013.12.31 | 129,178,138 |

# ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
## 2013 දෙසැම්බර් 31 දිනට
## මූල්‍ය තත්ත්වය සඳහා සටහන්

| | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|
| සටහන : 17 | | |
| තැන්පතු හා ඉදිරියට ගෙවීම් | | |
| තැන්පතු | 3,802,115 | 3,902,089 |
| අත්තිකාරම් ගෙවීම් | 7,828,776 | 7,444,395 |
| සුභසාධක සංගමයට අත්තිකාරම් ගෙවීම් | 19,600 | 159,440 |
| | 11,650,491 | 11,505,924 |
| නොලැබිය හැකි ණය සඳහා හානිකරන ගැලපීම | (981,870) | (981,870) |
| | 10,668,621 | 10,524,054 |
| සටහන : 18 | | |
| මුදල් හා බැංකු ශේෂ | | |
| මහජන බැංකුව - ජ. ගි. අ. 004-1-001-1-0208647 | 6,674,448 | 604,614 |
| මහජන බැංකුව - ජ. ගි. අ. 055-1-001-5-0667533 | 988,346 | 354,422 |
| මහජන බැංකුව - ජ. ගි. අ. 004-1-001-6-0208664 | 3,495,581 | 3,296,431 |
| ලංකා බැංකුව - ජ. ගි. අ. 0002323272 | 3,051,588 | 1,798,530 |
| ලංකා බැංකුව - ජ. ගි. අ. 0002323131 | 1,625,803 | 2,203,737 |
| ලංකා බැංකුව - ජ. ගි. අ. 0002323354 | 8,624,429 | 4,503,949 |
| ලංකා බැංකුව - ජ. ගි. අ. 0002323363 | 4,646,051 | 10,749,224 |
| ලංකා බැංකුව - ජ. ගි. අ. 0005002189 | 908,866 | 2,056,866 |
| | 30,015,112 | 25,567,773 |
| අත ඉතිරි මුදල් | | |
| සුළු මුදල් - ප්‍රධාන කාර්යාලය | 50,000 | 15,691 |
| සුළු මුදල් - චිත්‍රාගාරය | 10,014 | 3,565 |
| සුළු මුදල් - චිත්‍රපට ගබඩාව | 34 | 34 |
| | 60,048 | 19,290 |
| එකතුව | 30,075,160 | 25,587,063 |
| සටහන : 19 | | |
| ප්‍රදානයන් | | |
| භාණ්ඩාගාර ප්‍රදානයන් | 418,400,000 | 411,400,000 |
| (-)ක්‍රමක්ෂය | (280,337,010) | (266,438,452) |
| | **138,062,990** | **144,961,548** |

## ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
## 2013 දෙසැම්බර් 31 දිනට
## මූල්‍ය තත්ත්වය සඳහා සටහන්

| | 2013 | 2012 |
|---|---|---|
| | රු. | රු. |
| සටහන : 20 | | |
| ඉදිරියට ගෙනා ශේෂය - 31.01.2013 | 33,885,924 | 38,017,196 |
| වර්ෂය සඳහා වෙන් කිරීම් | 2,725,863 | 2,326,442 |
| මුදල් ගෙවීම් | (4,386,297) | (6,457,715) |
| | 32,225,489 | 33,885,924 |
| (භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය කර ඇත.) | | |
| සටහන : 21 | | |
| තැන්පතු | | |
| එන්.එෆ්.සී. සිනමාශාලා ඇප තැන්පතු | 60,000 | - |
| ආපනශාලා තැන්පතු | 10,000 | 10,000 |
| ආරක්ෂක තැන්පතු - සිනමාශාලා | 2,326,727 | 2,326,727 |
| සේවක | 5,000 | 5,000 |
| චිත්‍රපට ආනයන | - | - |
| සිනමා ව්‍යාපෘතිය | 45,000 | 45,000 |
| | 2,446,727 | 2,386,727 |
| සටහන : 22 | | |
| චිත්‍රපට කුලී ණයහිමියෝ | | |
| චිත්‍රපට කුලී ණයහිමියෝ | 123,977,635 | 103,182,563 |
| (-) ණයහිමියන් සඳහා හානිකරන ගැලපීම | (18,046,795) | (18,042,601) |
| | 105,930,840 | 85,139,962 |

**ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව**

**2013 දෙසැම්බර් 31 දිනට**

**මූල්‍ය තත්ත්වය සඳහා සටහන්**

සටහන : 23

**වෙනත් ණයහිමියෝ**

| | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|
| උපචිත වියදම් | 8,493,415 | 13,203,405 |
| ගෙවිය යුතු එකතු කල අගය මත බදු | 164,359 | 194,265 |
| විගණන ගාස්තු ප්‍රතිපාදන | 900,000 | 800,000 |
| දේශීය ආදායම් කොමසාරිස් (මුද්දර) | 26,630 | 19,655 |
| චිත්‍රපට කලාකරුවන් හා කාර්මික ශිල්පීන්ගේ අරමුදල | 92,228 | 257,298 |
| හිමිකම් නොපෑවේතන | 887,586 | 910,277 |
| සේවක අර්ථසාධක අරමුදල | 613,617 | 28,849 |
| සේවක භාරකාර අරමුදල | 67,076 | (12,665) |
| විවිධ ණයහිමියෝ | 2,453,541 | 1,455,397 |
| (-) නොගෙවිය යුතු වගකීම් සඳහා වෙන් කිරීම් | (644,840) | (644,840) |
| විවිධ ණයගැතියෝ (බැර ශේෂය) | 1,927,407 | 1,603,437 |
| චිත්‍රපට කුලී ණයගැතියෝ | 3,249,734 | 2,704,708 |
| මහා භාණ්ඩාගාරය | 5,000,000 | 5,000,000 |
| ජනාධිපති අරමුදල | - | 500,000 |
| සේවක වන්දි සඳහා | - | - |
| ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදල | 3,547,454 | 3,879,309 |
| රිත්මා මණ්ඩල පාලන ගිණුම | 2,265,568 | 1,333,370 |
| සිනේ තරු පුංචි තාරකා | 31,750 | 31,750 |
| හිඟ සේවක අර්ථසාධක අරමුදල සඳහා වෙන් කිරීම ගිණුම | - | 10,000,000 |
| චිත්‍රපට උත්සව සඳහා වෙන් කිරීම් ගිණුම | 5,000,000 | 5,000,000 |
| 2012 උපයන විට බදු ගෙවීම | 11,677 | 9,136 |
| වැටුප් හා වේතන වෙන් කිරීමේ ගිණුම | 714,182 | 714,182 |
| කන්ට්‍රාස් සිනමාහල බදු කුලී ගෙවීම | - | 84,234 |
| ලැබිය යුතු නිෂ්පාදන ණය පොලී වෙන් කිරීම | 3,132,217 | - |
| | **37,933,601** | **47,071,767** |

**<u>ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව</u>**

**<u>2013 දෙසැම්බර් 31 දිනට</u>**

**<u>මූල්‍ය තත්ත්වය සඳහා සටහන්</u>**

| වෙනත් සේවා | එකතුව 2013 | ප්‍රදර්ශණ | චිත්‍රාගාරය | නිෂ්පාදන | පොදු පරිපාලන වියදම් |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| අධ්‍යක්ෂක ගාස්තු | 336,000 | - | - | - | 336,000 |
| ප්‍රචාරණය | 1,066,959 | 390,960 | - | 623,240 | 52,759 |
| විශේෂ කොමිෂන් ගාස්තු | 604,080 | - | - | - | 604,080 |
| නීති ගාස්තු | 2,054,513 | - | - | - | 2,054,513 |
| සංස්ථා උලෙලයන් | 833,592 | - | - | - | 833,592 |
| විගණන ගාස්තු | 500,000 | - | - | - | 500,000 |
| ආරක්ෂක සේවා | 1,982,335 | - | 850,974 | - | 1,131,362 |
| බැංකු ගාස්තු | 33,473 | - | - | - | 33,473 |
| විවිධ වියදම් | 130,509 | - | - | - | 130,509 |
| සිනමා අධ්‍යාපන | 325,518 | - | - | 325,518 | - |
| පිටස්තර මරණාධාර හා සිනමා ශිල්පීය වියදම් | 568,855 | - | - | 568,855 | - |
| නව සිනමාහලේ වියදම් | 467,882 | - | - | - | 467,882 |
| දැයට කිරුළ වැඩසටහන | 935,972 | - | - | - | 935,972 |
| විනිමය අනුපාත ගැලපීම | 84,224 | - | - | - | 84,224 |
| ප්‍රක්ෂේපන යන්ත්‍ර සඳහා දැරූ වියදම් | 174,649 | 174,649 | - | - | - |
| | 10,098,561 | 565,609 | 850,974 | 1,517,613 | 7,164,366 |

## ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
## 2013 දෙසැම්බර් 31 දිනට
## මූල්‍ය තත්ත්වය සඳහා සටහන්

| | එකතුව 2013 | ප්‍රදර්ශණ | චිත්‍රාගාරය | නිෂ්පාදන | පොදු පරිපාලන වියදම් |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| ප්‍රවාහනය | 270,554 | 110,404 | - | - | 160,150 |
| සම්බන්ධතා | 1,596,048 | 221,898 | 171,649 | 115,288 | 1,087,213 |
| අවශ්‍යතා | | | | | |
| අභ්‍යන්තර පාවිච්චිය | 329,995 | 18,694 | 311,301 | - | - |
| විදේශීය චිත්‍රපට උළෙල | 26,275 | - | - | 26,275 | - |
| සුභසාධක වියදම් | 3,230,615 | 18,275 | 218,580 | 8,833 | 2,984,927 |
| සේවක බඳවා ගැනීම් හා පුහුණුව | 398,428 | - | - | - | 398,428 |
| ජල බිල්පත් | 326,763 | - | - | - | 326,763 |
| | 4,312,076 | 36,969 | 529,881 | 35,108 | 3,710,118 |
| වරිපනම් බදු | 804,239 | - | 162,469 | - | 641,770 |

## ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

## 2013 දෙසැම්බර් 31 දිනට

## මූල්‍ය තත්ත්වය සඳහා සටහන්

(24.1) ආරම්භක මූල්‍ය තත්ත්වය 01.01.2012 දිනට ශේෂ සැසඳුම

| | සටහන | 2012.01.01 දිනට **SLAS** රු. | වර්ගීකරණ වෙනස්වීම් රු. | මැනිය හැකි වෙනස්වීම් රු. | 2012.01.01 දිනට **SLFRS** රු. |
|---|---|---|---|---|---|
| නියෝජනය වන්නේ | | | | | |
| ස්ථාවර වත්කම් | | | | | |
| දේපල , යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | | 343,489,275 | - | - | 343,489,275 |
| දිගු කාලීන ආයෝජන | | 127,000 | - | - | 127,000 |
| | | 343,616,275 | - | - | 343,616,275 |
| ජංගම වත්කම් | | | | | |
| කෙටි කාලීන ආයෝජන | | 97,737,782 | - | - | 97,737,782 |
| තොග | 01 | 19,438,153 | - | (13,193,244) | 6,244,909 |
| ණයගැතියෝ | 02 | 189,727,926 | (25,345,773) | (10,822,312) | 153,559,841 |
| විවිධ ණයගැතියෝ | 03 | - | 25,345,773 | (164,019) | 25,181,754 |
| තැන්පතු හා ඉදිරි ගෙවීම් | 04 | 30,516,261 | - | (997,120) | 29,519,141 |
| මුදල් හා බැංකු ශේෂය | | 15,555,332 | - | - | 15,555,332 |
| | | 352,975,454 | - | (25,176,695) | 327,798,759 |
| මුළු වත්කම් | | 696,591,729 | - | (25,176,695) | 671,415,034 |
| යෙදවූ ප්‍රාග්ධනය | | | | | |
| අනුදත් ප්‍රාග්ධනය | | 10,000,000 | - | - | 10,000,000 |
| සමුච්චිත ලාභය | 05 | (55,272,779) | - | 281,621,597 | 226,348,818 |
| වෙනත් සංචිත | | 123,482,759 | - | - | 123,482,759 |
| ප්‍රදානයන් | 06 | 438,997,297 | - | (287,230,313) | 151,766,984 |
| රජයේ ආධාර මුදල | | 517,207,277 | - | (5,608,716) | 511,598,561 |
| ජංගම නොවන වගකීම් | | | | | |
| පාරිතෝෂික වෙන් කිරීම් | | 38,017,196 | - | - | 38,017,196 |
| | | 38,017,196 | - | - | 38,017,196 |
| අඩු කළා : ජංගම වගකීම් | | | | | |
| තැන්පතු | | 2,386,727 | - | - | 2,386,727 |
| චිත්‍රපට කුලී ණයහිමියෝ | 07 | 75,376,915 | - | (17,981,837) | 57,395,078 |
| වෙනත් ණයහිමියෝ | 08 | 63,603,614 | - | (1,586,142) | 62,017,472 |
| | | 141,367,256 | - | (19,567,979) | 121,799,277 |
| එකතුව | | 696,591,729 | - | (25,176,695) | 671,415,034 |

**ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව**

2013 දෙසැම්බර් 31 දිනට

**මූල්‍ය තත්ත්වය සඳහා සටහන්**

(24.2) ආරම්භක මූල්‍ය තත්ත්වය 31.12.2012 දිනට ශේෂ සැසඳුම

| | සටහන | 2012.12.31 දිනට SLAS රු. | වර්ගීකරණ වෙනස්වීම් රු. | මැනිය හැකි වෙනස්වීම් රු. | 2012.12.31 දිනට SLFRS රු. |
|---|---|---|---|---|---|
| නියෝජනය වන්නේ | | | | | |
| ස්ථාවර වත්කම් | | | | | |
| දේපල , යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | **09** | 340,797,551 | - | (178,500) | 340,619,051 |
| දිගු කාලීන ආයෝජන | | 127,000 | - | - | 127,000 |
| | | 340,924,551 | - | (178,500) | 340,746,051 |
| ජංගම වත්කම් | | | | | |
| කෙටි කාලීන ආයෝජන | | 105,506,897 | - | - | 105,506,897 |
| තොග | **01** | 30,173,753 | - | (13,193,244) | 16,980,509 |
| ණයගැතියෝ | **02** | 208,865,556 | (25,728,387) | (10,822,312) | 172,314,857 |
| විවිධ ණයගැතියෝ | **03** | - | 25,010,597 | (164,019) | 24,846,578 |
| තැන්පතු හා ඉදිරි ගෙවීම් | **04** | 11,521,174 | - | (997,120) | 10,524,054 |
| මුදල් හා බැංකු ශේෂය | | 25,587,063 | - | - | 25,587,063 |
| | | 381,654,443 | (717,790) | (25,176,695) | 355,759,958 |
| මුළු වත්කම් | | 722,578,994 | (717,790) | (25,355,195) | 696,506,009 |
| යෙදවූ ප්‍රාග්ධනය | | | | | |
| අනුදත් ප්‍රාග්ධනය | | 10,000,000 | - | - | 10,000,000 |
| සමුච්චිත ලාභය | **05** | (46,352,299) | - | 295,929,622 | 249,577,323 |
| වෙනත් සංචිත | | 123,482,759 | - | - | 123,482,759 |
| ප්‍රදානයන් | **06** | 445,997,297 | - | (301,035,749) | 144,961,548 |
| | | 533,127,757 | - | (5,106,127) | 528,021,630 |
| ජංගම නොවන වගකීම් | | | | | |
| පාරිතෝෂික වෙන් කිරීම් | | 33,885,923 | - | - | 33,885,923 |
| | | 33,885,923 | - | - | 33,885,923 |
| අඩු කළා : ජංගම වගකීම් | | | | | |
| තැන්පතු | | 2,386,727 | - | - | 2,386,727 |
| චිත්‍රපට කුලී ණයහිමියෝ | **07** | 103,182,563 | - | (18,042,601) | 85,139,962 |
| වෙනත් ණයහිමියෝ | **08** | 49,996,024 | (717,790) | (2,206,467) | 47,071,767 |
| | | 155,565,314 | (717,790) | (20,249,068) | 134,598,456 |
| එකතුව | | 722,578,994 | (717,790) | (25,355,195) | 696,506,009 |

**ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව**
**2013.12.31 දිනට අවසන් වර්ෂයේ**
**විස්තීරණ ආදායම් ප්‍රකාශනය**

(24.3) 2012.12.31 දිනට අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය

| | සටහන | SLAS 2012 රු. | මැනිය හැකි වෙනස්වීම් රු. | SLFRS 2012 රු. |
|---|---|---|---|---|
| විකුණුම් | | 46,432,012 | - | 46,432,012 |
| අඩු කළා : විකුණුම් පිරිවැය | | 3,261,147 | - | 3,261,147 |
| දළ ලාභය | | 43,170,865 | - | 43,170,865 |
| අඩු කළා : වියදම් | | | | |
| සේවක පාරිශ්‍රමික | | 64,031,817 | - | 64,031,817 |
| ගමන් හා යැපීම් දීමනා | | 710,466 | - | 710,466 |
| සැපයුම් හා උපකරණ | | 6,991,428 | - | 6,991,428 |
| අළුත්වැඩියා කිරීම් නඩත්තු හා ක්ෂයවීම් | | | | |
| (ඒ) අළුත්වැඩියා කිරීම් හා නඩත්තු ක්ෂයවීම් | | 25,040,572 | - | 25,040,572 |
| ප්‍රවාහන , සම්බන්ධතා , අවශ්‍යතා හා වෙනත් සේවා | 09 | 15,048,327 | 178,500 | 15,226,827 |
| බොල් ණය සඳහා වෙන් කිරීම් | | 20,310,000 | - | 20,310,000 |
| පාරිතෝෂික වෙන් කිරීම් | | 2,326,443 | - | 2,326,443 |
| චිත්‍රපට කලාකරුවන් හා කාර්මික ශිල්පීන්ගේ | | 200,000 | - | 200,000 |
| අරමුදල් සඳහා වෙන් කිරීම් | | | | - |
| තොග හානි | | 85,120 | - | 85,120 |
| | | 134,744,173 | 178,500 | 134,922,673 |
| පොදු පරිපාලන වියදම් අන්තර්ග්‍රහණය කිරීම් | | - | | - |
| | | 134,744,173 | 178,500 | 134,922,673 |
| මෙහෙයුම් ලාභය / අලාභය | | (91,573,308) | (178,500) | (91,751,808) |
| එකතු කළා : වෙනත් ආදායම් | සටහන(10) | 26,777,498 | 14,486,525 | 41,264,023 |
| වර්ෂයේ ලාභය / අලාභය | | (64,795,810) | 14,308,025 | (50,487,785) |
| අඩු කළා : භාණ්ඩාගාරයෙන් ලැබුණු මුදල් | | 68,308,000 | - | 68,308,000 |
| | | 3,512,190 | 14,308,025 | 17,820,215 |
| අඩු කළා : බදු සඳහා වෙන් කිරීම් | | - | - | - |
| | | **3,512,190** | **14,308,025** | **17,820,215** |

**ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව**
**2013 දෙසැම්බර් 31 දිනට**
**සටහන්**

**සටහන අංක. 01**

| | |
|---|---|
| සෙමින් භාවිතාවෙන සහ භාවිතා නොවන තොග සඳහා වෙන් කිරීම. | රු. |
| 2012.01.01 දිනට | 13,193,244 |

**සටහන අංක. 02**

2.1 වර්ගීකරණ වෙනස්වීම්

විවිධ ණයගැතියෝ , වෙලඳ ණයගැතියන්ගෙන් වෙන් කොට හඳුනා ගැනීම.

| | |
|---|---|
| 2012.01.01 දිනට | 25,345,773 |
| 2012.12.31 දිනට | 25,728,387 |

2.1 ගණනය කල හැකි වෙනස්වීම්

| | |
|---|---|
| 2012.01.01 දිනට නොලැබිය හැකි ණය සඳහා හානිකරන ගැලපීම | 10,817,252 |
| | 10,817,252 |
| 2012.01.01 දිනට කපා හැරීමට අනුමැතිය ලත් ණයගැතියන් පොත් වලින් ඉවත් කිරීම | |
| නිෂ්පාදන ණයගැතියෝ | 10,724 |
| ඉංග්‍රිසි චිත්‍රපට සඳහා ලැබිය යුතු | (5,664) |
| | 10,822,312 |

**සටහන අංක. 03**

2012.01.01 දිනට

අය කර ගත නොහැකි වෙනත් ණයගැතියන් පොත් වලින් ඉවත් කිරීම.

| | |
|---|---|
| ජාතික ආධුනිකත්ව මණ්ඩලය | 6,038 |
| උපයන විට බදු | 1,654 |
| කන්ට්‍රාස් සේවක ණය පාලන ගිණුම | 148,927 |
| කන්ට්‍රාස් සේවක ණය ගිණුම | 7,400 |
| | 164,019 |

2012.12.31 දිනට

වර්ගීකරණ වෙනස්වීම්

| | |
|---|---|
| සේවක අර්ථසාධක අරමුදල | 631,655 |
| සේවක භාරකාර අරමුදල | 86,135 |
| | 717,790 |

**ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව**
**2013 දෙසැම්බර් 31 දිනට**
**සටහන්**

**සටහන අංක. 04**

2012.01.01 දිනට

අය කර ගත නොහැකි තැන්පතු සහ ඉදිරි ගෙවීම් කපා හැරීම

| | |
|---|---|
| ඉදිරි ගෙවීම් | 13,250 |
| අවමංගල්‍ය ප්‍රවාහන වියදම් | 2,000 |
| අය කර ගත නොහැකි තැන්පතු සහ ඉදිරි ගෙවීම් සඳහා හානිකරන ගැලපීම | |
| අත්තිකාරම් වෙන් කිරීම් | 328,142 |
| ආපසු ලැබිය යුතු තැන්පතු | 653,728 |
| | 997,120 |

**සටහන අංක. 05**

**සමුච්චිත ආදායම් සැසඳුම් ප්‍රකාශය**

| | |
|---|---|
| සෙමින් භාවිතාවෙන සහ භාවිතා නොවන තොග සඳහා වෙන් කිරීම. | (13,193,244) |
| නොලැබිය හැකි ණය සඳහා හානිකරන ගැලපීම | (10,817,252) |
| අය කර ගත නොහැකි වෙනත් ණයගැතියන් පොත් වලින් ඉවත් කිරීම. | (164,019) |
| අය කර ගත නොහැකි තැන්පතු සහ ඉදිරි ගෙවීම් කපා හැරීම /හානිකරන ගැලපීම | (997,120) |
| ණයහිමියන් සඳහා හානිකරන ගැලපීම | 17,981,837 |
| වෙනත් ණයහිමියන් සඳහා කපා හැරීම / හානිකරන ගැලපීම | 1,586,142 |
| භාණ්ඩාගාර ප්‍රදානයන් නිසි පරිදි ආදායමට හඳුනා ගැනීම | 287,230,313 |
| අනුමැතිය ලත් ණයගැතියන් පොත් වලින් ඉවත් කිරීම | |
| නිෂ්පාදන ණයගැතියෝ | (10,724) |
| ඉංග්‍රිසි චිත්‍රපට සඳහා ලැබිය යුතු | 5,664 |
| 2012.01.01 දිනට මුළු වෙනස්වීම් වල එකතුව | 281,621,597 |
| වෙනත් ණයහිමියන් සඳහා කපා හැරීම | 387,233 |
| අවසර ලත් පිරිවැටුම් බදු කපා හැරීම් | 178,117 |
| භාණ්ඩාගාර ප්‍රදානයන් නිසි පරිදි ආදායමට හඳුනා ගැනීම | 13,805,436 |
| කඩා ඉවත් කල දැනට භාවිතයේ නොපවතින ගොඩනැගිලි වල ශුද්ධ අගය පොත් වලින් ඉවත් කිරීම | (178,500) |
| ණයහිමියන් සඳහා හානිකරන ගැලපීම | 60,765 |
| එකඟතාවයකට පැමිණ නොමැති කරුණු සඳහා ගැලපීම | 54,974 |
| 2012.12.31 දිනට මුළු වෙනස්වීම් වල එකතුව | 295,929,622 |

**සටහන අංක. 06**

භාණ්ඩාගාර ප්‍රදානයන් නිසි පරිදි ආදායමට හඳුනා ගැනීම

| | |
|---|---|
| 2012.01.01 දිනට | 287,230,313 |
| 2012.12.31 දිනට | 13,805,436 |
| | 301,035,749 |

**සටහන අංක. 07**

ණයහිමියන් සඳහා හානිකරන ගැලපීම

| | |
|---|---|
| 2012.01.01 දිනට | 17,981,837 |
| 2012.12.31 දිනට | 60,765 |
| | 18,042,602 |

**ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව**

**2013 දෙසැම්බර් 31 දිනට**

**මූල්‍ය තත්ත්වය සඳහා සටහන්**

**සටහන අංක. 08**

වෙනත් ණයහිමියන් සඳහා හානිකරන ගැලපීම

| | |
|---|---|
| 2012.01.01 දිනට | 644,839 |
| වෙනත් ණයහිමියන් සඳහා කපා හැරීම් | |
| 2012.01.01 දිනට | 941,303 |
| | 1,586,142 |
| වෙනත් ණයහිමියන් සඳහා කපා හැරීම් | |
| 2012.12.31 දිනට | |
| හිමිකම් නොපැවේතන | 387,233 |
| පිරිවැටුම් බදු | 178,118 |
| එකඟතාවයකට පැමිණ නොමැති කරුණු සඳහා | 54,974 |
| | 2,206,467 |

**2012.12.31 දිනට**

වර්ගීකරණ වෙනස්වීම්

| | |
|---|---|
| සේවක අර්ථසාධක අරමුදල | 631,655 |
| සේවක භාරකාර අරමුදල | 86,135 |
| | 717,790 |

**2012.12.31 දිනට**

**සටහන අංක. 09**

කඩා ඉවත් කල දැනට භාවිතයේ නොපවතින ගොඩනැගිලි වල ශුද්ධ අගය පොත් වලින් ඉවත් කිරීම

| | |
|---|---|
| පිරිවැය | 435,611 |
| සමුච්චිත ක්ෂය | (257,111) |
| | 178,500 |

**ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව**
**2013 දෙසැම්බර් 31 දිනට**
**මූල්‍ය තත්ත්වය සඳහා සටහන්**

**සටහන : 26**
**අධ්‍යක්ෂක මණ්ඩල සබදතා**

ආයතනයේ මූල්‍ය හා මෙහෙයුම් තීරණ වලට බලපෑම් සිදු කළ හැකි කිසිදු ගණුදෙනුවක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදු කර නොමැත. අධ්‍යක්ෂ මණ්ඩලය පිළිබඳ සවිස්තරාත්මක විස්තරයක් පහත දක්වා ඇත.

| අංකය | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ නම | පත් කල දිනය | දරන තනතුර හා සේවා ස්ථානය / ලිපිනය | ලිපිනය | සම්බන්ධිත පාර්ශවයන්ගේ ගණුදෙනුවේ ස්වභාවය |
|---|---|---|---|---|---|
| 1 | නීතිඥ අශෝක සේරසිංහ මහතා | 2011.12.20 | අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති සභාපති - ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව | සභාපති , ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව. කොළඹ 07. | - |
| 2 | නීතිඥ ඩී. කරුණාරත්න මහතා | 2010.07.29 නැවත පත් කිරීම 2013.07.18 | අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජික ක්‍රියාකාරී අධ්‍යක්ෂ - ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව | ක්‍රියාකාරී අධ්‍යක්ෂක , ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව. කොළඹ 07. | - |
| 3 | මහාචාර්ය ආරියරත්න ඇතුගල | 2010 අගෝස්තු | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික ( නිල බලයෙන් ) අධ්‍යක්ෂ - රජයේ ප්‍රවෘත්ති දෙපා. | අධ්‍යක්ෂ , රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, කොළඹ 05. | - |
| 4 | නීතිඥ සමන්ත වැලිවේරිය මහතා | 2010 අගෝස්තු | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික ( නිල බලයෙන් ) අධ්‍යක්ෂ - ගුවන් විදුලි සංස්ථාව | අධ්‍යක්ෂ ජනරාල් , ගුවන් විදුලි සංස්ථාව , කොළඹ 07. | - |
| 5 | ඩබ්. එම්. විජිත කණුගල මහතා | 2011 පෙබරවාරි | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික ( නිල බලයෙන් ) අධ්‍යක්ෂ - සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | අධ්‍යක්ෂ , සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, 08 වෙනි මහල , සෙත්සිරිපාය , කොළඹ 03. | - |
| 6 | මහාචාර්ය රෝලන්ඩ් අබේපාල | 2010.07.29 නැවත පත් කිරීම 2013.07.18 | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික ( විශ්ව විද්‍යාල නියෝජනය ) අංශාධිපති - අධ්‍යයන මනෝ විද්‍යා අංශය , කොළඹ විශ්ව විද්‍යාලය | මනෝ විද්‍යා අංශය , කොළඹ විශ්ව විද්‍යාලය , කොළඹ 03. | - |

**ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව**
**2013 දෙසැම්බර් 31 දිනට**
**මූල්‍ය තත්ත්වය සඳහා සටහන්**

| අංකය | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ නම | පත් කල දිනය | දරන තනතුර හා සේවා ස්ථානය / ලිපිනය | ලිපිනය | සම්බන්ධිත පාර්ශවයන්ගේ ගණුදෙනුවේ ස්වභාවය |
|---|---|---|---|---|---|
| 7 | ආචාර්ය ප්‍රනීත් අබේසුන්දර | 2010.07.29 නැවත පත් කිරීම 2013.07.18 | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික ( විශ්ව විද්‍යාල නියෝජනය ) අංශාධිපති - සමාජ විද්‍යා හා මානව විද්‍යා අංශය , ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය | සමාජ විද්‍යා මානව විද්‍යා අධ්‍යයන අංශය , ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය , ගංගොඩවිල , නුගේගොඩ. | - |
| 8 | ආචාර්ය ඩී. වෙන්කටේෂ්වරන් | 2011.04.06 | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික ( ද්‍රවිඩ නියෝජනය ) | නො.307, ජෝර්ජ් ආර්.ඩී.සිල්වා මාවත, කොළඹ 13. | - |
| 9 | රේණුකා බාලසූරිය මහත්මිය | 2011.09.21 | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික ( සිනමා කර්මාන්තය නියෝජනය ) | නො. 1330/2 , 10 වන පටුමඟ , බෝගහවත්ත පාර , පන්නිපිටිය. | - |
| 10 | මාලනී ගමගේ මහත්මිය | 2011.02.24 | භාණ්ඩාගාර නියෝජිත අධ්‍යක්ෂ ජනරාල් - ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව ( විශ්‍රාම යන ලදී. ) | අධ්‍යක්ෂ ජනරාල් , ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව , මුදල් අමාත්‍යාංශය , කොළඹ 01. | - |
| 11 | ජේ. සී. වැලිගමගේ මහත්මිය | 2013.11.25 | භාණ්ඩාගාර නියෝජිත අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් , රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව , මහා භාණ්ඩාගාරය , කොළඹ 01. | - |

**සටහන : 27**
**අසම්භාව්‍ය වගකීම්**

2013.12.31 දිනට සංස්ථාවේ මූල්‍ය හා මෙහෙයුම් තත්ත්වයට බලපෑ හැකි කිසිදු අසම්භාව්‍ය තත්ත්වයක් වාර්තා වී නොමැත.

**සටහන : 28**
**ශේෂ පත්‍ර දිනට පසු ගැලපුම්**

මූල්‍ය ප්‍රකාශ දිනට පසු මූල්‍ය හා මෙහෙයුම් තත්ත්වයට සිදු කල යුතු කිසිදු ගැලපුමක් වාර්තා වී නොමැත.

නි/සා/මුදල් අංශය

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } විඑම්1/ඊ/එන්එෆ්සී/1/13/56 | ඔබේ අංකය / உமது இல. / Your No. } | දිනය / திகதி / Date } 2015 ජූනි 22 දින

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
29 OCT 2015
පාලන හා මානව සම්පත් අංශය

සභාපති,

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව.

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2 )(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

---

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1971 අංක 47 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනතේ 31(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සංස්ථාවේ සභාපති වෙත 2015 මාර්තු 24 දින නිකුත් කරන ලදී.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම

-----------------------

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට ( ISSAI 1000 – 1810 ) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

1.4 මතය ව්‍යාවනය සඳහා පදනම

---------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ හා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාළව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

2. මූල්‍ය ප්‍රකාශන

----------------

2.1 මතය ව්‍යාවනය

-----------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය.ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

-------------------------------

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ට අනුව, රාජ්‍ය ප්‍රදානයන් වශයෙන් ලැබුණු රු.138,062,990 ක් ජංගම නොවන වගකීම් යටතේ දක්වනවා වෙනුවට යෙදවූ ප්‍රාග්ධනය යටතේ දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 ට අනුව සම්පූර්ණයෙන් ක්ෂය කළ එහෙත් දැනට මෙහෙයුම් කටයුතු සඳහා භාවිතා කරන වත්කම් පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශනයන්හි ගිණුම් සටහන් මගින් හෙළිදරව් කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 17 ට අනුව මෙහෙයුම් කල්බදු ගිණුම් තැබීමේදී කල්බදු ගෙවන්නා පිළිබඳව හෙළිදරව් කළ යුතු අවම තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගිණුම්කරණ පද්ධතිය තුළ දක්නට ලැබෙන පහත දුර්වලතා හේතුවෙන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල නිරවද්‍යතාවය හා තුල්‍යතාවය විගණනයේදී තහවුරුකර ගැනීම ප්‍රශ්නකාරී විය.

(i) ලෙජර ගිණුම්වල දැක්වෙන ශේෂයන් හා මූල්‍ය ප්‍රකාශනවල ශේෂයන් අතර වෙනස්කම් පැවතීම.

| විස්තරය | ලෙජරය අනුව | මූල්‍ය ප්‍රකාශන අනුව | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| විවිධ ණයහිමියෝ | 875,285 | 2,453,542 | 1,578,257 |
| චිත්‍රපට කුළී ණයහිමියෝ | 114,615,930 | 123,977,635 | 9,361,705 |
| චිත්‍රපට කුළී ණයගැතියෝ | 224,918,877 | 156,164,056 | 68,754,821 |
| නිෂ්පාදන ණයගැතියෝ | 106,643,677 | 113,311,542 | 6,667,865 |
| | | | 86,362,648 |

(ii) සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනවල වෙනත් ණයගැතියන් දැක්වීමේදී ණයගැති ශේෂයට අතිරේකව විවිධ ණයහිමි උපලේඛනයෙහි හර ශේෂයන්ගේ එකතුවද ඇතුළත් කර තිබුණි. එම හර ශේෂවල වටිනාකම රු.702,971 ක් වුවද ඒ වෙනුවට රු.1,578,256 ක් ඇතුලත් කර තිබුණි.

(iii) ලෙජර ගිණුම් අනුව විවිධ ණයහිමි පාලන ගිණුම් බැර ශේෂය රු. 875,286 ක් වූ අතර, උපලේඛන ශුද්ධ ශේෂයද එයට අනුකූල විය. එහෙත් එම උපලේඛන බැර ශේෂය වූ රු. 1,578,256 නැවත ලෙජර ශේෂයට එකතු කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර තිබුණි.

(iv) සංස්ථාව නමින් පෞද්ගලික බැංකුවක පවත්වාගෙන යනු ලබන රු.100,949 ක් වූ ජංගම ගිණුම මූල්‍ය ප්‍රකාශ තුළ හෙළිදරව් කර නොතිබුණි.

(v) 2012 දෙසැම්බර් 31 දිනට රිත්මා මණ්ඩල ශේෂ පිරික්සුම අනුව ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා ගිණුමේ අවසන් ශේෂය රු. 110,785,369 ක් වුවද 2013 ආරම්භක ශේෂ ලෙස රු. 145,723,112 ක් ඉදිරියට ගෙනවිත් තිබුණි.

(ආ) අනතුරට භාජනය වීම නිසා ගර්හිත තත්ත්වයට පත්ව තිබුණු පිරිවැය රු. 7,696,541 ක වාහනය සම්බන්ධව ලෙජර් ගිණුම්වල ගැලපීම් සිදුකර නොතිබුණි. මෙම වාහනය මිලදී ගැනීමේදී රු.1,638,000 ක කල්බදු පහසුකම් ලබාගෙන තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු කල්බදු වාරික වටිනාකම රු. 890,862 ක් වූ අතර මෙම වටිනාකම කල්බදු ණයහිමියන් ලෙස වෙනම නොදක්වා උපචිත වියදම් ලෙස දක්වා තිබුණි.

(ඇ) 2011 වර්ෂයේදී කඩා ඉවත්කර තිබූ පිරිවැය රු. 6,080,387 ක් තාවකාලික ගොඩනැගිල්ලක වටිනාකම හා අදාළ ක්ෂය ප්‍රමාණයන් ගිණුම්වලින් හා ලේඛනවලින් ඉවත්කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) නිවේදන තැන්පතු වෙනුවෙන් ලැබී තිබුණු රු. 2,879,113 ක වූ පොළිය ආදායමක් ලෙස හඳුනාගෙන නැවතත් ආයෝජනය කර තිබූ නමුත් එය ආයෝජන ගිණුමට හර කරනු වෙනුවට ලැබිය යුතු මුදලක් ලෙස දක්වා තිබුණි.

(ඉ) උපලබ්ධි නොවූ නිෂ්පාදන ණයපොළී රු.4,007,480 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් තුළ ඇතුළත් කර තිබුණි.

(ඊ) ඉකුත් වර්ෂය සඳහා වූ ගැලපීම් රු.12,124,686 ක් අතීතානුයෝගීව මූල්‍ය ප්‍රකාශවල ගැලපීම් කිරීම වෙනුවට සමාලෝචිත වර්ෂය අවසානයේ ඉදිරියට ගෙන එන ලද සමුච්චිත ලාභයට ගලපා තිබුණි.

2.2.3 නොසැසඳූ පාලන ගිණුම්

ලෙජරයට අනුව කාර්ය මණ්ඩල ණය, පාරිතෝෂික වියදම, සිනමාහල් ණයගැතියෝ , නිෂ්පාදන ණයගැතියන් සහ එකහ නොවූ හා අයකරගත නොහැකි බොල්ණය යන ගිණුම්වල ශේෂ හා විගණනයට ඉදිරිපත් කළ උපලේඛන අතර රු. 6,967,159 ක වෙනසක් නිරීක්ෂණය විය.

2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා ගිණුම අන්තර් දෙපාර්තමේන්තු ගනුදෙනු සටහන් කරනු ලබන ජංගම ගිණුමක් වූ අතර, අවසන් ශේෂය රු. 4,074,740 ක් (හර) වශයෙන් දක්වා තිබුණි. නමුත් ඊට සමාන්තරව පවත්වාගෙන යනු ලබන චිත්‍රපට බෙදාහැරීමේ මණ්ඩල ගිණුමට අදාළ ශේෂ ගැලපූ පසු තවදුරටත් පැවති ශේෂය රු. 2,265,568 ක් විය. මෙකී ජංගම ශේෂයන් නිවැරදිව හඳුනා ගෙන සැසඳීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) 2013 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාවන් අනුව ප්‍රධාන කාර්යාලයේ සහ සරසවි චිත්‍රාගාරයේ අවසන් තොග වටිනාකම රු.9,033,299 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු තොග වටිනාකම රු.10,527,223 ක් වූයෙන් රු. 1,493,924 ක වෙනසක් නිරීක්ෂණය විය.

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නිෂ්පාදන ණයගැතියෝ:

(i) නිෂ්පාදන ණයගැතියන් මුළු වටිනාකම රු. 108,581,808 ක් වූ අතර වර්ෂ තුන ඉක්මවූ ණයගැතියන් ප්‍රමාණය රු. 69,432,725 ක් හෙවත් සියයට 64 ක් විය. වර්ෂ තුන ඉක්ම වූ ශේෂ තුළ වර්ෂ 5 ඉක්ම වූ ණයගැතියන් ප්‍රමාණය රු.52,361,734 ක් හෙවත් සියයට 48 ක් විය. මෙම මුදල් අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් පියවර ගත් බවට තොරතුරු විගණනය වෙත ඉදිරිපත් නොවිණි.

(ii) නිෂ්පාදන ණයගැති පාලන ගිණුම අනුව නිෂ්පාදන ණයගැති ගිණුමේ ශේෂය රු.106,643,677 ක් වූ අතර එම අගයට චිත්‍රපට කුළී ණයහිමි උපලේඛනයේ රු.9,361,705 ක් වූ හර ශේෂය හා විවිධ ණයගැති උපලේඛනයේ රු. 1,927,407 ක් වූ බැර ශේෂය එකතු කර තිබුණි. මෙයින් නිෂ්පාදන ණය පොළී වෙන්කිරීමේ ගිණුමේ ශේෂය වූ රු. 4,618,806 පදනමකින් තොරව නිෂ්පාදන ණයගැතියන්ගෙන් අඩුකර ශුද්ධ ණයගැති වටිනාකම රු.113,311,542 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. මේ අනුව, මෙකී ණයගැති ශේෂය පිළිබඳව විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය.

(ආ) සිනමාහල් ණයගැතියෝ :

(i) 2001 වර්ෂයේ සිනමා ශාලාවල චිත්‍රපට බෙදාහැරීම් කටයුතු පෞද්ගලික මණ්ඩලවලට පැවරීමට පෙර සහ පසුව පැවති එහෙත් දැනට වසා දමා ඇති සිනමා ශාලා 254 කින් සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට අයවිය යුතු හිඟ මුදල් රු.66,215,410 ක් විය. එසේම වෙනත් මණ්ඩලවලට අයත්ව තිබී වසා දැමූ සිනමාශාලා 36 කින් රිද්මා මණ්ඩලයට අයවියයුතු මුදල රු. 172,150 ක් විය.

(ii) දැනට ක්‍රියාත්මක වන මණ්ඩල වලට අයත් සිනමාශාලා 151 කින් අයවිය යුතු හිඟ මුදල් ප්‍රමාණය රු. 149,548,660 ක් විය.එසේම සමාලෝචිත වර්ෂය අවසානයට සිනමා ශාලා 69 කින් රිද්මා මණ්ඩලයට අයවියයුතු හිඟ මුදල් ප්‍රමාණය රු. 11,030,269 ක් විය. සමාලෝචිත වර්ෂයේදී අයවිය යුතු මුදල් අයකර ගැනීමට ඵලදායී පියවර ගෙන නොතිබුණි.

(ඇ) ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට සිනමාහල්, නිෂ්පාදන, වෙනත් ණය සහ සේවක අත්තිකාරම් වශයෙන් මුළු ණය එකතුව රු.296,776,425 ක් අයකර ගැනීමට තිබුණි. මෙම ණයගැතියන්ගෙන් රු.121,433,546 ක් වූ එකඟ නොවූ හා අයකර ගත නොහැකි ණය ශේෂය සඳහා සියයට 100 ක බොල්ණය ප්‍රතිපාදනය ක්ද ඉතිරි ණයගැතියන් සඳහා සියයට 5 ක බොල්ණය ප්‍රතිපාදනයක්ද සිදුකර තිබුණි. කෙසේ වුවද ඉහත ණයගැතියන්ගෙන් රු.129,178,138 ක් හෙවත් සියයට 44 ක් ආපසු අයකර ගැනීම අවිනිශ්චිත බව නිරීක්ෂණය විය.

(ඈ) සමාලෝචිත වර්ෂය ආරම්භයේදී ගොඩනැගිලි කුළී, ජල හා විදුලි බිල්පත් සඳහා ලැබිය යුතු මුදල් ලෙස ගිණුම්වල දක්වා තිබුණු රු. 945,300 ක් 2013 වර්ෂය තුළදීද ලැබී නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු තැන්පතු රු. 926,228 ක් වූ අතර එයින් රු. 653,728 ක් හෙවත් සියයට 71 ක් අදාළ ආයතනයන්ගෙන් අයකර ගැනීමට කටයුතු නොකර ආපසු අයකර ගත නොහැකිය යන පදනමින් රඳවාගත් ලාභයෙන් අඩුකර දක්වා තිබුණි.

(ඊ) විශ්‍රාම ගිය, සේවයෙන් ඉවත් කළ හා සේවය හැරගිය නිලධාරීන් 06 කට සේවක අත්තිකාරම් වශයෙන් ලබාදී ඇති රු.730,352 ක් වූ ආපදා ණය මුදල් හා රු. 62,370 ක් වූ පොළී මුදල් වසර 1 සිට 10 දක්වා වූ කාලයක් තුළ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර 2013 වර්ෂයේදී මෙම නිලධාරීන්ගෙන් කිසිදු මුදලක් අයවී නොතිබුණි.

(උ) 1997 වර්ෂයේදී ස්වෙච්ඡාවෙන් සේවයෙන් ඉවත්වූ සේවකයින්ට වන්දි ගෙවීම සඳහා භාණ්ඩාගාරයෙන් ලබාදී තිබුණු මුදලෙන් රු.5,000,000 ක ඉතිරිය සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම නැවත භාණ්ඩාගාරයට යවා නොතිබුණි.

2.2. 5 විගණනය සඳහා සාක්ෂි නොවීම
----------------------------------

පහත සඳහන් එක් එක් විෂයය ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

| | ගිණුමේ විස්තරය | වටිනාකම රු. | නොසැපයූ ලිඛිත සාක්ෂි |
|---|---|---|---|
| (අ) | නිෂ්පාදන ණය පොළී වෙන්කිරීම | 4,618,805 | ගණනය කිරීමේ විස්තර |
| (ආ) | තැන්පතු හා ඉදිරියට කළ ගෙවීම් | 3,802,115 | ලදුපත් |
| (ඇ) | ණයගැතියෝ - සිනමාහල් | 156,164,056 | ශේෂ සනාථ කිරීම් |
| (ඈ) | ණයගැතියෝ - නිෂ්පාදකයෝ | 113,311,542 | - එම - |
| (ඉ) | වෙනත් ණයහිමියෝ | 37,933,601 | කාලවිශ්ලේෂණ |
| (ඊ) | තැන්පතු | 2,446,727 | - එම - |
| (උ) | භාවිතා නොවෙන තොගය | 2,252,818 | විස්තරාත්මක උපලේඛන |
| (ඌ) | අධිභාර වෙන්කිරීම (සිනමාශාලා කුළී සඳහා) | 72,004,555 | විස්තරාත්මක උපලේඛන හා කාල විශ්ලේෂණ |
| (එ) | සිනමාශාලා ශබ්ද උපකරණ තොගය | 10,592,257 | තොග සමීක්ෂණ වාර්තා |
| (ඒ) | චිත්‍රපට තොගය | 5,253,886 | - එම - |
| | | 408,380,362 | |

2.3 නීති , රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති , රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති , රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 1985 අංක 45 දරන පනතින් සංශෝධිත 1971 අංක 47 දරන ජාතික චිත්‍රපට සංස්ථා පනත හා 2011 සැප්තැම්බර් 28 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 30 අනුව අනුමත කාර්ය මණ්ඩලය | ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයකු පත්කිරීම සඳහා ප්‍රතිපාදන හෝ තනතුරක් නොමැති වුවද ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයකු පත්කර රු.45,000 ක මාසික දීමනාවක් , මාසිකව ලීටර 140 ක ඉන්ධන දීමනාවක් හා රියදුරකු සමඟ නිලරථයක් ලබාදී තිබුණු නමුත් අදාළ නිලධාරියා පූර්ණ කාලීනව සංස්ථා කටයුතුවල නිරත නොවූ අතර මෙම නිලධාරියාට රාජකාරි ලැයිස්තුවක්ද ලබාදී නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 110 | හානි පිළිබඳ ලේඛනයක් යාවත්කාලීන ලෙස හා නිසි පරිදි පවත්වා නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 177(I) | දෛනිකව ලැබෙන මුළු මුදල දිනපතාම හෝ හැකිතාක් ඉක්මනින් බැංකුගත කළ යුතු වුවද, එසේ නොකරන ලද අවස්ථා 9 ක් නියැදි විගණන පරීක්ෂණයකදී අනාවරණය විය. |
| (iii) මුදල් රෙගුලාසි 177 (3) | ලැබෙන සම්පූර්ණ මුදලම බැංකුගත කළ යුතු නමුත් නියැදි පරීක්ෂණයට අනුව රු.122,622 ක් බැංකුගත කර නොතිබූ බවත් ලද මුදල් සංස්ථාවේ දෛනික වියදම් කිරීමට යොදවා තිබුණු බවත් නිරීක්ෂණය විය. |

| | |
|---|---|
| (ඈ) 1999 ඔක්තෝබර් 08 දිනැති අංක 22/99 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය 1:3 ඡේදය | ප්‍රවාහන පහසුකම් හිමි නොවන වැටුප් කාණ්ඩයේ නිලධාරිනියකට අනුමැතියකින් තොරව කාර්යාලය හා නිවාසය අතර තනිවම යාම සහ ඒම සඳහා ප්‍රවාහන පහසුකම් සපයා තිබුණි. |
| (ඉ) 2007 මැයි 11 දිනැති අංක 09/2007 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | විශ්‍රාමිකයන් නැවත සේවයේ යෙදවිය යුත්තේ සුදුසු අනුප්‍රාප්තිකයන් සොයා ගැනීමට අපහසු තනතුරුවලට පමණක් වුවද, එම ගණයට අයත් නොවන රියදුරු තනතුරක් සඳහා විශ්‍රාම ලත් නිලධාරියකු යොදා ගෙන තිබූ අතර ඒ සඳහා අදාළ අමාත්‍යාංශ ලේකම්වරයාගේ එකඟතාවය ලබා ගෙන නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු.58,337,827 ක බදු පූර්ව ශුද්ධ අලාභයක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදු පූර්ව ශුද්ධ අලාභය රු.50,487,786 ක් විය. ඉකුත් වර්ෂය හා සැසඳීමේදී ශුද්ධ අලාභය තවදුරටත් රු.7,850,041 කින් වර්ධනය වී තිබූ බව නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා භාණ්ඩාගාරයෙන් පුනරාවර්තන ප්‍රදානයන් වශයෙන් පිළිවෙලින් රු.69,960,000 ක් හා රු.68,308,000 ක් ලැබී තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ ලාභය පිළිවෙලින් රු.11,622,173 ක් හා රු.17,820,214 ක් විය.

3.2 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භකර තිබුණු නීතිමය ක්‍රියාමාර්ග

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1980 පෙබරවාරි 19 දිනැති ප්‍රතිපත්ති සැලසුම් සම්පාදන හා ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය අනුව, රාජ්‍ය ආයතනවල නෛතික වැඩ කටයුතු සඳහා නීතිපතිවරයාගේ සේවය ලබාගතයුතු වුවද, සංස්ථාව විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණු අතර නඩු 15 ක් වෙනුවෙන් බාහිර නීතිඥයින්ට නීතිඥ ගාස්තු වශයෙන් රු. 1,656,000 ක් වියදම් කර තිබුණි. මෙය පෙර වර්ෂය හා සසඳන විට සියයට 843 ක වැඩිවීමක් විය.

(ආ) සංස්ථාව විසින් බාහිර පාර්ශවයන්ට එරෙහිව රු. 23,534,184 ක වන්දි මුදලක් ලබාගැනීම සඳහා නඩු 03 ක් පවරා තිබුණු අතර මූල්‍ය ප්‍රකාශයන්හි ගිණුම් සටහන්හි මේ පිළිබඳ තොරතුරු හෙළිදරව් කර නොතිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

(අ) චිත්‍රපට ණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත් නොකළ චිත්‍රපට 26 ක් නිෂ්පාදනය කිරීම වෙනුවෙන් රු.5,473,150 ක ණය ලබාදී තිබූ අතර වසර 5 ඉක්මවා තිබූ එකී ණය මුදලින් සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට රු. 4,019,261 ක් හෙවත් සියයට 73 ක ණය මුදල් අයවිය යුතුව තිබුණි.

(ii) ප්‍රදර්ශනය සඳහා මුදාහල චිත්‍රපට 48 ක් නිෂ්පාදනය කිරීම වෙනුවෙන් රු.63,460,241 ක ණය ලබාදී තිබූ අතර වසර 5 ඉක්මවා තිබූ එකී ණය මුදලින් රු. 28,333,559 ක් හෙවත් සියයට 45 ක් සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට අයවිය යුතුව තිබුණි.

(iii) ප්‍රදර්ශනය සඳහා මුදාහල චිත්‍රපට 16 ක් නිෂ්පාදනය කිරීම වෙනුවෙන් රු.26,182,836 ක ණය ලබාදී තිබූ අතර වසර 5 කට අඩු එකී ණය මුදලින් රු.11,322,942 ක් හෙවත් සියයට 43 ක් සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට අයවිය යුතුව තිබුණි.

(iv) ප්‍රදර්ශනය සඳහා මුදා නොහළ එහෙත් වැඩ නිමකළ චිත්‍රපට 13 ක් නිෂ්පාදනය සඳහා ණය ලබාදී වසර 5 කට අඩු වූ රු. 17,940,763 ක සම්පූර්ණ ණය මුදලම සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට අයවිය යුතුව තිබුණි.

(v) වැඩ නිම නොකළ චිත්‍රපට 12 ක් නිෂ්පාදනය සඳහා ලබා දී තිබූ වසර 5 කට අඩු රු.5,978,641 ක් වූ මුළු ණය මුදලම සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයවිය යුතුව තිබුණි.

(ආ) සිනමාශාලා සඳහා ණය ලබාදීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ගිවිසුම් අත්සන් කිරීමකින් තොරව 2003 වර්ෂයේදී සිනමා ශාලාවක් සඳහා රු.1,100,000 ක ණය මුදලක් ලබා දී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ගිවිසුම් අත්සන් කිරීමක් සිදුකර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට අයවිය යුතු මුදල රු. 571,738 ක් විය.

(ii) 2013 වර්ෂයට පෙර සිනමාශාලා 09 ක් නවීකරණය සඳහා ලබාදී තිබුණ රු.12,822,682 ක ණය මුදල සමාලෝචිත වර්ෂය අවසානයට පොළී ඇතුළත්ව රු.15,875,103 ක්ව තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී සිනමාශාලා 04 කින් රු.1,992,560 ක් අයකරගෙන තිබුණු නමුත් සිනමා ශාලා 04 කින් කිසිදු මුදලක් අයකරගෙන නොතිබුණි.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නියමිත දිනට සංස්ථාවට ගෙවා නොමැති චිත්‍රපට කුළී හා සංස්ථා භාරය වෙනුවෙන් අයකළ යුතු සියයට 2.5 ක්වූ රු. 3,625,698 ක අධිභාරය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2008 වර්ෂයේදී මිලදී ගත් රු. 81,250 ක් වටිනා වායුසමීකරණ යන්ත්‍රයක අභ්‍යන්තර කොටස් සමාලෝචිත වර්ෂයේදී අස්ථානගත වී තිබූ අතර මේ සම්බන්ධ වගකීම ආරක්ෂක අංශයට පවරා තිබුණි. මේ සම්බන්ධව ගතයුතු නිසි ක්‍රියාමාර්ග නියමිත කාලය තුළ ගෙන නොතිබූ අතර අලාභය ලෙස රු. 15,000 ක් ගෙවීමට එකඟවී තිබුණි. කෙසේ වුවද මෙම අලාභ තක්සේරු කිරීම ඒ පිළිබඳ දැනුමක් ඇති පාර්ශවයක් විසින් ඉටුකර නොමැති බැවින් සංස්ථාවට සිදුවූ අලාභය හඳුනා ගැනීමට කළමනාකරණය කටයුතු කර නොමැති බව තවදුරටත් නිරීක්ෂණය විය.

4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

අක්‍රමිකතා හේතුකොට ගෙන සිනමා ශාලා වලින් අයකර ගතයුතු වූ පෙර වර්ෂවලට අදාළව හරපත් මත පනවන ලද අධිභාර වෙන්ව හඳුනාගත හැකි පරිදි ගිණුම්ගතකර නොතිබුණි. තවද, සංස්ථාවේ පරීක්ෂණ අංශය විසින් අනාවරණය කර ගත් අක්‍රමිතා සඳහා සමාලෝචිත වර්ෂයේදී රු. 394,170 ක් වටිනා හරපත් 101 ක් නිකුත් කර තිබුණද හරපත් 73 කින් අයවිය යුතු රු. 242,510 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේම සමාලෝචිත වර්ෂයට පෙර නිකුත් කරන ලද හරපත්‍ර 43 කින් රු. 399,072 ක් අයකර ගත යුතුව පැවතුණි.

4.4 සෙමින් චලනය වන, නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

සිනමා ශාලා නවීකරණය කිරීම සඳහා ණය පහසුකම් යටතේ 2012 වර්ෂයේදී DTS ශබ්ද, උපකරණ යන්ත්‍ර 5 ක් මිලදීගෙන තිබූ අතර එයින් රු.10,592,257 ක් වටිනා ශබ්ද උපකරණ යන්ත්‍ර 03 ක් සිනමා ශාලා සඳහා ලබාදීමට කටයුතු කර නොතිබූ අතර වසර 2 ක් තිස්සේ නිෂ්ක්‍රියව පැවතුණි.

4.5 ආර්ථික නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දිගුකාලීන ආයෝජන ලෙස මූල්‍ය ප්‍රකාශනවල සඳහන් රු.127,000 ක වටිනාකමකින් යුත් රාජ්‍ය සමාගමක ආයෝජිත මුදල් සඳහා කිසිදු ප්‍රතිලාභයක් ලැබී නොතිබුණි.

(ආ) සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානයට ගොඩනැගිල්ල ලබා දී තිබුණු බදු කාලසීමාව 2013 මාර්තු 01 දිනෙන් අවසන් වී තිබුණද, නව බදු ගිවිසුමකට එළඹීම 2013 සැප්තැම්බර් 12 දින දක්වා ප්‍රමාද කර තිබුණි. තවද සමාලෝචිත වර්ෂයේදී ලබාගත් නව තක්සේරු වාර්තාව අනුව ගොඩනැගිල්ල සඳහා ලබා දී තිබුණු මාසික වරිපනම් තක්සේරුව රු.230,000 ක් වුවද, මාසික කුළිය රු.200,000 කට ගිවිසුමට එළඹ තිබුණි.

(ඇ) ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලය සඳහා මාසික තක්සේරු වටිනාකම රු.100,000 ක් වූ ගොඩනැගිල්ල රු.60,000 ක මාසික කුළියට ලබා දී තිබුණු අතර ගිවිසුමකට එළඹ නොතිබුණි.

(ඇ) චිත්‍රාගාර ගොඩනැගිල්ල සඳහා වරිපනම් බදු ගෙවීම ප්‍රමාදවීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී අධිභාර වශයෙන් රු. 16,246 ක් ගෙවා තිබුණි.

4.6 හඳුනාගන්නා ලද පාඩු

බැංකු සැසඳුම් ප්‍රකාශයේ ඇතුළත් වසර 5 කට වඩා පැරණි රු. 105,446 ක උපලබ්ධි නොවූ තැන්පතු හා රු. 25,063 ක හඳුනා නොගත් හර සටහන් සමාලෝචිත වර්ෂයේදී ලාභාලාභ ගිණුමට කපාහැර තිබුණි.

4.7 ප්‍රමාද වූ ව්‍යාපෘති

2011 වර්ෂයේදී අවසන් කළ යුතු ගිවිසුම්ගත වටිනාකම රු. 13,185,362 ක් වූ ව්‍යාපෘති 03 ක් සමාලෝචිත වර්ෂය වන විටත් අවසන් කර නොතිබූ අතර ප්‍රමාද කාලය අවුරුදු 03 මාස 05 ක් විය.

4.8 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2011 සැප්තැම්බර් 28 දින සංස්ථාවේ අනුමත කාර්ය මණ්ඩලයද, 2012 සැප්තැම්බර් 14 දින බඳවාගැනිමේ පටිපාටියද අනුමත කර තිබුණු නමුත් 2013 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ කාර්ය මණ්ඩලයේ තනතුරු කාණ්ඩ 08 කට අදාළව නිලධාරීන් 55 දෙනෙකුගේ පුරප්පාඩු පැවති අතර එය අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 30 ක් බව නිරීක්ෂණය විය. අනුමත ප්‍රාථමික ශ්‍රේණිය ( ශිල්පීය නොවන) තනතුරු කාණ්ඩයේ සේවකයින් 06 දෙනෙකුගේ අතිරික්තයක් හා අනුමත නොකරන ලද වෙනත් තනතුරුවල සේවකයින් 06 දෙනෙකුගේ අතිරික්තයක් පැවතුණි. කාර්ය මණ්ඩලය තුළ විධායක ශ්‍රේණියේ තනතුරු 11 ක් සහායක සේවාවල තනතුරු 35 ක් සහ ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරු 09 ක් පුරප්පාඩුව පැවතුණි.

(ආ) සංස්ථාවේ ජ්‍යෝෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරු 03 ම වසර 1 සිට වසර 5 ක කාලපරිච්ඡේදයක් තුළ පුරප්පාඩුව පවතින අතර එම තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු නොකර දිගින් දිගටම තනතුරුවල වැඩබැලීම සඳහා පත්කිරීම් සිදුකර තිබුණි.

(ඇ) ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරුවලට අමතරව කළමනාකරණ හා කණිෂ්ඨ කළමනාකරණ මට්ටම්වල තනතුරු 23 ක් අතරින් තනතුරු 08 ක් වසර 2 සිට වසර 29 දක්වා කාලසීමාවක් පුරප්පාඩුව පැවතුණි.

(ඈ) සංස්ථාවේ මෙහෙයුම් කටයුතුවලදී චිත්‍රාගාරය වැදගත් මෙහෙවරක් ඉටු කරනු ලබන අංශයක් වුවද සහකාර සාමාන්‍යාධිකාරි(චිත්‍රාගාර සේවා), රසායනාගාර හා සංරක්ෂණ නිලධාරි, ශබ්ද හා සංස්කරණ නිලධාරි, හා කළමනාකරණ සහකාර - තාක්ෂණ නිලධාරීන් 08 දෙනෙකුද ඇතුලුව නිලධාරීන් 12 ක ඌනතාවක් පැවතුණු අතර එය එම අංශයේ මුළු නිලධාරීන් සංඛ්‍යාවෙන් සියයට 34 ක්ව පැවතුණි.

(ඉ) ඉංජිනේරු කාර්මික සේවා අංශය සඳහා අනුමත තනතුරු සංඛ්‍යාව 9 ක් වුවද, සහකාර සාමාන්‍යාධිකාරි ඉංජිනේරු කාර්මික සේවා තනතුර, කළමනාකරණ සහකාර තාක්ෂණ තනතුරු 02 ක් හා කළමනාකරණ සහකාර තනතුරක් යනාදී වශයෙන් වූ ප්‍රධාන තනතුරු 04 ම පුරප්පාඩුව පැවතුණි.

(ඊ) සාමාන්‍යාධිකාරි කාර්යාලය සඳහා අනුමත තනතුරු 04 න්, ස්ථිර වශයෙන් පත්කිරීම් සිදුකර තිබුණේ කාර්යාල කාර්ය සහයකයකු පමණක් විය.

4.9 වාහන පරිභෝජනය
---------------------

සංස්ථාව සතු වාහන ඇණියෙහි වාහන ගණන 09 ක් වූ අතර එයින් 02 ක් වෙන්කළ වාහන විය. සමාලෝචිත වර්ෂයේදී එම වාහන ධාවනය කළ මුළු දුර ප්‍රමාණය කිලෝ මීටර 112,672 ක්වූ අතර නඩත්තු වියදම රු. 2,487,920 ක් හා ඉන්ධන වියදම රු. 1,716,765 ක් විය. ඒ අනුව කිලෝ මීටරයකට වැය කරන ලද නඩත්තු හා ඉන්ධන වියදම පිළිවෙලින් රු. 22.08 ක් හා රු. 15.24 ක් විය.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සකස් කර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ දින 193 ක ප්‍රමාදයකින් පසුව 2014 සැප්තැම්බර් 12 දිනදීය.

5.2 ක්‍රියාකාරී සැලැස්ම

චිත්‍රාගාර පහසුකම් වැඩිදියුණු කිරීම හා නවීකරණය යටතේ සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 41.5 ක් වන ක්‍රියාකාරකම් 4 ක් සිදුකර අවසන් කිරීමට සැලසුම් කර තිබුණද එකී කාර්යයන් සමාලෝචිත වර්ෂයේදී සිදුකර නොතිබුණි.

5.3 අභ්‍යන්තර විගණනය

සංස්ථාවේ අභ්‍යන්තර විගණන අංශය සඳහා අභ්‍යන්තර විගණක, කළමනාකරණ සහකාර තනතුරු 02 ක් හා කාර්යාල කාර්ය සහයකයකු අනුමත කාර්ය මණ්ඩලය අනුව වෙන්කර ඇතත්, අභ්‍යන්තර විගණන අංශය සඳහා අභ්‍යන්තර විගණක හැර අනෙකුත් සහයක කාර්ය මණ්ඩලයක් වර්ෂය පුරාම අඛණ්ඩව ලබා දී නොතිබුණෙන් අභ්‍යන්තර විගණනයේ අරමුණු සාර්ථකව ඉටුකර ගැනීමට හැකි ඉඩ ප්‍රස්ථා සීමාවී තිබුණි.

5.4 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැය ගත ආදායම් සහ වියදම්, තථ්‍ය ආදායම් සහ වියදම් සමඟ සැසඳීමේදී ආදායම් සහ වියදම් කාණ්ඩ 06 ක් සම්බන්ධයෙන් විචලනය සියයට 50 කට වඩා වැඩි වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා සංස්ථාවේ සභාපතිවරයාට වරින්වර පෙන්වා දෙන ලදී. පහත පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ණය පාලනය

(ආ) ආපසු ගෙවිය යුතු තැන්පතු

(ඇ) ආයෝජන

(ඈ) සුළු මුදල් අත්තිකාරම්

(ඉ) සිනමාශාලා පරීක්ෂණ

(ඊ) ගිණුම්කරණය

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති ( වැඩබලන )

**ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව**
පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

**இலங்கைத் தேசியத் திரைப்படக் கூட்டுத்தாபனம்**
பாராளுமன்ற மறுசீரமைப்பபு மற்றும் வெகுசன ஊடக அமைச்ச

**National Film Corporation of Sri Lanka**
**Ministry of Parliamentary Reforms & Mass Media**

අංක 303, බෞද්ධාලෝක මාවත, කොළඹ 07. | දුරකතන - 0112-584623 / 0112-588773 | විද්‍යුත් තැපෑල-filmcorp@sltnet.lk | වෙබ් අඩවිය -www.nfc.gov.lk
இல.303, பௌத்தாலோக மாவத்தை, கொழும்பு 07. | தொலைபேசி-0112-584623 / 0112-588773 | மின்னஞ்சல் புக்குககுுின்-filmcorp@sltnet.lk | இணையக்குளம்-www.nfc.gov.lk
No.303, Bauddhloka Mawatha, Colombo 07. | Tel - 0112-584623 / 0112-588773 | Email-filmcorp@sltnet.lk | Website-www.nfc.gov.lk